කාර්යසාධන වාර්තාව
2021

ආරක්ෂක අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංක 103

අන්තර්ගතය

		පිටු අංක
ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය		
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ	
1.1	හැඳින්වීම	01
1.2	අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර	02
1.3	අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්	03
1.4	අමාත්‍යාංශයේ සංවිධාන සටහන	04 - 07
1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන	08
1.5.1	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්	09
1.6	විදේශ ආධාර ලබන ව්‍යාපෘති සහ විදේශ ණය යෝජනා ක්‍රම	
	අ. විදේශ ආධාර ලබන ව්‍යාපෘති	10
	ආ. විදේශ ණය යෝජනා ක්‍රම	11
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	
2.1	ප්‍රගතිය	
2.1.1	ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.	12 - 58
2.1.2	ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව, සුබසාධනය, ජීවනෝපාය ඉහළ නැංවීම, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහාය දැක්වීම	58 - 73
2.2	ඉදිරි දැක්ම	74 -77
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	
3.1	ආරක්ෂක අමාත්‍යාංශය	
3.1.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය	78 - 80
3.1.2	මුල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	81
3.1.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය	82 - 83
3.1.4	මුල්‍ය ප්‍රකාශ සටහන් - ආරක්ෂක අමාත්‍යාංශය	84
3.1.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	85
3.1.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	85
3.1.7	මූ.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන - ආරක්ෂක අමාත්‍යාංශය	85
3.1.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය	86 - 87
3.1.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව - ආරක්ෂක අමාත්‍යාංශය	88 - 107
පරිච්ඡේදය 04 -	කාර්යසාධන දර්ශක	
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	108 - 110
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	111 - 138
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	139 - 142
6.2	මානව සම්පත් සංවර්ධනය - ආරක්ෂක අමාත්‍යාංශය	142 - 143
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	144 - 160

ආරක්ෂක ලේකම්තුමාගේ පණිවිඩය.....



'රට හදන සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානම පාර්ශවකරුවෙකු ලෙස ආරක්ෂක අමාත්‍යාංශය සිය කර්තව්‍යය අඛණ්ඩව හා වගකීමෙන් ඉටු කරමින් සිටි. 2021 තවත් අභියෝගාත්මක වසරක් වූ අතර ගෙවී ගිය එම වසර තුළ ද රටක් ලෙස ජාතියක් ලෙස විවිධ බාධාවන් අවහිරතාවන් මැඩගනිමින් ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන හා දෙපාර්තමේන්තු රාජ්‍ය ආරක්ෂාව උපරිම ආකාරයෙන් ළඟා කර ගැනීම සඳහා සපැමිණි මාවතේ 2021 දෙසැම්බර් 31 දින දක්වා සකස් කරන ලද කාර්යසාධන වාර්තාව මෙලෙස ඉදිරිපත් කිරීමට හැකිවීම සතුටට කරුණකි.

දේශයේ ස්වෛරීත්වය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරගැනීමේ අභිලාෂය පෙරදැරිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක, ආරක්ෂක අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය බුද්ධි සේවය, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍යභට බලකාය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය යන ආයතනවල ප්‍රධානීන් හා කාර්යය මණ්ඩල සිය වගකීම ඉටු කිරීම පිණිස නොපිරිහෙලා කටයුතු කිරීම ප්‍රශංසනීය කොට සැලකිය හැකිය.

ජාත්‍යන්තර වශයෙන් පමණක් නොව දේශීය වශයෙන් මුහුණදීමට සිදුවන අභියෝග මැඩගනිමින් ක්‍රියාකිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ සියලුම අංශ කටයුතු කරනු දැකිය හැකිය.විශේෂයෙන්, රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ වගකීම වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක අංශ සුවිශාල වූ කර්තව්‍යයක නිරත වේ. එමෙන්ම රටේ වෙරළ සීමාව ආරක්ෂා කිරීමට සහ නීති විරෝධී භාණ්ඩ ජාවාරම් වළක්වාලීම සඳහාත් නාවික හමුදාව ප්‍රමුඛ සියලුම ආරක්ෂක අංශ කටයුතු සිදු කරයි. එපමණක් නොව ඕනෑම ආපදා අවස්ථාවක දී ත්‍රිවිධ හමුදාව මැදිහත් වනු දැකිය හැකිය. 2021 වසරේ කොළඹ වරායට ආසන්නව ගිනි ගැනීමට ලක් වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව හේතුවෙන් වූ හානිය අවම කර ගැනීමට ත්‍රිවිධ හමුදාව දැක් වූ දායකත්වය ඊට කදිම නිදසුනකි. එපමණක් නොව, ශ්‍රී ලංකා පොලීසිය හා එක්ව මත්ද්‍රව්‍යවලට අනාගත පරපුර මුදවා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ගවල නිරතවීමට ද ආරක්ෂක අංශ කටයුතු කරන ලදී. විශේෂයෙන් බුද්ධි අංශ ශක්තිමත් කිරීම හා එම ආයතන නිසි පරිදි සම්බන්ධීකරණය කිරීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් එල්ලවිය හැකි ඕනෑම තර්ජනයකකට මුහුණදීමට හැකි වනු පිණිස රාජ්‍ය ආරක්ෂාව තහවුරු කරගැනීමටත් අන්තවාදය හිස එසවීම වැළැක්වීමටත් හැකියාව ලැබී ඇත.

මින් ද ඔබ්බට ගොස්, රට මුහුණ දී ඇති ආර්ථික අර්බුද අභියස ජාතික ආරක්ෂාව ද බිඳ වැටීමකට ඉඩ නොතැබීමටත් රජය,කෘෂිකාර්මික, භාණ්ඩ හා සේවා නිෂ්පාදන ප්‍රජාව සහ පොදුවේ ශ්‍රී ලාංකික ජනතාව ආර්ථිකමය වශයෙන් නැගී සිටීමට දරණ ප්‍රයත්නයේ දී අවශ්‍ය පූර්ණ සහයෝගය ලබාදීමටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ආරක්ෂක අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදාව ප්‍රමුඛ සියලුම ආයතනවල සේවයේ නියුතු සෑම දෙනාටම ලැබේවා'යි ප්‍රාර්ථනා කරන අතරම අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීමට දායක වූ සියලුම දෙනා හට මාගේ ස්තූතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.



ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ආරක්ෂක ලේකම්

1

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

"සැම සුරැකි සාමකාමී දේශයක්" යන දැක්ම පෙරදැරිව භෞමික අඛණ්ඩතාවයෙන් යුතු සුරක්ෂිත ස්වෛරී රටක වත්මන් හා අනාගත පරපුරට අභිමානවත්ව ජීවත්වීම උදෙසා ජාතික ආරක්ෂාව හා සාමය සුරක්ෂිත කිරීම පිණිස උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාවට නැංවීමේ මූලික වගකීම ආරක්ෂක අමාත්‍යාංශයට පැවරී ඇත. ඒ අතරම මෙම අමාත්‍යාංශය යටතේ ඇති ඒ ඒ ආයතනවල කාර්ය භාරය අනුව දිළිඳුකම තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආගමික හා සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීම, පරිසරය ආරක්ෂා කිරීම මෙන්ම උසස් අධ්‍යාපනය තුළින් විනයගරුක සමාජයක් බිහිකිරීම ද ස්වභාවික ව්‍යසනයන්ගෙන් හා වසංගත තත්ත්වයන්ගෙන් ජනතාව ආරක්ෂා කිරීම ද මත්ද්‍රව්‍ය උවදුර පිටුදැකීම උදෙසා ද වන සමාජ වගකීම ඉටු කිරීමේ වගකීම සාක්ෂාත් කිරීමෙහිලා රජය විසින් ක්‍රියාත්මක කරන වැඩපිළිවෙලෙහි සැලකිය යුතු වැඩ කොටසක් ද මෙම අමාත්‍යාංශයට පැවරී ඇත.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම මූලික පරමාර්ථය කොටගත් සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගතව එකී සැලසුම් හා ප්‍රතිපත්ති නීතිගරුක, වෘත්තීමය හමුදාවන් මෙහෙයවමින් ක්‍රියාත්මක කරන අතර ආරක්ෂක කටයුතුවලට බාධා නොවන පරිදි ඔවුන්ගේ නිපුණතා හා ශක්තීන් ජාතික සංවර්ධනය අරභයා සෘජුව දායක කර ගනිමින් සිය ජාතික මෙහෙවර ඉටු කිරීමට ද අමාත්‍යාංශයට හැකිවී ඇත.

ජාතික ආරක්ෂක ජාලය ශක්තිමත් කරමින් අන්තවාදය පෝෂණය කරනු ලබන සියලු මාර්ග හා ක්‍රියාකාරකම් අහුරාලීමට අවශ්‍ය නිශ්චිත පියවර ගැනීමට ද වත්මන් හා අනාගත අභියෝග විචක්ෂණශීලීව හා දූරදර්ශීව දකිමින් සෘජු හා මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ජාත්‍යන්තර සබඳතා පවත්වා ගෙන යාමට ද රජය දරන උත්සාහයට ආරක්ෂක අමාත්‍යාංශය උපරිම දායකත්වය සපයනු ලබයි.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා වන ජාතික ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස අමාත්‍යාංශය පවතින හා අනාගත අභියෝග විශ්ලේෂණය කරමින් හා බුද්ධි අංශ ශක්තිමත් කරමින් හා මෙහෙයවමින් සුරක්ෂිත වූ දේශයක් බිහි කරනු පිණිස නිරන්තරව කැපවීමෙන් කටයුතු කරයි.

2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 හා 2021 ජූලි 29 දිනැති අංක 2238/19 දරන අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ආරක්ෂක අමාත්‍යාංශයට කාර්යයන් හා කර්තව්‍යයන් පවරා ඇති අතර එකී කාර්යයන් හා කර්තව්‍යයන් මෙම වාර්තාවේ අංක 1.3 යටතේ සඳහන් කර ඇති අතර පහත සඳහන් ආයතන එකී කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබයි.

ආරක්ෂක අමාත්‍යාංශය

ආයතන

- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- රාජ්‍ය රහස් තොරතුරු සේවාව
- වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
- ජාතික ශිෂ්‍යභට බලකාය
- මිලෝදා ආයතනය (Academy of Financial Studies)
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව

1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

සැම සුරැකි සාමකාමී දේශයක්

මෙහෙවර

භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක්

තහවුරු කිරීම උදෙසා

උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම

සහ

ක්‍රියාවට නැංවීම



1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හා 2021 ජූලි 29 දිනැති අංක 2238/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ආරක්ෂක අමාත්‍යාංශයට කාර්යයන් හා කර්තව්‍යයන් පහත දැක්වේ.

අ. ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ''සුරක්ෂිත රටක්'' ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ආරක්ෂක විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය රාජ්‍ය අයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

ආ. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

ඇ. රටේ හමුදාමය ආරක්ෂාව මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව ද සහතික කරන අතර අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා තබා ගැනීමට අවශ්‍ය සියලු කාර්යයන් ඉටුකිරීම.

ඈ. රාජ්‍ය හා පෞද්ගලික ආර්ථික ක්‍රියාවලීන් මෙන්ම දෙස් විදෙස් අයෝජන අවස්ථා පුළුල් කරන ආරක්ෂිත පරිසරයක් රට තුළ ඇති කිරීම.

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන*




අතිරේක ලේකම් (පරිපාලන)
අතිරේක ලේකම් (ආරක්ෂක)
ජෙ.ස.ලේ. I (පරිපාලන)
ජෙ.ස.ලේ. II (පරිපාලන)
අධ්‍යක්ෂ (විමර්ශන)
නීති උපදේශක
ජෙ.ස.ලේ I
ජෙ.ස.ලේ II
ජෙ.ස.ලේ III
ජෙ.ස.ලේ IV
ස.ලේකම් (පරිපාලන I)
ස.ලේකම් (පරිපාලන II)
ස. අධ්‍යක්ෂ (ස.ආ.සු)
ස. අධ්‍යක්ෂ (විමර්ශන)
නීති නිලධාරී 03
සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර ලේකම්
පරිපාලන නිලධාරී I
භාෂා පරිවර්ථක 04


ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්
ආරක්ෂක ලේකම්
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති)
අතිරේක ලේකම් (පාලනය)
ප්‍රධාන මූල්‍ය නිලධාරී I
ප්‍රධාන මූල්‍ය නිලධාරී II
ජෙ.ස.ලේ. (සිවිල් ආරක්ෂක)
ජෙ.ස.ලේ (සංවර්ධන)
නි. සුපුරුෂ දුව්‍ය සාලක 01
නි.අ. සුපුරුෂ දුව්‍ය සාලක 02
ජෙ.ස.ලේ
අධ්‍යක්ෂ (අධීක්ෂණ හා ඇගයීම්)
ප්‍රධාන ගණකාධිකාරී
සහකාර ලේකම් (සිවිල් ආරක්ෂක)
සහකාර ලේකම් (සංවර්ධන)
සහකාර සුපුරුෂ දුව්‍ය සාලක 15
සහකාර ලේකම්
යාන්ත්‍රික ඉංජිනේරු
ගණකාධිකාරී (ආදායම හා වත්කම් කළමනාකරණ)
ගණකාධිකාරී (වැටුප්)
ගණකාධිකාරී (ගෙවීම්)
ගණකාධිකාරී (මුදල්)
ගණකාධිකාරී (ඇපයුම්)
ගණකාධිකාරී (ප්‍රසම්පාදන)
මහාරතුරු හා යන්ත්‍රෝපවේදන පාඨමාලා නිලධාරී 03
සුපුරුෂ කළමණාකරු, පර්යේෂණ සහකාර, මූල්‍ය සහකාර, සංවර්ධන නිලධාරී, බලශක්තික නිලධාරී, නීති සහකාර, කළමණාකරණ සේවා නිලධාරී, සංවර්ධන සහකාර, පිළිගැනීම් නිලධාරී,සුස්තකාලයාධිපති
කාර්යාල කාර්ය සහායක, රියදුරු, ආරක්ෂක භට පුද්ගල
උදාහරණ කම්කරු


අධ්‍යක්ෂ ජනරාල්
(සැලසුම්)
ජාතික බුද්ධි
ප්‍රධානී
අධ්‍යක්ෂ
හමුදා සම්බන්ධතා
නිලධාරී
අධ්‍යක්ෂ (මාධ්‍ය)
ප්‍රධාන අභ්‍යන්තර
විගණක
නියෝජ්‍ය
අධ්‍යක්ෂ
සහකාර
අධ්‍යක්ෂ

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන

දෙපාර්තමේන්තු

- ශ්‍රී ලංකා යුධ හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව

ආයතන

- ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය
- රාජ්‍ය බුද්ධි සේවය
- සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
- ජාතික ශිෂ්‍යභට බලකාය
- මිලෝදා ආයතනය (Academy of Financial Studies)

1.5.1 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතන	ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්
1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2. ශ්‍රී ලංකා නාවික හමුදාව 3. ශ්‍රී ලංකා ගුවන් හමුදාව 4. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව 5. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 6. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව 7. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය 8. රාජ්‍ය බුද්ධි සේවය 9. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය 10. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය 11. ජාතික ශිෂ්‍යභට බලකාය 12. මිලෝදා ආයතනය (Academy of Financial Studies)	○ 1949 අංක 17 දරණ යුධ හමුදා පනත ○ 1950 අංක 34 දරණ නාවික හමුදා පනත ○ 1949 අංක 41 දරණ ශ්‍රී ලංකා ගුවන් හමුදා පනත ○ 2009 අංක 41 දරණ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත ○ 1985 අංක 40 දරණ හමුදා පනත ○ අංක අමප/19/3388/201/004 දරණ 2019 දෙසැම්බර් පනත ○ 2009 අංක 35 දරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ○ 1981 අංක 68 දරණ ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ○ 2008 අංක 05 දරණ රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ○ 1985 අංක 40 දරණ මිනිස් බල උපයෝගිතා හා පරිපූරක හමුදා පනත ○ 1956 අංක 21 දරණ පුපුරණ ද්‍රව්‍ය පනත ○ 1916 අංක 33 දරණ ගිනි අවි ආඥා පනත ○ 1951 අංක 24 දරණ වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත. ○ 1966 අංක 18 දරණ පීඩාකාරී අවි පනත ○ 2001 අංක 9 දරණ මුහුදු කොල්ලකෑමේ පනත. ○ 1979 අංක 48 දරණ ත්‍රස්ත්‍රවාදය වැළැක්වීමේ පනත ○ 1999 අංක 11 දරණ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත ○ 2000 අංක 42 දරණ සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමේ පනත ○ 1977 අංක 08 දරණ උදර්පණ නීතිය

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘති සහ විදේශ ණය යෝජනා ක්‍රම

අ. විදේශ ආධාර ලබන ව්‍යාපෘති

අනු අංකය	අදාළ රට	මුදල	2021 ප්‍රගතිය
01	චීනය- 2018B-024-JY117 දරන මූල ලේඛණය (Protocol)	යුවාන් RMB 45,000,000	I. 2019.05.14 දින මෙම හදිසි බළඇණි සහ සන්නිවේදන පද්ධති සැපයීම පිළිබඳ මූල ලේඛනය අත්සන් කර ඇත. II. මේ වන තෙක් සැපයීම් හෝ මෙම අමාත්‍යාංශය වෙත කිසිදු යාවත්කාලීන කිරීමක් සිදු වී නොමැත. III. 2019.06.07, 2020.06.25, 2021.06.03, 2021.08.10 දිනැතිව සිහි කැඳවීම් කර ඇත.
02	චීනය- 2017B-025-JY117 දරන මූල ලේඛණය (Protocol)	යුවාන් RMB 33,000,000	I. 2019.05.14 දින පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත බැහැර කිරීමේ උපකරණ (EOD) සැපයීම. මූල ලේඛණය අත්සන් කර ඇත. II. උපකරණ සපයා අවසන් කර ඇත.
03	චීනය- 2020B-033-JY117 දරන මූල ලේඛණය (Protocol)	යුවාන් RMB 102,000,000	I. 2021.04.28 දින ශ්‍රී ලංකාව වෙත සන්නිවේදන හා පුපුරණ සුළු යුධ උපකරණ බැහැර කිරීමේ උපකරණ ලබා ගැනීම සඳහා - 2020B-033-JY117 දරන මූල ලේඛණය (Protocol) අත්සන් කරන ලදී. II. 2021.05.11 දිනැතිව උපකරණ ලබා ගැනීම සඳහා චීන තානාපති කාර්යාලය වෙත ඉල්ලීම් කර ඇත. ත්‍රිවිධ හමුදාවට හා ශ්‍රීලංකා පොලිසියට භාණ්ඩ ලබා ගැනීම සඳහා සාකච්ඡා සිදුවෙමින් පවතී.

ආ. විදේශ ණය යෝජනා ක්‍රම

අනු අංකය	අදාළ රට	මුදල	2021 ප්‍රගතිය
01	රුසියානු ණය යෝජනා ක්‍රම	ඇ.ඩො.මි. 134.7	1. අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි මෙම ණය යෝජනා යටතේ ඇ.ඩො.මි. 134.7 ක මුදල යටතේ පහත අයිතම ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. I. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා 4x Mi-171Sh හෙලිකොප්ටර්. II. BTR 82A 8x8 රෝද සහිත APC, ශ්‍රී ලංකා යුද හමුදාව සඳහා ප්‍රතිසාධන සහ අණ දෙන වාහන (ප්‍රමාණය තීරණය කිරීමට නියමිතය). ඉහත අයිතමයන් සම්බන්ධයෙන් රුසියානු පාර්ශවය විසින් වාණිජ යෝජනා ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා යුධ හමුදාවේ හා ගුවන් හමුදාවේ නිරීක්ෂණ කැඳවා ඇත.
02	ඉන්දියානු ණය යෝජනා ක්‍රම	ඇ.ඩො.මි. 50	I. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ඇති ප්‍රමුඛතා ලැයිස්තුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත 2021.03.02 දින යොමු කර ඇත. II. පසුව,විශේෂ කාර්ය බලකායට (STF) අදාළ සංශෝධිත ප්‍රමුඛතා ලැයිස්තුව 2021.08.12 දින විදේශ සම්පත්

			දෙපාර්තමේන්තුව(ERD) වෙත යොමු කරන ලදී. III. ඇමරිකානු ඩොලර් මිලියන 50 ක ඉන්දියානු ණය යෝජනා ක්‍රමය පිළිබඳ ආරක්ෂක අමාත්‍යාංශයේ අදහස ඉන්දීය පාර්ශවයට දැනුම් දීම සඳහා ERD වෙත දන්වා ඇති අතර ඉන්දීය පාර්ශවයන්ගේ ප්‍රතිචාරය අපේක්ෂා කෙරේ. IV. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිරීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය යහපත් වනතුරු මෙම පහසුකම සම්බන්ධ කටයුතු කල්දැමීමට විරුද්ධත්වයක් නොමැති බව 2021.11.05 දින ERD වෙත දැනුම් දී ඇත.
		ඇ.ඩො.මි. 100	ගිවිසුම දැනටමත් අත්සන් කර ඇති අතර ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. සපයා ගැනීමට යෝජිත භාණ්ඩ, I. Indra MK-II රේඩාර් පද්ධතිය සඳහා අමතර කොටස්. II. ශ්‍රී ලංකා පොලිසිය සහ STF සඳහා ජීප් රථ 750 ක්. III. VHF ශ්‍රී ලංකා හමුදාව සඳහා සන්නිවේදන උපකරණ. ශ්‍රී ලංකා පොලිසිය සඳහා ජීප් රථ 750ක් දක්වා ගෙන ඇත.
03	පාකිස්ථානු ණය යෝජනා ක්‍රම	ඇ.ඩො.මි.10	• ගිවිසුම දැනටමත් අත්සන් කර ඇත. • පකිස්ථානු රජයට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමුඛතා අයිතම ලැයිස්තුව ERD වෙත යවා ඇත. I. යුධ හමුදාව - තනි කැබ් රථ සහ ද්විත්ව කැබ් රථ II. නාවික හමුදාව III. ගුවන් හමුදාව - Armed personal careers IV. STF - පොදු කටයුතු සඳහා වන ජීප් / 4x2 ට්‍රක් රථ • උක්ත භාණ්ඩ සඳහා පකිස්තාන පාර්ශවයන්ගේ එකඟතාව අපේක්ෂා කෙරේ.
		ඇ.ඩො. මි. 50 (නව)	I. පාකිස්තානු ණය යෝජනා ක්‍රමය පිළිබඳ පකිස්තානු පාර්ශ්වය සමඟ සාකච්ඡා කර මෙම ණය යෝජනා ක්‍රමය ලබා දීම පිළිබඳව ඔවුන්ගෙන් එකඟතාවය තහවුරු කරන ලෙස ඉල්ලීම කරන ලදී. II. පිළිතුරක් පොරොත්තුවෙන් පවතින අතර මෙම ණය මාර්ගය හරහා ප්‍රසම්පාදනය කිරීමට ප්‍රමුඛතා අයිතම ලැයිස්තුව ERD වෙත ඉදිරිපත් කරන ලදී.
		ඇ.ඩො.මි. 50 (පැරණි)	ERD නිර්දේශය සලකා බලා, ආරක්ෂක ලේකම්වරයාගේ විධාන අනුව US$ Mn 4.17 ඉතිරි මුදල රඳවා තබා ඇත.

පරිච්ඡේදය

2

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1

ප්‍රගතිය

2.1 ප්‍රගතිය

2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

අ. ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදනය සහ ආරක්ෂක නීති සංශෝධනය.

(1) රට සඳහා ශක්තිමත් ආරක්ෂක යාන්ත්‍රණයක අවශ්‍යතාව අවබෝධ කරගත් රජය මීට වසර කිහිපයකට පෙර කෙටුම්පත් කරන ලද දැනට පවතින ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. සංශෝධිත ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය ශ්‍රී ලංකාවට බලපාන පුළුල් ආරක්ෂක ගැටලු ආමන්ත්‍රණය කරමින් අදාළ සියලු පාර්ශවවල සහභාගීත්වය සහිතව, අනාගතවාදී සහ විස්තීරණ ආකාරයෙන් ජාතික ආරක්ෂක යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට නව ජවයක් ලබා දෙන ආකාරයෙන් සකස් කෙරෙනු ඇත. මේ වන විට අමාත්‍යාංශය අදාළ සියලු පාර්ශවවල අදහස් ලබා ගැනීම සඳහා කෙටුම්පත් කරන ලද ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව පුළුල් සාකච්ඡාවක නියැලෙමින් සිටී.

(2) සියලු බුද්ධි සේවා නියාමනය හා බල ගැන්වීමට අවශ්‍ය ප්‍රතිපාදන සහිත නව නීතියක් ලෙස රටේ බුද්ධි සේවා ශක්තිමත් කිරීම සඳහා ජාතික බුද්ධි පනත කෙටුම්පත් කිරීමට කැබිනට් අනුමැතිය හිමි විය. ජාතික බුද්ධි පනත හඳුන්වා දීමේ අරමුණ බුද්ධි අංශවල ක්‍රියාකාරකම් නියාමනය කිරීමට සහ ඔවුන්ගේ මෙහෙයුම්වලට සහාය වීමට ප්‍රමාණවත් නීතිමය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් සිදුවිය හැකි අඩුපාඩු වළක්වා ගැනීමයි. 2021 දී කැබිනට් මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් පරිදි, එම පනත් කෙටුම්පත කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රාජ්‍ය බුද්ධි සේවාව හා යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂණ සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත 2021.09.22 දින ඉදිරිපත් කර ඇත. එය මේ වන විට අමාත්‍යාංශයේ නීති අංශය විසින් එය විමර්ශනය කරමින් පවතී.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටයුතු ස්වාධීනව සහ පාරදෘශ්‍ය ලෙස යමින් එහිදී නිවැරදි, කාර්යක්ෂම, ඵලදායී, උපදේශනාත්ම සහ උපදේශනාත්ම නීති සේවාවක් සහ අනෙකුත් නීති අවශ්‍යතාවයන් සපයමින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලව නීතියේ අධිපත්‍ය සුරකිමින් කටයුතු කිරීම සඳහා ස්වාධීන ආයතනයක් ලෙස විධායක නීති දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

(4) ගුවන් හමුදා විධායක නීති දෙපාර්තමේන්තුව යටතේ සිදු කරන නීතිමය කටයුතුවලට අමතරව රටේ සාමය පවතින අවස්ථාවන්හී දී ත්‍රිවිධ හමුදා සමාජිකයින් විවිධ මෙහෙයුම් කටයුතු (උදා-: ආපදා කලමනාකරණය, ආපදා සහන සැලසීම, සිවිල් ආයතන සමග කටයුතු කිරීම සහ සහය දීම) වල දී සේවා පුද්ගලයන් විසින් එම කටයුතු වඩාත් නීත්‍යානුකූල සහ විනයානුකූල ලෙස සිදු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහයක් වශයෙන් යොදා ගැනීමට " මැදිහත්වීමේ රීති" මාලාවක් සකස් කිරීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා විසින් සිදු කල නියෝග ප්‍රකාර කටයුතු කරන ලදි.

(5) ගුවන් හමුදාවේ විධායක නීති දෙපාර්තමේන්තුව විසින් පවතින නීති සංශෝධනය සඳහා මැදිහත්ව කටයුතු කළ අතර එහිදී ආරක්ෂක විද්‍යාලයීය පනත් කෙටුම්පත සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සඳහා අවශ්‍ය නිරීක්ෂණ යොමු කිරීමට කටයුතු කරන ලදි. එහි දී එම පනත් කෙටුම්පත්වල නීත්‍යානුකූලභාවය, එයින් ශ්‍රී ලංකාවට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවට විය හැකි බලපෑම, එම සංශෝධන ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි විවිධ ගැටළුකාරී තත්ත්වයන් ආදිය සම්බන්ධයෙන් මූලිකවම නීරීක්ෂණය යොමුකරන ලදී.

(6) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය විසින් ශ්‍රී ලංකාව තුළට විවිධ ආයතන මඟින් ආනයනය කරනු ලබන රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම, භාවිතය සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් ඇති වන අනතුරුදායක තත්ත්වය වැළැක්වීම සඳහා එම ආයතන සමඟ

සම්බන්ධීකරණයෙන් ඒකාබද්ධ ප්‍රතිපත්ති මාලාවක් සකස්කොට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩපිළිවල සකස් කිරීම.

(7) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය විසින් ශ්‍රී ලංකාව තුළට ගෙනෙනු ලබන ඩ්‍රෝන විවිධ සංඛ්‍යාත පරාස සහ GPS තාක්ෂණ ඔස්සේ ක්‍රියාත්මක වන අතර ඩ්‍රෝන අධි ආරක්ෂිත කලාපවලට ඇතුළුවීම සහ අවශ්‍ය පරිදි නියාමන යාන්ත්‍රණ සකස් කරන තෙක් අධීක්ෂණ කාර්යයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

(8) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය විසින් පහත සඳහන් අණ පනත් සබැඳිව කටයුතු කරන ලදී;

අ. වෙඩිපිටි ආඥා පනත සංශෝධනය සඳහා නීති කෙටුම්පත් අංශය වෙත යොමු කර ඇත.

ආ. සයිබර් ආරක්ෂාව පිළිබඳ පනත් කෙටුම්පත් සකස් කිරීම පිළිබඳ අදාළ ආයතන සහ අංශ සම්බන්ධීකරණය කිරීම.

(9) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය විසින් ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම මඟින් ජාතික ආරක්ෂාව සඳහා ගෙන ඇති උපාය මාර්ගික පියවර පහත දැක්වේ;

අ. සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සඳහා සහය වීම.

ආ. සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම.

ඇ. සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය සැළසුම් සකස් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම.

ඈ. සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයට අදාළ කර්තව්‍යයන් සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධීකරණය කිරීම

ඉ. සන්නද්ධ හමුදාවල ශක්‍යතාවය නිශ්චය කිරීම සඳහා වූ තක්සේරු කිරීම් භාරගැනීම.

ඊ. සන්නද්ධ හමුදා මෙහෙයුම්වල සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම සහ සන්නද්ධ හමුදාවන් අතරේ ඒවා ක්‍රියාත්මක කිරීම.

උ. සන්නද්ධ හමුදාවලට අදාළ අහඹු සැලසුම් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම.

ඌ. තීරණාත්මක ඌනතා සහ ශක්තීන් පිළිබඳ උපදෙස් දීම.

එ. ක්‍රමෝපාය සැලසුම්වලට අදාළව මුදල් වර්ෂයක් සඳහා සන්නද්ධ හමුදාවල වැඩසටහන්, නිර්දේශ හා අයවැය යෝජනා පිළිගත් ප්‍රමුඛ කරුණුවලට කොතෙක් දුරට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම.

ඒ. මිනිස් බලය උපකරණවලට අදාළව, සන්නද්ධ හමුදාවල මහා පරිමාණ වැඩසටහන් හා ප්‍රතිපත්ති කොතෙක් දුරට ක්‍රමෝපාය සැලසුම්වලට අනුකූල වන්නේද යන්න පිළිබඳව උපදෙස් දීම.

ඔ. යෝජිත ආරක්ෂක ප්‍රසම්පාදන සැලසුම්වලට එරෙහිව යුදමය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ ඒ අනුව අමාත්‍යාවරයාට උපදෙස් දීම.

ඕ. සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ පුහුණු වීම් සඳහා ප්‍රතිපත්ති සැළසුම් කිරීම.

ක. සන්නද්ධ හමුදා විසින් සාමසාධක මෙහෙයුම් කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා නියම කරනු ලබන හෝ අවශ්‍ය කරන වෙනත් සියලු දේ කිරීම.

(10) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය විසින් ජනකොටස් අතර සංහිඳියාව සහ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට සහාය දැක්වීමේ රජයේ වැඩ පිළිවෙලට සහාය දැක්වීමක් වශයෙන් මෙම අංශය ත්‍රිවිධ හමුදාව සමඟ එක්ව ත්‍රිවිධ හමුදාව බුක්ති විඳින ඉඩම්වලින් නිදහස් කළ හැකි ඉඩම් හඳුනාගෙන ඒවා නිදහස් කර භාරදීමත්, අවශ්‍ය අවස්ථාවලදී හමුදා කඳවුරු ප්‍රතිස්ථානගත කිරීමට කටයුතු සම්පාදනය කිරීමත් කරනු ලබයි.

(11) ආරක්ෂක අමාත්‍යාංශය සඳහා සහ අමාත්‍යාංශය යටතේ වන ත්‍රිවිධ හමුදාව, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන සඳහා ඉල්ලුම් කර ඇති රජයේ ඉඩම් පවරා ගැනීමටත් පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ආයතන සමඟ කටයුතු කිරීමේ දී අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා පාර්ලිමේන්තු කටයුතු අංශය විසින් පහත කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කර ඇත.

2021.01.01-2021.12.31 දක්වා ඉඩම් රාජකාරි සම්බන්ධ ප්‍රගතිය

ආයතනය	2021වර්ෂයේදී ලද නව ඉල්ලීම්	ප්‍රා.ලේ. වර්තා කැඳවීම්	මු.රෙ. අනුමැතිය සඳහා යොමු කිරීම	තක්සේරු වාර්තා සඳහා යොමු කිරීම	ඉ.කොෂ.ප. යොමු කිරීම	නාගරික සංවර්ධන අධිකාරියට ලිපි යොමු කිරීම	ඉඩම් අමාත්‍යාංශයට ලිපි යොමු කිරීම.අත්පත් කර ගැනීම	මහවැලි අධිකාරිය	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	පැවරීම් සහතික ලබා ගැනීම	විවිධ අවසර පත්‍ර ලබා ගැනීම	
											වන ජීවී	වන සංරක්ෂණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	60	69	07	15	20	11	-	03	05	02	-	10
ශ්‍රී ලංකා නාවික හමුදාව	31	29	09	09	49	06	22	-	-	13	-	-
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	05	08	-	-	-	03	-	01	01	-	-	02
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	01	-	-	-	-	-	-	-	-	-	-	-
වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	-	-	-	-	-	-	-	-	-	-	-	-
ජාතික ශිෂ්‍ය භට බලකාය	01	-	-	-	-	-	-	-	-	-	-	-
රාජ්‍ය බුද්ධි සේවය	01	-	-	-	-	-	-	-	-	-	-	-

(12). අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය විසින් පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා අදාළ ආයතනයන් සම්බන්ධීකරණය කරමින් නියමිත දිනට ත්‍රෛභාෂාවන්ගෙන් අදාල පිළිතුරු සකස් කර පාර්ලිමේන්තුවට යොමු කරන ලදි. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතන සම්බන්ධව පාර්ලිමේන්තු ප්‍රශ්න 25 ක් ද, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන සම්බන්ධව පාර්ලිමේන්තු ප්‍රශ්න 05 කට ද සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතන සම්බන්ධව පාර්ලිමේන්තු ප්‍රශ්න 04 කට ද පිළිතුරු සපයා ඇත.

(13). පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේදී අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව එක් ප්‍රශ්නයක් ද

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 07ක් හා ස්වදේශ කටයුතු රාජ්ය අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව ප්‍රශ්න 01 කට පිළිතුරු සපයා ඇත.

(14). ස්ථාවර නියෝග යටතේ අසන ප්‍රශ්න හා ගරු අමාත්‍යතුමාගෙන් පාර්ලිමේන්තුවේදී අසන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 02ක් ද, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 02 කට හා ස්වදේශ කටයුතු රාජ්ය අමාත්‍යාංශයේ විෂය පථයට අදාලව ප්‍රශ්න 02 කට පිළිතුරු සපයා ඇත.

(15). එමෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම් 3ක දී ඉදිරිපත් වූ යෝජනා හා තීරණ 14 ක් සම්බන්ධයෙන් අදාළ ආයතන සම්බන්ධීකරණය හා අවශ්‍ය කටයුතු ඉටු කරන ලදි.තව ද මහජන පෙත්සම් කාරක සභාව වෙත පිළිතුරු සැපයීම සහ සහභාගීත්වය ලබා දීමේ දී ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 8 ක් හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතනයන්ගේ විෂය පථයට අදාලව ප්‍රශ්න 10කට පිළිතුරු සැපයීම සිදු කරන ලදි.

(16). අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුගතව අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාකාරී රාමුව සකස් කර එක් එක් ආයතන මඟින් අදාළ ඉලක්ක සපුරා ගැනීම සඳහා දායක වන ආකාරය හඳුනාගෙන එසේ පැවරී ඇති කාර්යයන් හා ඉටු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය 2020.11.30, 2021.04.30, 2021.07.31සහ 2021.10.31යන දිනයන් හි ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

(17). අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් පහත සඳහන් ජාතික සැලසුම් ක්‍රියාවලීන් හි ආරක්ෂක අමාත්‍යාංශයේ ක්‍රමෝපායික මැදිහත් වීම සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

- තිරසර සංවර්ධන ඉලක්කවලට අනුරූපීව ආරක්ෂක අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල උපායමාර්ග හා දර්ශක සකස් කරන ලදී.
- ළමා ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට අදාළ තොරතුරු ළමා ආරක්ෂක අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ ප්‍රඥප්තියට අදාළ මෙම අමාත්‍යාංශයට අදාළ තොරතුරු කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත යවා ඇත.

ආ. <u>ආරක්ෂක අංශ ශක්තිමත් කිරීම</u>

(1) ත්‍රිවිධ හමුදාව සඳහා නවීන තාක්ෂණික මෙවලම් සඳහා ආයෝජනය

ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතනවලට පැවරී ඇති භාරධුර කර්තව්‍යය සලකා අයවැය මඟින් ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව හා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතනද ඇතුළුව ආරක්ෂක අමාත්‍යාංශයට 2021 වසර සඳහා රුපියල් බිලියන 25.5 ක මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව හා රාජ්‍ය බුද්ධි සේවාවෙහි ප්‍රාග්ධන වියදම් සඳහා සැලකියයුතු අරමුදල් ප්‍රමාණයක් වෙන් කරන ලදී. මෙම ප්‍රතිපාදන ජාතික

ආරක්ෂාව ඉහල නැංවීම සඳහා ත්‍රිවිධ හමුදාවේ ආවේක්ෂණ හැකියාව හා මෙහෙයුම් ධාරිතාව වැඩි කිරීම සඳහා වන මිලදී ගැනීම් හා අලුත්වැඩියාවන් සඳහා යෙදවීමට ප්‍රමුඛතාව දෙන ලදී. 2021 අයවැය ඇස්තමේන්තු මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් බලය වැඩිකිරීමට ගුවන් යානා (Y12-2) හා ගුවන් නියමුවන් පුහුණු කිරීම සඳහා හෙලිකොප්ටර් (Bell206-4) සංඛ්‍යාව වැඩි කිරීම හා පවතින යානා අඛණ්ඩව පිරිවැඩියා සිදුකිරීම සහ පවතින රේඩාර් ආවරණය වැඩිදියුණු කිරීම සඳහා රේඩාර් පද්ධති මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබිණ. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අක්වෙරළ මුර සංචාර යාත්‍රාවක් සහ වේග මුර යාත්‍රා 02ක් අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ අතර නාවික හමුදාව සතු නාවික බලය ශක්තිමත් කිරීම තුලින් ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ සිදුවන නීති විරෝධී ක්‍රියාවන් නැවැත්වීම, සමුද්‍රීය ආරක්ෂාව සහ නාවික ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු වනු ඇත. යුධ හමුදා බුද්ධි අංශය අලුතින් ප්‍රතිසංවිධානය කිරීමටත් බුද්ධි තොරතුරු සන්නිවේදනය වඩා කඩිනම්ව උපරිම රහස්‍යභාවයෙන් සිදු කිරීමට අවශ්‍ය නවීන සන්නිවේදන ක්‍රම ස්ථාපිත කරන ලදී. යුධ හමුදා භට පිරිස්වලට නවීන තාක්ෂණය ලබාදෙමින් යුධ හමුදා සෙබලා නූතන තාක්ෂණ සෙබලෙකු ලෙස නිර්මාණය කිරීමටත් ශක්තිමත් යුධ හමුදාවක් බිහි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ.

2021 අයවැය දෙවන වර කියවීමේදී රුපියල් බිලියන 20 ක අතිරේක ප්‍රතිපාදනයක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය ආරක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාව රටේ බහුවිධ ආපදාවලදී සිදුකරන කාර්යභාරයන්වලට අවශ්‍ය කෙටි කාලීන යන්ත්‍රෝපකරණ හා යටිතල පහසුකම් සඳහාත් 2021 වසර සඳහා අනුමත කරන ලදී. රටේ අනාගත පරම්පරාව විනාශ මුඛයට ගෙන යා හැකි ඇසට නොපෙනෙන තර්ජනයන්ට මුහුණ දීමට හා ආපදාවලින් ජනතාව මුදවා ගැනීමට හැකිවන පරිදි ත්‍රිවිධ හමුදා යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට ආයෝජනය කිරීම ප්‍රශංසනීය කරුණක්. මෙම ප්‍රතිපාදන භාවිතයට ගෙන නාවික හමුදාවේ සමුද්‍රීය නිරීක්ෂණ පද්ධති, වෙරළබඩ පෙට්‍රෝල් යාත්‍රා, සන්නිවේදන පද්ධති හා අත්‍යාවශ්‍ය මෙවලම් මිලදී ගැනීම සඳහා මෙම අරමුදල් යෙදවීමට සැලසුම් කරන ලදී.

මෙම අතිරේක අරමුදල් භාවිත කර ත්‍රිවිධ හමුදාවේ කටයුතු ශක්තිමත් කිරීම හා නවීකරණය කිරීමේ අරමුණින් 2021 වසරේ දී අලුතින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලද ප්‍රාග්ධන අයිතමයන් පහත දැක්වේ;

	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මි.	2021 ප්‍රතිපාදනය රු.මි.	2021 අවසානය වන විට ප්‍රගතිය
ශ්‍රී ලංකා නාවික හමුදාව			
➢ ත්‍රිකුණාමලයෙහි නෞකා තටාංගන ජැටියේ ඉදි කිරීම්	4,611	800	මෙම ව්‍යාපෘතිය අදියර I සහ අදියර II වශයෙන් ක්‍රියාත්මක වන අතර අදියර I බාහිර කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන අතර, අදියර II නාවික හමුදා ශ්‍රමය යොදා ක්‍රියාත්මක වේ. මෙවන විම අදියර II ඉදිකිරීම් 98% ක් නිමවී ඇති අතර අදියර I ඉදිකිරීම් කටයුතු 2021.05.31 දින ආරම්භ කර ඇත. එහි ඉදිකරීම් කටයුතු 2023.06.04 දින නිමකිරීමට නියමිතය.එසේ වුව ද 2021.12.31 දිනට අදියර I හි භෞතික ප්‍රගතිය 7% ක් වේ. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් උපදේශක ලෙස ඉංජිනේරු කාරයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) කටයුතු කරයි.
➢ අක්වෙරළ මුර යාත්‍රා 01 අත්පත් කර ගැනීම	12,025	2,405	තාක්ෂණික ඇගයීම් කමිටු වාර්ථා සකසමින් පවති.
➢ වේගවත් මුර යාත්‍රා 10ක් අත්පත් කර ගැනීම	22,200	1,200	අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ඇත

	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මි.	2021 ප්‍රතිපාදනය රු.මි.	2021 අවසානය වන විට ප්‍රගතිය
➢ වීඑච්එෆ් යූඑච්එෆ් සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම	1,112	402	අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ඇත
➢ ශ්‍රී ලංකා නාවික නෞකා ගැමුණු හි ගොඩනැගිල්ලක් ඉදිකිරීම	75	14.72	නාවික හමුදා ශ්‍රමය යොදා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන මෙහි අත්වාරම ඉදිකරමින් පවතී.
➢ LNS උත්තර ආයතනය සඳහා හදිසි ආලෝක පද්ධතියක් සහිත ගිනි අනතුරු ඇඟවීමේ සහ හඳුනාගැනීමේ පද්ධතියක් සැලසුම් කිරීම සහ සැපයීම	5.37	2	නාවික හමුදා ශ්‍රමය යොදා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන මෙහි ගිනි අනතුරු ඇඟවීමේ සහ හඳුනාගැනීමේ පද්ධතියෙහි වැඩ අවසන් කර ඇති අතර ගිනි ආරක්ෂක පද්ධතිය සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
➢ නාවික ඇකඩමිය සංවර්ධනය කිරීම	390.80	133	නාවික හමුදා ශ්‍රමය යොදා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන මෙහි ව්‍යුහාත්මක ඉදිකිරීම් කටයුතු තෙවන මහළ දක්වා නිමකර ඇති අතර බිම් මහලේ නිමැවුම් කටයුතු නිම කර ඇති අතර පළමු මහලේ බිත්ති බැඳීම් කටයුතු සිදුකරමින් පවතී.
ශ්‍රී ලංකා යුධ හමුදාව			
යුද හමුදා රෝහල පලාලි හි 180'x50' ප්‍රමාණයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ 100'x34' ප්‍රමාණයේ ශල්‍යාගාරයක් ඉදිකිරීම	145.13	31.56	දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල සඳහ කොන්ක්‍රීට් යොදා ඇති අතර, ශල්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
76'x49' ප්‍රමාණයේ නිළධාරි විවාහක නිවාස 10 ක් සහ 58'x52' ප්‍රමාණයේ සෙසුනිල විවාහක නිවාස 10 ක් ඉදිකිරීම - ආසේමු (මුලතිව්) , ආසේමු (කිලිනොච්චිය)	249.30	103.68	මෙම ගොඩනැගිලි 20 අතුරින් ගොඩනැගිලි 04 ක ඉදිකිරීම් මේ වන විට ආරම්භ කර ඇත.
යුද හමුදා රෝහල ඉදිකිරීම - පල්ලේකැලේ	369.09	214.59	රෝහලේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර, රෝහලේ ඇති අනෙකුත් අවශ්‍යතා සඳහා (රජක සේවා, මුළුතැන්ගෙය, වෛද්‍ය නේවාසිකාගාර) අවැසි ගොඩනැගිලි ඉදිකරමින් පවති.
යුද හමුදා ඖෂධ ගබඩාව ඉදිකිරීම	81.44	10.33	මෙය සම්පූර්ණ වානේ ගොඩනැගිල්ලක් වන අතර, එහි සම්පූර්ණ පදාම් කොටස් සකස් කර අවසන් කර ඇත.
කමාන්ඩො බලකා සෙනීන් පුහුණු කිරීම සඳහා 40'x40' ප්‍රමාණයේ අඩි 100 උසැති උස් පුහුණු ආධාරක ඉදිකිරීම	40.22	17.89	සේවාව ආරම්භ කර ඇති අතර, මේ වන විට අඩි 15 ක් උසැති ආධාරක කොටස සඳා නිම කොට ඇත. ජාතික සැලසුම් දෙපාර්තමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත
ශ්‍රී ලංකා ගුවන් හමුදාව			
Searcher II UAV ගුවන්	1,330	399	කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇති අතර දළ

	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මි.	2021 ප්‍රතිපාදනය රු.මි.	2021 අවසානය වන විට ප්‍රගතිය
යානා ප්‍රතිසංස්කරණය කිරීම(Refurbishment of Searcher II UAV Aircraft)			ලංසු ලිපිගොනුව ආරක්ෂක අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇත.භෞතික ප්‍රගතිය 11% කි.
අංක MI-35 හෙලිකොප්ටර් 03ක් අලුත්වැඩියා කිරීම (Overhaul of 03 Nos MI-35 Helicopters)	3,100	1,000	අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අවලංගු කර ඇත.
3D පහත් මට්ටමේ නාගරික නිරීක්ෂණ රේඩාර් (3D Low Level Urban Surveillance Radar)	900	270	කොළඹ වරාය නගරයේ ඉදිකිරීම් නිමවනතුරු තාවකාලිකව අත්හිටුවා ඇත.
ආපදා කළමනාකරණ උපකරණ මිලදී ගැනීම(Purchase of Disaster Management Equipment)	50	50	මෙහි ප්‍රසම්පාදන කටයුතු අවසන්කර රු.මි. 8.28ක බිල්පත් නිශ්කාෂණය කර ඇත.භෞතික ප්‍රගතිය 76.5% කි.
උපයෝගිතා වාහන මිලදී ගැනීම(Purchase of Utility Vehicles)	780	780	මෙහි ප්‍රසම්පාදන කටයුතු අවසන්කර රු.මි. 366.29ක බිල්පත් නිශ්කාෂණය කර ඇත.භෞතික ප්‍රගතිය 73%කි.
නව රෝහල ඉදිකිරීම (Construction of New Hospital)	4,586	1,075	මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉඩම අත්පත් කර ගෙන ඇති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.භෞතික ප්‍රගතිය 5% කි.
අංක 05 කෆීර් ප්‍රහාරක ගුවන් යානා වැඩිදියුණු කිරීම(05 Nos Kfir Fighter Aircraft Upgrade)	11,539.01	1,797.26	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ සැපයුම්කරු අතර ගිවිසුම් අත්සන් කර ඇති අතර සැපයුම්කරුගේ තාක්ෂණික කණ්ඩායම විසින් අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.පළමු ගෙවීම් සිදුකර ඇත.භෞතික ප්‍රගතිය 20.2කි.%
භාවිත කළ පුහුණු හෙලිකොප්ටර් අංක 04ක් මිලදී ගැනීම(Purchase of 04 Nos Used Trainer Helicopter)	670	636.50	තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.භෞතික ප්‍රගතිය 10%කි.

2021 වර්ෂයේ දී අයවැය යෝජනා මඟින් අතිරේකව රු. බි. 20ක් ත්‍රිවිධ හමුදාවල නවීන තාක්ෂණය හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ලබා දුන්නද එම වර්ෂය තුළ රටේ පැවති විදේශ විනිමය ගැටළු මත අපේක්ෂා කළ ආකාරයට අදාළ යන්ත්‍ර/උපකරණ/වාහන බොහොමයක් මිල දී ගැනීමට නොහැකි විය.

(2) ත්‍රිවිධ හමුදාව විසින් සිදු කරන සංවර්ධන / වැඩි දියුණු කිරීම්

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ 1 බලකාය පිහිටුවීම (අතිරේක ප්‍රහාරක බලකාය) - ආරක්ෂක අංශය ශක්තිමත් කිරීම පිණිස උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යුද්ධ හමුදාධිපතිගේ අතිරේක ප්‍රහාරක බලකාය ලෙස කටයුතු කිරීමට සහ ද්විතියික කාර්ය වශයෙන් හදිසි ආපදා අවස්ථාවන්වලදී මානුෂීය ආධාර හා ආපදා සහන (HADR) ක්‍රියාකාරකම් සඳහා විවිධ වූ පරිසර තත්ත්වයන් යටතේ මෙහෙයුම් සිදුකිරීම සඳහා 2021 ජූලි මස 16 වන දින අතිරේක ප්‍රහාරක බලකාය පිහිටුවන ලදී.

(ආ) සියලුම පාබල බලඇණි තුළට යතුරුපැදි සහ විශේෂ බෝට්ටු පෙල සහිත ක්ෂණික ප්‍රතිචාර කණ්ඩයක් ඇතුළත් කිරීම.

(ඇ) සියලු පාබල ඒකක වල බුද්ධි බණ්ඩ ස්ථාපනය කිරීම හා පාබල ඒකක සහ සන්නද්ධ බුද්ධි බලකා ඒකක අතර සබඳතා ගොඩනගා ගැනීම සඳහා යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම.

(ඈ) සන්නද්ධ බුද්ධි බලකා ඒකකයන්ට අයත් ඒ ඒ ප්‍රදේශයන් තුළ සිදුකරනු ලබන විශේෂ ප්‍රභූ හා රාජ්‍යතාන්ත්‍රික සංචාර සඳහා ආවේක්ෂණ කණ්ඩායම් ස්ථානගත කිරීම.

(ඉ) වෙනත් ඒකකයන්ට අයත් නිලධාරි/සෙසු නිලයින්ගේ බුද්ධි දැණුම වර්ධනය කිරීමේ අරමුණින් 2021.03.18 දින සිට ක්ෂේත්‍ර බුද්ධි පුහුණු මධ්‍යස්ථානය (මුලතිව්) හිදී කෙටි කාලීන බුද්ධි පාඨමාලා ආරම්භ කිරීම.

(ඊ) කොවිඩ් 19 වෛරසය සීඝ්‍ර ලෙස රට තුළ ව්‍යාප්ත වූ කාලසීමාවේදි යුද්ධ හමුදා සාමාජිකයින්ගේ චිත්ත ධෛර්ය ඉහල නංවාලීම සඳහා කිසිවෙකුට නොදෙවෙනි දිනු දේශයට "**සත්තමයි නුඹ වීරයෙක්**" අත්පත්‍රිකාව නිර්මාණය කර මුද්‍රණය කර බෙදාහැරීම.

(උ) යුද්ධ හමුදාව සඳහා නව සාමාජිකයින් බඳවාගැනීමේ වැඩ පිළිවෙල ශක්තිමත් කිරීම සඳහා පොස්ටර්, අත්පත්‍රිකා සහ සමාජ ජාලා පලකිරීම් නිර්මාණය කර ආධුනිකයන් බඳවාගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදීම, රණවිරුවා මාසික සඟරාවේ පලකිරීම සහ සමාජ ජාලාවන්හි පලකිරීමට කටයුතු කිරීම.

(ඌ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රුපියල් මිලියන 10ක් පමණ වටිනාකමකින් යුත් නවීනතම තාක්ෂණික උපකරණ මිලදී ගෙන ආවේක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම.

(එ) ධීවර වරායන් තුළදී වරාය යාත්‍රා ආවේක්ෂණ කිරීම සඳහා කැමරා පද්ධතියක් සවි කිරීමට කටයුතු කිරීම (IMBCS)

(ඒ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2021 වර්ෂයේ රෙජිමේන්තු කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ අරමුණින් හා සටන් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පහත සඳහන් නව ස්ථාපිත කිරීම් සිදු කර ඇත;

අනු අංකය	ඩ්‍රෝන වර්ගය	ප්‍රමාණය	කාර්යසාධනය
01	DJI M300 RTK	02	දිවා රාත්‍රී ක්‍රියාත්මක කල හැකි කැමරාව,සිරස්ව ගොඩබැස්සවිය හැකි අධෝරක්ත කැමරා හා විෂුවල් කැමරා සහිත වේ. වැඩිකාලයක් (පැය - 01) පියාසර කල හැකි වීම,කිලෝමීටර් 12කට වැඩි දුරක් පියාසර කල හැකි වීම,උපරිම කිලෝග්‍රෑම් 06 රැගෙන යා හැකි වීම
02	DJI Mavic 2 Enterprise Dual	06	දිවා රාත්‍රී ක්‍රියාත්මක කළ හැකි කැමරාව,සිරස්ව ගොඩබැස්සවිය හැකි අධෝරක්ත කැමරා හා විෂුවල් කැමරා සහිත වේ. අඩුකාලයක් (විනාඩි -31) පියාසර කල හැකි වීම,කිලෝමීටර් 06කට ආසන්න දුරක් පියාසර කල හැකි වීම, උපරිම කිලෝග්‍රෑම් 2.2 රැගෙන යා හැකි වීම.

ලබාගන්නා ලද ඩ්‍රෝන් පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්ථාපිත කර ඇත.

අනු අංකය	ඩ්‍රෝන වර්ගය	ප්‍රමාණය	ස්ථානය
1	DJI M300 RTK	2	ගුවන් හමුදා මූලස්ථානය
2	DJI Mavic 2 Enterprise Dual	1	විද්‍යාපීඨය වීන වරාය
3	DJI Mavic 2 Enterprise Dual	1	මූලික කඳවුර කටුනායක
4	DJI Mavic 2 Enterprise Dual	1	මූලික කඳවුර රත්මලාන
5	DJI Mavic 2 Enterprise Dual	1	මූලික කඳවුර වවුනියාව
6	DJI Mavic 2 Enterprise Dual	1	මූලික කඳවුර අනුරාධපුරය
7	DJI Mavic 2 Enterprise Dual	1	මූලික කඳවුර හිඟුරක්ගොඩ

(3) <u>ආරක්ෂක යටිතල පහසුකම් සංවර්ධනය</u>

(අ) ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය

1979 මහ කොළඹ සැලැස්මට අනුව , වාණිජ සංවර්ධනය උදෙසා ඉහළ වාණිජමය වටිනාකමකින් යුත් ඉඩම් විශාල සංඛ්‍යාවක් මුදාහැරීමට හැකි වන අයුරින් රජයේ කාර්යාල කොළඹ සිට නව පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත රැගෙන යාමට සැලසුම් කරන ලදී.තව ද සියළු ආරක්ෂක අංශ එක් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයක් යටතට ගෙනයාම තුලින් මූලිකවම බලාපොරොත්තු වනුයේ මේ වන විට ආයතන කිහිපයක් අතර බෙදී පවතින සම්පත් ඵලදායී අන්දමින් ප්‍රයෝජනයට ගැනීම, යටිතල පහසුකම් ද්විකරණය වීම අවම කිරීම, ආරක්ෂක මෙහෙයුම් /පරිපාලන/ප්‍රවර්ධන යන කාර්යයන්හි කාර්යක්ෂමතාව තවදුරටත් වර්ධනය වන පරිදි ආරක්ෂක අංශ සාමාජිකයන් වෙත නවීන පහසුකම් වලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් ලබාදීම සහ සංකේන්ද්‍රගත සංවර්ධන කලාපය තුල පිහිටි අධිආරක්ෂිත කලාප සංඛ්‍යාව අවම කිරීම තුළින් ආර්ථිකමය ශක්‍යතාවය වැඩි කිරීම මහජනතාවට ඇතිවන අපහසුතාවන් අවම කිරීම යනාදිය දැක්විය හැකිවේ.

ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය (බිම් කැබලි 09ක්), සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, ජලාපවාහන පද්ධතිය සහ ජල පොම්පාගාරයක් සහ සෙසු නිලයන් සඳහා තාවකාලික නවාතැන් පහසුකම් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වේ. ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙන කාලය තුල පැන නැගුන මුල්‍යමය සීමාකිරීමේ හා ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘති බිමෙහි යුධ හමුදා මූලස්ථානය ස්ථාපනය කිරීමේ පවතින දැඩි අවශ්‍යතාවය මත මෙම පළමු අදියර තවදුරටත් අදියරවලට බෙදා ඇත. **අදියර 01** යටතේ ගොඩනැගිලි අංක 06, 07, සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල , ජල පොම්පාගාරය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සිදු කෙරේ. **අදියර 02** යටතේ පළමු අදියරේ අවසන් නොවූ ඉතිරි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කෙරේ. ත්‍රිවිධ හමුදා නිලධාරින් 1,278 දෙනෙකු සහ ත්‍රිවිධ හමුදා නේවාසික සෙසු නිලයන් 11377 දෙනෙකු සඳහා භෝජනාගාර සහ අනෙකුත් බාහිර අංගයන් ඇතුළු පහසුකම් සහිතව ස්ථිර වාසස්ථාන සැපයීම මෙම ව්‍යාපෘතියේ දෙවන **අදියර** යටතේ සිදු කෙරේ.

<u>ව්‍යාපෘති මූල්‍ය ප්‍රගතිය (කාලසීමාව 01.01.2021 සිට 31.12.2021 දක්වා)</u>

පුනරාවර්තන වියදම්	-	නැත
ප්‍රාග්ධන වියදම්	-	රු. **7,858,163,589.07**

<u>ව්‍යාපෘති භෞතික ප්‍රගතිය (කාලසීමාව 01.01.2021 සිට 31.12.2021 දක්වා)</u>

සමස්ථ ප්‍රගතිය -74.35%
කාල සීමාවට අදාල භෞතික ප්‍රගතිය -10.46%

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය සඳහා වෙන් කර ඇති ගොඩනැගිලි 6 සහ 7 හි ඉදිකිරීම් කටයුතු සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් (සන්නිවේදන ගොඩනැගිල්ල, ආරක්ෂක ගොඩනැගිල්ල, මලාපවහන පවිත්‍රාගාරය, ජනන යන්ත්‍ර ගොඩනැගිල්ල, ජල සම්පත සහ පොම්පාගාරය) 2019 නොවැම්බර් මස අවසන් කරන ලදී. 2021 මැයි 18 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය (OCDS) සඳහා වෙන් කර ඇති 08 වැනි කොටසේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ආරක්ෂක අමාත්‍යාංශය තාවකාලිකව එහි පිහිටුවන ලදී.

(ආ) <u>උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය</u>

දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ වියහැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටුවේ. මෙම ව්‍යාපෘතිය අවසානයේදී, උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය ශ්‍රී ලංකාවේ උපායමාර්ගික වශයෙන් වැදගත් වන සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි ජාතික ආරක්ෂාවට සෘජුවම දායක වනු ඇත. ව්‍යාපෘතිය අවසානයේ ආවරණය වන මුළු භූමි ප්‍රමාණය පහත සිතියමේ දැක්වේ.





<u>2020 ජූලි 15 වන දා වන විට එම ව්‍යාපෘතියේ ප්‍රධාන මූලික අංගයක් වන ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 11ක් ශ්‍රී ලංකාව පුරා විවිධ ස්ථාන 11 ක ආවරණය වන පරිදි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 11ක් ඉදිකර ඇති ප්‍රදේශයන් පහත සිතියමේ දක්වා ඇත:</u>





2020 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන 21 ක ධ්වනි රෝධක විදුලි උත්පාදන යන්ත්‍ර 22 ක් අඛණ්ඩ විදුලි සැපයීම ලබාදිය හැකි පරිදි ස්ථාන ගත කර ඇත.





ක්ෂුද්‍ර තරංග රේඩියෝ සබඳතා 37 ප්‍රසම්පාදනය මේ වන විට ලංසුකරුවන්ගේ අභියාචනා ක්‍රියාවලියේ පවතින අතර ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් වෙමින් පවතී ටෙන්ඩරය ලබා දී භාණ්ඩ සැපයූ පසු මයික්‍රෝවේව් ගුවන් විදුලි ජාලය සවිකිරීම සඳහා මාස 9 කට ආසන්න කාලයක් අවශ්‍යය වේ. 2021 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා භෞතික ප්‍රගතිය 73% ක් වන අතර මුල්‍යමය ප්‍රගතිය රු.මිලියන 633.66 ක් වේ.

(4) ත්‍රිවිධ හමුදා පතොරම් ගබඩා හා වාණිජමය පුපුරණ ද්‍රව්‍ය ගබඩා සංකීර්ණය ඉදිකිරීම

2017/18 වසරවල සිට අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ රු.මී. 1,568.6ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකින් ඉදි කෙරෙමින් පවතින යෝජිත අවි ගබඩාව මඟින් යුද්ධ හමුදාව සතු සියලු පතොරොම්/වෙඩි ද්‍රව්‍ය සුරක්ෂිතව ගබඩා කිරීමට හැකියාව ලැබෙනු ඇත. 2022 වර්ෂයේ නිම කිරීමට බලාපොරොත්තු වන මෙම යෝජිත ගබඩා සංකීර්ණය ඉදි කිරීමේ 2021 වසර වන විට ප්‍රගතිය පහත දැක්වේ;

ස්ථානය	ඉදිකරනු ලබන 90'X36 ප්‍රමාණයේ ගබඩාහල් සංඛ්‍යාව		ඉදිකරනු ලබන භූගත ගබඩාහල් ප්‍රමාණය		අත්හිටුවන ලද ගබඩාහල් ප්‍රමාණය
	ඉලක්කය	නිම කළ	ඉලක්කය	නිම කළ	
පුනානි වෙඩිද්‍රව්‍ය ගබඩාහල් සංකීර්ණය	15	15	02		01 (භූගත)
ගජසිංහපුර වෙඩිද්‍රව්‍ය ගබඩාහල් සංකීර්ණය	10	5 +1 (භූගත)	02		05
අගුණුවැල්පැලැස්ස වෙඩිද්‍රව්‍ය ගබඩාහල් සංකීර්ණය	15	7	02	01	01 (භූගත)

වර්තමානය වන විට, පූනානි පතොරම් ගබඩා සංකීර්ණයේ මතුපිට පතොරම් ගබඩා 15ක ඉදිකිරීම් කටයුතු සතුටුදායක වන අතර, භූගත පතොරොම් ගබඩාව ඉදි කිරීමට බිම් සකසා ඇති අතර එක් භූගත පතොරොම් ගබඩාවක් අත් හිටුවා ඇත. ගජසිංහපුර වෙඩිද්‍රව්‍ය ගබඩාහල් සංකීර්ණයේ මතුපිට පතොරම් ගබඩා 5ක ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර මතුපිට පතොරම් ගබඩා 05ක් අත් හිටුවා ඇත. තවද, භූගත පතොරොම් ගබඩාව ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. අගුණුවැල්පැලැස්ස වෙඩිද්‍රව්‍ය ගබඩාහල් සංකීර්ණයේ මතුපිට පතොරම් ගබඩා 7ක ඉදිකිරීම් කටයුතු නිම කර ඇත. භූගත පතොරොම් ගබඩාවක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර එක් භූගත පතොරොම් ගබඩාවක් අත් හිටුවා ඇත.

ව්‍යාපෘති කාල සීමාව 2021.12.31 දක්වා මාස 29ක කාලයක් දීර්ඝ වී ඇතත්, එම කාලය ද අවසන් වී ඇති බැවින් ව්‍යාපෘතිය 2022 වර්ෂයට අවිච්ඡේද වී ඇත. 2021.12.31 වන දිනට සම්මුචිත වියදම රු.මි.1,146.3 කි. සම්මුචිත භෞතික ප්‍රගතිය 82.2%.

(5) <u>ජාතික ශිෂ්‍යාහට බලකායේ ප්‍රගතිය හා විශේෂ වැඩසටහන්</u>

අනු අංකය	වැඩසටහන/ ව්‍යාපෘතිය	31.12.2021 දිනට ප්‍රගතිය
01	ශිෂ්‍ය භටයින්ගේ පුහුණුව ශක්තිමත් කිරීම හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමත් ජාතික මට්ටමින් ගුණාත්මකව සංවර්ධනය සිදු කිරීම.	i. දැනට ක්‍රියාත්මක වන 1985 අංක 15 දරණ මිනිස් බල උපයෝගිතා හා පරිපූරක පනත යාවත්කාලීන කර නව පනතක් කෙටුම්පත් කර ඇත. ii ජාශිබ හි දැක්ම, අරමුණ, මෙහෙය, ජාතික මට්ටමින් ඉටු කිරීමට ප්‍රායෝගිකව අවශ්‍ය වන ලෙස අනුමත සංස්ථාව හා කාර්ය මණ්ඩල සංයුතිය අලුතින් සකසා අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. iii බණ්ඩ මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ශිෂ්‍යාහට කඳවුරු ගත කිරීමට බණ්ඩ 3589 ක් පමණ සුදානම් කර තිබුන ද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් කඳවුරු පැවැත්වීමට නොහැකි විය. iv. වසංගත තත්ත්වය හේතුවෙන් විකල්ප පුහුණු ක්‍රමවෙදයන් සම්පාදනය කරගනිමින් වරකදී අඩු ශිෂ්‍යාහට සංඛ්‍යාවක් සහභාගි වන පරිදි දුරස්ථභාවය තබා ගනිමින් පුහුණු කටයුතු සිදුකරන ලදි. v. මාර්ගගත ක්‍රමවෙදය Online Zoom තාක්ෂණය යොදා ගනිමින් දිවයින පුරා බලඇණි මට්ටමින් ශිෂ්‍යාහට විෂය නිර්දේශය ආවරණය වන පරිදි වැඩසටහන් දියත් කරන ලද අතර ශිෂ්‍යාබටයින් 149760 ක් පමණ සහභාගී වන ලදී.
02	දක්ෂයන් අතරින් දක්ෂයින් තෝරා ගැනීම සඳහා පළාත් මට්ටමින් කඳවුරු පැවැත්වීම.	ශිෂ්‍ය භටයින් සඳහා හඳුන්වා දෙන ලද ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ ප්‍රවිණතා සහතික මුද්‍රණය කර පිටපත් 3900ක් බලඇණි වෙත බෙදා දීමට ක්‍රියා කරන ලදි.
03	ශිෂ්‍ය භටයින් සඳහා ප්‍රවිණතා සහතිකයක් හඳුන්වා දීමට ක්‍රියා කිරීම.	ශිෂ්‍ය භටයින් සඳහා ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ ප්‍රවිණතා සහතිකයක් හඳුන්වා දීමට ක්‍රියා කරන ලදි.
04	විෂයමාලා සංවර්ධනය, ඉගෙනුම් යෙදවුම් සංවර්ධන සඳහා අවශ්‍ය පාඨමාලා විවිධාංගිකරණය කිරීම මගින් නව දැනුම ශිෂ්‍යාහටයා කිරීම මගින් නව දැනුම ශිෂ්‍යාහටයා වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉගෙනුම් යෙදවුම් සංවර්ධනය කිරීමට ක්‍රියා කිරීම.	සැලසුම් කර තිබූ අතර කොරෝනා වාතාවරණය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත.

05	ජාතික සැලැස්මක් අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම.	i. ඉදිකිරිම් හා නවිකරණ කටයුතු සඳහා රුපියල් 10,575,317.80 ක් වියදම් කර ඇත. ii. සැම පළාතක්ම ආවරණය වන පරිදි බළඇණි හා පළාත් මුලස්ථාන ස්ථාපනය කිරීම සඳහා ඉඩම් පිළිබදව සොයා බැලීමට දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශිය ලේකම්වරුන් සම්බන්ධතාවයෙන් සිදුකර යමින් පවතින අතර පහත සඳහන් ඉඩම් ජාතික ශිෂ්‍යභට බලකායට අත්පත් කරගෙන ඇත. අ. 5 ජාශිබ ආ. 7 ජාශිබ ඇ. 8 ජාශිබ ඈ. ර්32 ජාශිබ ඉ. දකුණු පළාත් මුලස්ථානය ඊ. වයඹ පළාත් මූලස්ථානය iii. 80'x20' ගොඩනැගිල්ලක් පුම රංටැඹෙ යුධ හමුදා ඉංජිනේරු සේවා අංශය මගින් ඉදි කරමින් පවති.
06	ශිෂ්‍ය භටයින්ගේ ඇඳුම්, පුහුණු උපකරණ අවශ්‍ය පරිදි සපයාදීම් පුහුණු මධ්‍යස්ථානයෙහි යටිතල පහසුකම් හා සේවා සැපයීම් වැඩි දියුණු කිරීමට ක්‍රියා කිරීම.	i. මේ සඳහා 2021.12.31 දිනෙන් අවසන් වන කාර්තුවට රුපියල් මිලියන 152,800 මුදලක් පුනරාවර්තන වියදම් ලෙස හා රු. මිලියන 13 ක මුදලක් ප්‍රාග්ධන වියදම් වශයෙන් අනුමත කර තිබුණි. ii. අන්තර්ජාල පහසුකම් දිවයින පුරා පිහිටි බලඇණි 38 සඳහා 2021 දෙසැම්බර් දක්වා ලබා දෙන ලදි. iii පළාත් මුලස්ථාන 09 හා බලඇණි 38 සඳහා පරිගණක හා තොරතුරු තාක්ෂණික උපකරණ බෙදා දෙන ලදි.
07	පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ විද්‍යා පීඨයක් දක්වා සංවර්ධනය කොට උසස් කිරීම හා ඊට අනුබද්ධ පුහුණු මධ්‍යස්ථාන පළාත් මට්ටමින් පිහිටුවීම.	පළාත් පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතුය.
08	ජාත්‍යන්තර ප්‍රජාව සමග සහ සම්බන්ධතා ඇතිකර ගැනීම අත්දැකීම් හා දැනුම හුවමාරුවට ඉවහල් වන විදේශ සංචාර ලබා දීම. විදේශ ශිෂ්‍යභටයින් මෙරටට ගෙන්වා ගැනීම	i. ඉන්දියන් සංචාරය (සැලසුම් කර තිබුණද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් සහභාගී නොවන ලදී) ii. නේපාල් සංචාරය (සැලසුම් කර තිබුණද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් සහභාගී නොවන ලදී) iii. පකිස්ථාන සංචාරය (සැලසුම් කර තිබුණද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් සහභාගී නොවන ලදී) iv. නේපාල සංචාරය (සැලසුම් කර තිබුණද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් සහභාගී නොවන ලදී) v. බංගලාදේශ සංචාරය (සැලසුම් කර තිබුණද වත්මන් කොරෝනා වාතාවරණය හේතුවෙන් සහභාගී නොවන ලදී)

- පැවති කොරෝනා වාතාවරණය හේතුවෙන් පාසැල් නොපැවැත්වීම නිසා 2021 වාර්ෂික සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

- බලඇණි 38 හා පළාත් මූලස්ථාන 09 ය සඳහා ප්‍රමාණවත් තරම් උපදේශකයින් නොමැති වීම.
- තූර්ය වාදක උපකරණවල පවතින ඌණතාවය හා තූර්යවාදක උපදේශකයින් නොමැති වීම.
- විකල්ප මාර්ගගත පුහුණු ක්‍රමවේද පවත්වාගෙන යාමේදී අන්තර්ජාල පහසුකම් හා පරිගණක උපකරණ ප්‍රමාණවත් තරම් නොමැති වීම හා සමහර ප්‍රදේශවල සංඥා දුර්වලතා පැවතීම.

<u>කෝවිඩ් 19 තත්ත්වය සඳහා ජාශීඛ බලඇණි වෙතින් දක්වන ලද දායකත්වය</u>

- කොවිඩ් නිවාරණ හා වැලකී සිටීමේ දැනුවත් කිරීමේ වැඩසටහන් දිවයින පුරා ශිෂ්‍ය භට කාණ්ඩ සඳහා සිදු කිරීම.
- කෝවිඩ් 19 එන්නත්කරනය සිදුකරන ප්‍රාදේශීය මධ්‍යස්ථානවල කටයුතු සාර්ථක කරගැනීම සඳහා නිලධාරින් හා උපදේශකයින් රාජ්‍ය නිලධාරීන් වෙත සහයෝගය ලබා දීම
- නාරම්මල, කුලියාපිටිය වැනි කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානවලට අවශ්‍යය උපකරණ සපයා දීම.

<u>මෙම වසරේ සිදුකල පුහුණු කටයුතු ව්‍යුහාත්මක වෙනස්කම්</u>

- වත්මන් වාතාවරණයට අනුව මාර්ග ගත ක්‍රමවේද උපයෝගී කරගනිමින් විෂය නිර්දේශ ආවරණය කිරීම හා සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරමින් ශිෂ්‍ය භට පුහුණුවීම් පැවැත්වීම.
- ශීෂ්‍යභට ඛණ්ඩ නැවත ලියාපදිංචි කිරීම/ලියාපදිංචි අංකයක් ලබා දීම හා බලපත්‍රයක් ලබා දීම.
- ශීෂ්‍යභටයින් සඳහා වර්ගීකරණය කරන ලද ශීෂ්‍යභට ප්‍රවීනතා අවසන් සහතිකය හඳුන්වා දීම.
- ආරක්ෂක ශීෂ්‍යභට/පොලිස් ශීෂ්‍යභට හා කණිෂ්ඨ ශීෂ්‍යභටයින් සඳහා ශීෂ්‍යභට මාර්ගෝපදේශය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු සිදුකරන ලදි.

ඇ. <u>බුද්ධි අංශවල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම</u>.

(1) ජාතික බුද්ධි ප්‍රධානී, රාජ්‍ය බුද්ධි සේවය, ත්‍රිවිධ හමුදාවල බුද්ධි අංශ යන සියල්ලෙහි සමස්ත සංවිධාන ව්‍යුහය යටතේ අනාවරණය කරගනු ලබන නොයෙකුත් තර්ජන හා තොරතුරු මත පදනම්ව ත්‍රස්තවාදය සහ වෙනත් ක්‍රියාකාරකම් වළක්වා ගැනීමෙන් ජාතික ආරක්ෂාව පවත්වා ගැනීමට බුද්ධි අංශවලට අවශ්‍ය මෙවළම් හා යාන්ත්‍රණය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

(2) නිසි හා ක්‍රමානුකූල පුහුණුව සහතික කිරීම තුළින් බුද්ධි අංශ ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. බුද්ධි මෙහෙයුම්වලට සම්බන්ධ පුද්ගලයින්ගේ දැනුම ඉහළ නංවන ගෝලීය දෘෂ්ටිකෝණයකින් ආගමික අන්තවාදය පිළිබඳ මෑත කාලීන වර්ධනයන් පිළිබඳ අවබෝධයක් ලබා දීමට කටයුතු ආරම්භ කර ඇත. 2021/2022 තුළ, රාජ්‍ය බුද්ධි සේවය තුළ අවුරුදු 5 කට වඩා පැරණි ලේඛන කළමනාකරණය සහ දත්ත ස්වයංක්‍රීයකරණ පද්ධතිය වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

මෙම ආයතන සිදු කරන ලද කටයුතුවලින් කිහිපයක් පහත දැක්වේ;

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථාන (ආගමික ස්ථාන/ජාතික වැදගත්කමකින් යුත් ස්ථාන) ආවරණය වන පරිදි බුද්ධි ඛණ්ඩ ස්ථානගත කිරීම.
- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පවතින හා එළඹිය හැකි තර්ජනයන් සැලකිල්ලට ගෙන බුද්ධි රාජකාරී සිදුකිරීම සඳහා පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි බුද්ධි ඒකක ස්ථානගත කිරීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව බුද්ධි නිලධාරින්/සෙසු නිළයින් තවදුරටත් බුද්ධි හා ක්ෂේත්‍ර පුහුණුවීම් වලට යොමු කිරීම.
- ඒකක/සමූහ සහ බණ්ඩ වෙත බුද්ධි රාජකාරී කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදුකරගැනීම සඳහා පරිගණක හා අනෙකුත් තාක්ෂණික උපාංග ලබාදීම හා නවීන තාක්ෂණයෙන් යුත් සන්නිවේදන උපකරණ ලබාදීම.
- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බුද්ධි අංශ නිලධාරීන් සහ නාවිකයින් සඳහා දේශීය/විදේශීය පුහුණුවන් සඳහා යොමු කර ඔවුන්ගේ දැනුම හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2021 වර්ෂය තුළදී නිලධාරීන් 07ක් සහ නාවිකයින් 18ක් අළුතින් බුද්ධි අංශය සඳහා බඳවා ගැනීම.
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඩ්‍රෝන යානා ගුවන් බුද්ධි අංශයට ලබා ගෙන ඇත.
- වෙරළ ආරක්ෂක බුද්ධි නාවිකයින්, තොරතුරුකරුවන්, සිවිල් පුද්ගලයින් සහ අධි තාක්ෂණික උපකරණ භාවිතයෙන් බුද්ධි තොරතුරු රැස් කිරීමට කටයුතු කරන ලදි.

ඇ. <u>ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීම</u>

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ විශේෂයෙන් සඳහන් කරන ලද කරුණක් වන්නේ රට වෙනුවෙන් දිවි පරදුවට තබා සටන් කළ ත්‍රිවිධ හමුදාවල සාමාජිකයින්ගේ ගෞරවය ආරක්ෂා කරන බවයි. වසර ගණනාවක් තිස්සේ ප්‍රමාද වූ ඔවුන්ගේ උසස්වීම්, දීමනා ආදිය නොපමාව ලබාදීම මගින් ඔවුන්ගේ චිත්ත ධෛර්යය තව දුරටත් ඉහළ නැංවීමට රජය විසින් කටයුතු කරනු ලබයි. එමඟින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම අරභයා ඔවුන්ගේ ඇති කැපවීම ඉහල තලයක පවත්වා ගෙන යෑම අභිප්‍රායයි.

(1) මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම

ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට වන්දි,වැටුප් හා දීමනා ගෙවීමට අදාලව අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය වෙතින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ විස්තර;

අ. “යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල හා ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත වූ හා මියගිය ත්‍රිවිධ හමුදා සහ ශ්‍රීලංකා පොලිසියේ සාමාජිකයින් සඳහා ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ගෙවන ලද වැටුප් හා දීමනා, මියගිය සාමාජිකයාගේ යැපෙන්නන් ජීවත්ව සිටින තෙක් සහ ආබාධිත සාමාජිකයා ජීවත්ව සිටින තෙක් ලබා දීම“ යන මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පත්කරන ලද අමාත්‍ය මණ්ඩල කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීමෙන් පසු අංක MOD/01/2021 හා 2021.05.18 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම යටතේ 787 කට සහන හිමිගන්වා ඇත.

ආ. “යුධමය වාතාවරණය පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්තක්‍රියා හේතුවෙන් ආබාධිතව සේවයෙන් ඉවත්වන ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයින් එම ආබාධිත බව හේතුවෙන්ම වයස අවුරුදු 55 එළඹීමට පෙර ජීවිතක්ෂයට පත් වුවහොත් එම මියගිය සාමාජිකයාගේ යැපෙන්නන්ට සාමාජිකයාගේ වයස අවුරුදු 55 වන තෙක් වැටුප් හා දීමනා

හිමිගැන්වීම“ යන මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා පත්කරන ලද අමාත්‍ය මණ්ඩල කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීම.

ඇ. “නීති විරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමේදී ඒ සඳහා දායක වන ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයින් දිරිගැන්වීම සඳහා ත්‍යාග මුදලක් ලබාදීම“ යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයන් ඉදිරිපත්කර ඒ සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ත්‍යාග ලබාදීමේ ක්‍රමවේදය සකස් කිරීමේ කටයුතු කමිටුවක් මඟින් සිදුකිරීම .

ඈ. “ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතු ඉංජිනේරු වෘත්තිකයන් හට වරලත් ඉංජිනේරු දීමනාව ලබාදීම “ යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.

ඉ. “ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතු වාස්තු විද්‍යාඥයින් හට දීමනා හිමිගැන්වීම“ යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- **<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පුද්ගලයින් හට වැටුප් හා දීමනා ගෙවීම</u>**

යුද්ධ හමුදාවෙහි 2021 ජනවාරි 01 දින දෙසැම්බර් 31 දින දක්වා මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම, ණය අයදුම්පත් ඉදිරිපත් කිරීම්, දෙමාපිය රු 750.00 හිමිගැන්වීම්, පාරිතෝෂික සහ දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධානපත්‍ර, යැපෙන්නන්ගේ දීමනා, මරණ පාරිතෝෂික, විශේෂ වන්දි හා වන්දි හිමිගැන්වීම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

<u>සේවයේ යෙදී සිටින නිලධාරීන් සහ සෙසුනිලයන් හට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම</u>

විස්තරය	නිත්‍ය	ස්වේච්ඡා	එකතුව
	රු.ශත	රු.ශත	රු.ශත
නිලධාරී	5,314,842,079.94	1,735,151,111.06	7,049,993,191.01
සෙසුනිල	81,228,272,407.95	42,765,714,995.05	123,993,987,403.00
එකතුව	**86,543,114,487.89**	**44,500,866,106.11**	**131,043,980,594.01**

<u>මියගිය/ආබාධිත නිලධාරීන් සහ සෙසු නිලයන් හට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම</u>

විස්තරය	නිත්‍ය	ස්වේච්ඡා	එකතුව
	රු.ශත	රු.ශත	රු.ශත
නිලධාරී	1,262,530,776.83	101,469,358.69	1,364,000,135.52
සෙසුනිල	28,606,345,173.09	3,852,774,254.61	32,459,119,427.70
එකතුව	**29,868,875,949.92**	**3,954,243,613.30**	**33,823,119,563.22**

<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම යටතේ ආපදා ණය ගෙවීම් හා රාජ්‍ය බැංකු මඟින් හිමිගන්වනු ලබන දේපල ණය</u>

විස්තරය	අයදුම්පත් සංඛ්‍යාව	ගෙවීම් කරන ලද සංඛ්‍යාව	හිමිගන්වන ලද මුදල **(රු.මි)**	ගෙවීමට ඇති අයදුම්පත් සංඛ්‍යාව	වෙනත්
ආපදා ණය	5,393	3,701	888.2	1,287	නිරීක්ෂණ සහිත අයදුම්පත් 405
දේපල ණය	180	-	-	-	බැංකුව මගින් ගෙවීම් කෙරේ
එකතුව	**5,573**	**3,701**	**888.2**	**1,287**	-

<u>යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වෙනුවෙන් රු.750.00 බැගින්වූ විශේෂ දීමනාව හිමිගැන්වීම</u>

විස්තරය	**සංඛ්‍යාව**	**මුදල (රු.මි)**
දෙමව්පියන්	146,390	1,317.72

<u>පාරිතෝෂික සහ දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම</u>

විස්තරය	අයදුම්පත් සංඛ්‍යාව	**මුදල (රු.මි)**
පරිවර්තිත පාරිතෝෂිකය	5,507	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම් කෙරේ
සේවා පාරිතෝෂිකය	506	
දුබලතා විශ්‍රාම වැටුප්	192	
එකතුව	**6,205**	

<u>වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධානපත්‍ර, යැපෙන්නන්ගේ දීමනා, මරණ පාරිතෝෂික,විශේෂ වන්දි හා වන්දි හිමිගැන්වීම</u>

විස්තරය	**අයදුම්පත් සංඛ්‍යාව**	**හිමිගන්වනු ලබන මුදල (රු.මි)**
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්	477	ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් ගෙවීම් කෙරේ
යැපෙන්නන්ගේ දීමනා	158	ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් ගෙවීම් කෙරේ
වැන්දඹු බිරිඳ විවාහවීමේදී වන්දි	08	34.35
වන්දි - හ.ච.නි 12/86	342	11.36
ස්ථාවර මාසික දීමනාව(ආබාධිත)	1,783	676.02
ස්ථාවර මාසික දීමනාව (වැහෑඅවිවැ)	689	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම් කෙරේ
එකතුව	**3,457**	**721.73**

- **<u>ශ්‍රී ලංකා නාවික හමුදාව පුද්ගලයින් හට වැටුප් හා දීමනා ගෙවීම</u>**



මූලික වැටුප නිත්‍ය	රු.16,501,182,174.50
මූලික වැටුප ස්වේච්ඡා	රු. 4,777,884,040.00
අනෙකුත් දීමනා නිත්‍ය	රු.16,881,319,294.57
අනෙකුත් දීමනා ස්වේච්ඡා	රු. 5,335,102,179.00
එකතුව	රු.43,495,487,688.07

සටහන : අනෙකුත් දීමනා අගය දැක්වීමේ දී 2021 දෙසැම්බර් මස නැවි 327 දීමනාවට අදාළ වටිනාකම (නිත්‍ය/ස්වේච්ඡා) 2022 ජනවාරි මස වේතනය සකස් කිරීමට පෙර ලබා දීමට නොහැකි බැවින් මාස 11ක පමණක් වටිනාකම දක්වා ඇත.

- **<u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව පුද්ගලයින්හට වැටුප් හා දීමනා ගෙවීම</u>**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමාලෝචිත කාල සීමාව තුළදී වැටුප් හා වේතන ගෙවීම් ආදිය ඇතුළත් පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් පරිපාලන සේවා සඳහා පහත පරිදි වියදම් කර ඇත.

වැටුප් හා දීමනා ගෙවීම

අනු අංකය	ශීර්ෂය	වියදම (ලං.රු .මි)
පුනරාවර්තන වියදම්		
1	වැටුප් හා වේතන	16,074.90
2	වෙනත් දීමනා	13,195.31

(2) ආබාධිත තත්ත්වයට පත්වූ සාමාජිකයින් හා මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම

2009.05.19 දිනට පෙර පැවති යුද්ධය හේතුවෙන් හා රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්වූ සාමාජිකයින් හා මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම සඳහා අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය විසින් පහත සඳහන් ආකාරයට කටයුතු කර ඇත.

අනු අංකය	කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව			
		යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
01.	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිත වූ අයවළුන් වෙත වැටුප් හා දීමනා /වන්දි ගෙවීම හා සේවයෙන් ඉවත්වීමට ඉඩ සලසා දීම	1,271	11	06	1,288
02.	ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී ඉදුරාම ත්‍රස්තවාදී නොවන වෙනත් හේතු මත මියගිය හා ආබාධිත රණවිරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම	57	10	03	70
03.	රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන, පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (iv) ප්‍රකාරව වයස අවුරුදු 55 දක්වා වැටුප් ගෙවීම	05	-	01	06

අනු අංකය	කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව			
		යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
04.	ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දුබලතාවයට පත්ව එකී දුබලතා ප්‍රතිශතය 50% ට වඩා අඩුවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/1982(305)(09) යටතේ ප්‍රතිලාභ නොලබා අදාළ සේවා කාලය සම්පූර්ණ කොට විශ්‍රාම ගොස් හෝ අස්ව සිටින ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන් වෙත හිඟ වැටුප් ගෙවීම	251	05	-	256
05.	ක්‍රියාන්විත ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්තක්‍රියා හේතුවෙන් හෝ ත්‍රස්තක්‍රියා මැඩපැවැත්වීම හේතුවෙන් හෝ ත්‍රස්තක්‍රියා මැඩපැවැත්වීම උදෙසා සිදුකරන ලද ක්‍රියා හේතුවෙන් මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා සහන සැලසීම	01	-	01	02
06.	රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන, පූර්ණ ආබාධිත වන හා මියයන රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 හා එහි සංශෝධනයන්ට අනුව වන්දි ගෙවීම	90	14	05	109
07.	යුද්ධයේ දී මිය ගිය සාමාජිකයින්ගේවයස අවුරුදු 26ට අඩු අවිවාහක රැකියා විරහිත අධ්‍යාපනය ලබන දරුවන්ට වැටුප් හා දීමනා ගෙවීම	43	06	-	49
08.	මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්ට වැටුප් හා දීමනා ගෙවීම	-	27	04	31
09.	මියගිය රණවිරුවන්ගේ වැන්දඹු බිරිඳ නැවත විවාහ වීමේදී විශේෂ වන්දි මුදල් හිමිගැන්වීම	09	-		09
10.	අංක MOD/01/2021 හා 2021.05.18 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර මාසික දීමනාව හිමිගැන්වීම	725	-	62	787
	එකතුව	**2,452**	**73**	**82**	**2,598**

(3) ත්‍රිවිධ හමුදා සුබසාධනය

හමුදා සාමාජිකයින්ගේ සුබසාධනය වෙනුවෙන් 2021 වර්ෂයෙදී පහත සඳහන් ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාව</u>;

- යුද්ධ හමුදා මූලික රෝහල (මහනුවර) දෙවන මට්ටමේ යුද්ධ හමුදා රෝහලක් ලෙස නඟාසිටුවීම සහ නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල වැඩි දියුණු කිරීම.

- කාලානුරූපීව ඇති වන විවිධ ගැටලු පිළිබඳව යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් ජනතාව දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍යයන්හි පලකිරීම් 2021 පෙබරවාරි මස සිට දෛනිකව සිදුකිරීම.

- යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දැනුම, යහපත් ආකල්ප වර්ධනය සහ පවුල් ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා දේශන/වැඩමුළු 23 ක් නිලධාරීන් 195 ක් සහ සෙසු නිලයින් 1,898 ක් සහභාගීත්වයෙන් පැවැත්වීම.

- කාලීන ගැටලු වලක්වා ගැනීම පිළිබඳ වීඩියෝ පට නිර්මාණය කර යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා බෙදාහැරීම.

<u>ශ්‍රී ලංකා නාවික හමුදාව</u>

- නාවික හමුදාවේ රාජකාරි සිදු කරනු ලබන නිලධාරීන් සහ නාවිකයින්ගේ මූල්‍ය පරිත්‍යාග වලින් රු. 12,000.00ක මුදලක් සුභ පැතීමේ ත්‍යාග මුදලක් ද, නාවික බිත්ති දින දර්ශනයක් සමඟ රු. 5,000.00ක් වටිනාකමකින් යුත් වියළි සළාක මල්ලක් ද රණවිරු වැන්දඹුවන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ලබා දීමට කටයුතු කරන ලදි.

- ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මිය ගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යක දී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු.100,000.00ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2021 අප්‍රේල් මස 23 වන දින සිට මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 41ක් දෙනෙකුගේ ළඟම ඥාතීන් හට මෙම අවමංගල්‍යාධාරය ලබා දී ඇත.

- මියගිය නිලධාරීන් හා නාවිකයින් වෙනුවෙන් 2021 වර්ෂය තුළ දී මරණ පරිත්‍යාග වශයෙන් රු. 33,200,709.00ක මුදලක් ලබා දෙන ලදි.

- 2021 වර්ෂය සඳහා ජාතික ගමනාගමන මණ්ඩලය විසින් ආබාධිත රණවිරු දුම්රිය බලපත්‍ර , ආබාධිත රණවිරු ගමන් බලපත්‍ර 75ක් නොමිලේ ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත.

- රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ක්‍රියාන්විතයේදී දිවි පිදූ, ආබාධිත වූ හා අතුරුදන් වූ නාවික පුද්ගලයින් වෙනුවෙන් 'මෙත් සෙවණ' නිවාස ව්‍යාපෘතිය සහ සේවයේ නියුතු හා විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙනුවෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පූර්ණ නිවාස 05ක් ද, අර්ධ නිවාස 90ක් ද, ආරක්ෂක ලේකම්තුමාගේ විශේෂ අනුමැතිය මත 'අපි වෙනුවෙන් අපි' අර්ධ නිවාස 02ක් ද වර්තමානය වන විට ඉදිකිරීම සඳහා අනුමත වී ඇත.

- නැවිරු සවිය (නාවික සුවසහන) අරමුදල මගින් 2021 ජනවාරි මස 01 සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා නාවික හමුදා සාමාජිකයන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ සහ සැත්කම් වෙනුවෙන් රු. 106,106, 328.77ක මුදලක් ලබා දී ඇත.

<u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව</u>

- සේවා පුද්ගලයන් සඳහා මරණාධාර දීමනාව ලෙස රු 50,000 ක දීමනාවක් ගෙවීම.

- ගුවන් හමුදා කදවුරු වෙත සුභසාධන පහසුකම් සැපයීම.

  i. සුභසාධන පහසුකම්, පුස්තකාල පොත් සහ උපකරණ හා විනෝදජනක පහසුකම් කදවුරු වෙත සැපයීම.
  ii. විනෝදජනක ක්‍රමවේද සැලසීම - සංගීත උපකරණ, ශබ්ද උපකරණ හා රූපවාහිනී ආදිය.
  iii. ගුවන් හමුදා පෙරපාසල් සඳහා සෙල්ලම් බඩු හා සංගීත භාණ්ඩ සැපයීම.

පහත ක්‍රමවේද හරහා ගුවන් හමුදා සමාජිකයින් සඳහා සුභසාධන පහසුකම් සැලසීම.

  i. සුභසාධන මණ්ඩල - මියගිය අයගේ ළඟම නෑයා සමග
  ii. සහනදායී මිලට පෙරපාසල් පහසුකම් සැලසීම.
  iii. නොමිලේ පාසල් පොත් ලබා දීම.
  iv. මියගිය පුද්ගලයන්ගේ ළඟම නෑයින් හමුවීම සහ තෑගි පාර්සල් ලබා දීම.
  v. මියගිය පුද්ගලයන්ගේ ළඟම ඥාතීන් සඳහා දින පොත් හා කැලැන්ඩර් සැපයීම.
  vi. ගුවන් හමුදා අවුරුදු පොළ සංවිධානය කිරීම.

(4) ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හා එම පවුල්වල ගැටළු සඳහා සහන ලබාදීම

සන්නද්ධ හමුදා පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විසින් සෘජුවම සහ ජනාධිපති ලේකම් කාර්යාලය, මහජන පෙත්සම් කාරක සභාව, ඔම්බුඩ්ස්මන් කාර්යාලය, අමාත්‍යාංශ උපදේශක කාරක සභාව, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය සේවයේ පරිපාලනමය වශයෙන් දේශපාලන පළිගැනීමට ලක් වූ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් හට සහන සලකා බැලීමේ කමිටුව, විවිධ මැති ඇමතිවරුන්, පුද්ගලයින් හා ආයතන විසින් ආරක්ෂක අංශය වෙත යොමු කළ ලිපි සඳහා කටයුතු කිරීමේ ප්‍රගතිය;

කාරණය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව		
	යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව
විවිධ පාර්ශවයන් වෙතින් ලද දුක්ගැනවිලි සඳහා වාර්තා කැඳවීම	825	62	55
විවිධ පාර්ශවයන් දැනුවත් කිරීම	356	48	41
විශ්‍රාම වැටුප් සම්බන්ධ දුක්ගැනිවිලි ලිපි වලට අදාළව කටයුතු කිරීම	186	14	12

(5) තීරුබදු අනුග්‍රහය යටතේ සන්නද්ධ හමුදා නිලධාරීන්ට වාහන බලපත්‍ර නිකුත් කිරීම

2021 වර්ෂයේ දී, අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය විසින් ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට තීරු බදු රහිත වාහන බලපත් ලබා දීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

නිලධාරි වර්ගය	බලපත්‍ර සංඛ්‍යාව
යුද්ධ හමුදාව	306
ගුවන් හමුදාව	46
නාවික හමුදාව	91
සිවිල් නිලධාරීන්	08
කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයීය කාර්ය මණ්ඩලය	26
එකතුව	**477**

(6) උසස්වීම් ලබා දීම

(අ) <u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිලධාරීන්</u>

අ.අ.	නිලය	උසස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව
01	බ්‍රිගේඩියර් සිට මේජර් ජෙනරල්	52
02	කර්නල් සිට බ්‍රිගේඩියර්	102
03	ලුතිනන් කර්නල් සිට කර්නල්	116
04	මේජර් සිට ලුතිනන් කර්නල්	96
05	කපිතාන් සිට මේජර්	32
06	කපිතාන් සිට මේජර්	442
07	ලුතිනන් සිට කපිතාන්	20
08	ලුතිනන් කපිතාන්	230
09	දෙවන ලුතිනන් සිට ලුතිනන්	382
එකතුව		**1472**

<u>සෙසු නිල</u>

අනු අංකය	නිලය	උසස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව
01	බලලත් නිලධාරී I	1189
02	බලලත් නිලධාරී II	2470
03	මාණ්ඩලික සැරයන්	3964
04	සැරයන්	5324
05	කෝප්‍රල්	7169
06	ලාන්ස් කෝප්‍රල්	8784
එකතුව		**28900**

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව

නිලධාරීන්

අනු අංකය	උසස් කරන ලද නිලය	උසස් කරන ලද ගණන
1	රියර් අද්මිරාල්	16
2	කොමදෝරු	23
3	කපිතාන්	34
4	කොමාණ්ඩර්	55
5	ලුතිනන් කොමාණ්ඩර්	195
6	ලුතිනන්	160
7	උප ලුතිනන්	93
8	වැඩ බලන උප ලුතිනන්	64
9	**මධ්‍ය නිලධාරි**	47
එකතුව		687

නාවිකයින්

අනු අංකය	උසස් කරන ලද තරාතිරම	උසස් කරන ලද ගණන
1	පාලක ප්‍රධාන සුළු නිලධාරි	226
2	සමූහ ප්‍රධාන සුළු නිලධාරි	321
3	ප්‍රධාන සුළු නිලධාරි	1020
4	සුළු නිලධාරි	1620
5	නායක නැවි	2766
6	බල නැවි	624
7	සාමාන්‍ය නැවි	546
එකතුව		7123

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව

2021 වර්ෂය තුල නිත්‍ය නිලධාරින්ගේ උසස්වීම් පිලිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිලධාරීන් සංඛ්‍යාව
01	ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට	02
02	තාවකාලික එයාර් වයිස් මාර්ෂල් නිලයට	05
03	ස්ථිර ගුවන් කොමදෝරු නිලයට	08
04	තාවකාලික ගුවන් කොමදෝරු නිලයට	13
05	ස්ථිර ගෘප් කපිතාන් නිලයට	29
06	තාවකාලික ගෘප් කපිතාන් නිලයට	23
07	ස්ථිර විංග් කමාන්ඩර් නිලයට	65
08	තාවකාලික විංග් කමාන්ඩර් නිලයට	83
09	ස්ථිර බලඝන නායක නිලයට	63
10	තාවකාලික බලඝන නායක නිලයට	50
11	පියාඹර ලුතිනන් නිලයට	61
12	පියාඹර නිලධාරී නිලයට	51
එකතුව		**453**

2021 වර්ෂය තුල ස්වේච්ඡා නිලධාරීන්ගේ උසස්වීම් පිලිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිලධාරීන් සංඛ්‍යාව
01	ස්ථිර විංග් කමාන්ඩර් නිලයට	01
02	තාවකාලික විංග් කමාන්ඩර් නිලයට	01
03	තාවකාලික බලඝන නායක නිලයට	01
04	පියාඹර නිලධාරී නිලයට	01
එකතුව		**04**

නිත්‍ය සහ ස්වේච්ඡා ගුවන්හට/ ගුවන්කාන්තා උසස්වීම්- 2021

2021 වර්ෂය තුල නිත්‍ය ගුවන් භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	**උසස්වීම් සංඛ්‍යාව**
ප්‍රධාන බලලත් නිලධාරී	93
ස්ථිර බලලත් නිලධාරී	194
වැඩබලන බලලත් නිලධාරී	434
ස්ථිර පියාඹර සැරයන්	465
වැඩබලන පියාඹර සැරයන්	**646**
ස්ථිර සැරයන්	**1,182**
වැඩබලන සැරයන්	**692**
ස්ථිර කෝප්‍රල්	**1,086**
වැඩබලන කෝප්‍රල්	**923**
එකතුව	**5,715**

2021 වර්ෂය තුල ස්වේච්ඡා ගුවන් භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	**උසස්වීම් සංඛ්‍යාව**
ප්‍රධාන බලලත් නිලධාරී	04
වැඩබලන බලලත් නිලධාරී	89
වැඩබලන පියාඹර සැරයන්	141
වැඩබලන සැරයන්	178
වැඩබලන කෝප්‍රල්	215
එකතුව	**627**

(ඈ) ජාතික ශිෂ්‍යභට බලකාය

2021 වසරේ සිදු කල නිල උසස්වීම් හා නිල ස්ථිර කිරීම්

විස්තරය	**සංඛ්‍යාව**
තාවකාලික මේජර් නිලයට උසස් කිරීම්	101
කපිතන් නිල ස්ථිර කිරීම්	85
තාවකාලික කපිතන් නිලයට උසස් කිරීම්	33
ලුතිනන් නිලයට උසස් කිරීම්	13

(7) පදක්කම් පිරිනැමීම

අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය විසින් ත්‍රිවිධ හමුදා පුද්ගලයින් වෙත පදක්කම් හා සන්දාර ප්‍රදානය කිරීම පහත දැක්වෙන පරිදි සංවිධානය කොට ඇත.

පදක්කම් වර්ගය	යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	එකතුව
උත්තම සේවා පදක්කම	1,219	448	370	2,037
සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම	3,863	665	3,037	7,565
දේශ පුත්‍ර සම්මානය හා සන්දාරය	560	3	-	563
විදේශ සේවා පදක්කම	-	57	110	167
පූර්ණ භූමි පදක්කම	-	1,857	-	1,857
නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම හා සන්දාරය	-	285	-	285
උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම හා සන්දාරය	-	1,002	-	1,002
එක්සත් ජාතීන්ගේ සාම සාධක පදක්කම	-		110	110
එකතුව	**5,642**	**4,317**	**3,627**	**13,586**

මෙම පදක්කම් හා සන්දාරයන්ට අමතරව, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත ජනාධිපති වර්ණ හා විශ්ව විද්‍යාලීය වර්ණ ප්‍රදානය කිරීමට අනුමැතිය ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

ඉ. <u>ආරක්ෂක නිශ්කාෂණ සැපයීම</u>

නිශ්චිත ද්‍රව්‍ය, භාණ්ඩ සහ සේවා පිළිබඳ ආරක්ෂක නිෂ්කාශන විමර්ශන පැවැත්වීම රට තුළ ඒවා භාවිතා කිරීමේ දී ජාතික ආරක්ෂාව අරබයා ඇති විය හැකි කිසියම් හෝ තර්ජනයක් වළක්වා ගැනීම සඳහා අනුගමනය කරන ප්‍රධාන මෙවලමකි.

(1). අමාත්‍යාංශයේ තාක්ෂණ අංශය මඟින් ලබාදෙන ආරක්ෂණ නිශ්කාශන

වසර 2021 දී තාක්ෂණ අංශය මඟින් කුළුණු 385 ක් ඉදිකිරීම සඳහා සන්නිවේදන සේවා සැපයුම්කරුවන්ට අවශ්‍යය ආරක්ෂණ නිශ්කාශන ලබාදෙන ලද අතර විද්‍යුත් /සන්නිවේදන උපාංගයන් 323 ක විකුණුම් බලපත්‍ර සඳහා ද ආරක්ෂණ නිශ්කාශන ලබා දෙන ලදී.



සන්නිවේදන සහ නාවික උපකරණ , රථවාහන නිශ්චය කරගැනීමේ පද්ධති, බහුකාර්ය වර්ණ මුද්‍රණ යන්ත්‍ර, ඩ්‍රෝන (Quad Copter, Airplane, UAV) අනාවරක , දුරස්ථ පාලක , සහ ආධුනික ගුවන් විදුලි බලපත්‍ර හිමියන්ට ගුවන් විදුලි උපකරණ (දේශීය/විදේශීය) සහ ජීපීඑස් ආනයනය කිරීම සඳහා ආරක්ෂක නිෂ්කාශන ලබා දී ඇත.



විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග එක්ව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ධීවර ට්‍රෝලර් යාත්‍රා 428 ක් සඳහා ගුවන් විදුලි සංඥා /සංඛ්‍යාත බෙදාදීම මත ආරක්ෂක නිෂ්කාශන ලබාදෙන ලදී.

(2). අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය මඟින් ලබාදෙන ආරක්ෂණ නිශ්කාශන

ගිනි අවි ආඥාපනත අමාත්‍යාංශයේ විධිවිධාන අනුව තුවක්කු බලපත්‍ර නිකුත් කිරීමේ බලපත්‍ර අධිකාරිය වේ. දිවයින තුළ ගිනි අවි නිකුත් කිරීම ප්‍රධාන වශයෙන් භෝග ආරක්ෂණය, ආත්මාරක්ෂාව/දේපල ආරක්ෂාව, ක්‍රීඩා, පුද්ගලික ආරක්ෂක ආයතන/රාජ්‍ය ආයතන සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ගිනි අවි භාවිතය යනාදී වශයෙන් කාණ්ඩ පහක් යටතේ සිදු කෙරේ. සිවිල් ආරක්ෂාව වෙනුවෙන් ගිනි අවි භාවිත කිරීමට බලපත්‍ර ලබාදීමේදී අමාත්‍යාංශය දැඩි පරීක්ෂණ ක්‍රියාවලියක් සහ ක්‍රියා පටිපාටියක් අනුගමනය කරයි.

තවද, 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ විධිවිධානවලට අනුව, අමාත්‍යාංශය පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා ලෙස කටයුතු කරන අතර, එම කටයුත්ත සඳහා දිවයින පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරුන් දස දෙනෙකු සහ එක් නියෝජ්‍ය පුපුරණ ද්‍රව්‍ය පාලකයෙක් අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇත. මේ යටතේ ගල්කොරි කර්මාන්තයේ, ගිනිකෙළි කර්මාන්තයේ සහ ගිනිපෙට්ටි කර්මාන්තයේ වාණිජ පුපුරණ ද්‍රව්‍ය භාවිතය සඳහා නිකුත් කර ඇති සියලුම බලපත්‍ර දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් සම්බන්ධ කර ගනිමින් පාලනය සහ අධීක්ෂණය සිදු කෙරේ. ඒ අනුව අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක අංශය විසින් ලබා දෙන ලද ආරක්ෂක නිශ්කාෂණ පහත දැක්වේ;

අනු අංකය	ක්‍රියාකාරකම	මුළු ගණන
1	**පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර / බලපත්‍ර නිකුත් කිරීම හා අනුමැතිය**	
	• පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදන බලපත්‍ර	9
	• පුපුරණ ද්‍රව්‍ය සපයන්නා බලපත්‍ර	101
	• පුපුරණ ද්‍රව්‍ය ආනයන බලපත්‍ර	25

	• ගිනි කෙළි භාණ්ඩ නිෂ්පාදන බලපත්‍ර	231
	• ගිනි කෙළි භාණ්ඩ සපයන්නා බලපත්‍ර	480
	• පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර	4,856
2	**අන්තරායකර බහාලුම් සහිත නැව් සඳහා අවසරපත්‍ර ලබාදීම.**	1,301
3	**ගිනිඅවි බලපත්‍ර**	
	• වගා ආරක්ෂාව/ සත්ව පාලනය සඳහා අවි ඉල්ලීම/ බලපත්‍ර ලබාදීම	218
	• අබලන් ගිනි අවි වෙනුවෙන් නව ගිනි අවි නිකුත් කිරීම	24
	• ගිනි අවි පැවරීම සඳහා ලද අයදුම්පත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම	75
	• දේපළ හා ජීවිත ආරක්ෂාව සඳහා -.38 හා මිමි 9 අවි ඉල්ලීම	88
	• .38 හා මිමි 9 අවි - බලපත්‍ර අලුත් කිරීම්	701
	• .38 හා මිමි 9 අවි පැවරීම්	2
	• ක්‍රීඩා කටයුතු සඳහා අවි ඉල්ලීම්	33
	• ක්‍රීඩා කටයුතු සඳහා නිකුත්කර ඇති ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම	438
	• නිදහස් ගිනි අවි බලපත්‍ර / අලුත් කිරීම් - මහජන නියෝජිතයින්	43
	• නිදහස් ගිනි අවි බලපත්‍ර / නව නිකුත් කිරීම් - මහජන නියෝජිතයින්	11
	• රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ආරක්ෂාව සඳහා ගිනි අවි ඉල්ලීම	27
	• රාජ්‍ය හා පෞද්ගලික බැංකු ආරක්ෂාව සඳහා ගිනි අවි ඉල්ලීම	7
4	**පෞද්ගලික ආයතනවල ආරක්ෂාව සඳහා ගිනි අවි ඉල්ලීම**	125
5	**අවි ගබඩා කිරීම හා ප්‍රවාහනයට අදාළ අනුමැතීන්**	
	• වානිජ නැව් කොළඹ වරායේ තාවකාලිකව අවි ගබඩා කිරීම	125
	• අවි රහිත නෙදර්ලන්ත ආරක්ෂකයින් යෙදවූ නැව් මෙහෙයුම්	9
	• ගොඩබිමින් අවි ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය	102
	• ගුවනින් අවි ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය	
	❖ අවි	56
	❖ පතරොම්	24,840
	• මුහුදු මාර්ගයෙන් අවි ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතිය	1,894
	• සමුද්‍රාරක්ෂක නිලධාරීන් නැව් නැගීම / බැසීම	7,575
	• නැව් තුල අවි සීල්කර තබාගැනීමට අනුමැතිය දීම	
	❖ වරායෙන් පිටත නැව් මෙහෙයුම්	477
	❖ වරාය ඇතුලත නැව් මෙහෙයුම්	56
	• සමුද්‍රාරක්ෂක නිලධාරීන් පුහුණු කිරීම්	428

ඊ. <u>මුහුදු සීමා උල්ලංඝනය කරමින් සිදුකරන නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැලැක්වීම</u>

1. කේරළ ගංජා ඇතුළු නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ වැටලීම් වේගවත් කිරීම, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සහ නීතිවිරෝධී ඖෂධ හා නොයෙකුත් භාණ්ඩ රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා ත්‍රිවිධ හමුදා, පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ සමඟ එකාබද්ධව ක්‍රියාත්මක විය . 2021 වසර තුල තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ගංජා, හෙරොයින්, අයිස් වැනි මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබෙන අතර ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ගොඩබිම, වෙරළ, නොගැඹුරු මුහුදු හා ගැඹුරු මුහුදේ නාවික සැතපුම් දහස් ගණනක් ඔබ්බට ගොස් සිදු කරන ලද වැටලීම්වල දී හෙරොයින්, අයිස්, කේරල ගංජා වැනි මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්නා ලදී. මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීමට හා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ගනුදෙනු කරුවන්ගේ තිප්පොළක් වීමේ තර්ජනය මුලිනුපුටා දැමීමත් යිවර කර්මාන්තය සහ නාවික කටයුතු සඳහා ආරක්ෂිත සමුද්‍රීය පරිසරයක් තහවුරු කිරීම අභිප්‍රායයි.

2. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාව ඇතුළු අනෙකුත් ආයතන ශ්‍රී ලංකා පොලිසිය හා වෙනත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන හා බද්ධව කටයුතු කරනු ලබයි. 2021 වසරේ දී සිදු කරන ලද කාර්යයන් පහත දැක්වේ;

ශ්‍රී ලංකා නාවික හමුදාව;

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා මුහුදු තීරයේ නිරීක්ෂණය වූ ඉන්දීය අනවසර ධීවර යාත්‍රා සංඛ්‍යාව 9,231ක් වන අතර ඒ අතරින් යාත්‍රා 736 ක් හඳුනාගෙන ඇති අතර එම යාත්‍රාවන් ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් එළවා දැමීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලදී.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2021 වසරේ ශ්‍රී ලංකා මුහුදු සීමාවේ මසුන් අල්ලමින් සිටියදී අත්අඩංගුවට ගත් ඉන්දීය ධීවර යාත්‍රා සංඛ්‍යාව 19ක් වන අතර පුද්ගලයින් 157 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

- රට තුළ ඇති සියලුම බුද්ධි අංශ සමග බුද්ධි තොරතුරු හුවමාරු කර ගනිමින් ඒකාබද්ධ මෙහෙයුම් සිදු කිරීම.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නෞකා මුර සංචාරයන් ප්‍රමාණයන් වැඩි කිරීම හා ශ්‍රී ලංකාවට ඇත මුහුදේදී පවා මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන දේශීය/විදේශීය යාත්‍රා අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම සහ 2021 වසර තුළදී පහත සඳහන් පරිදි මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන ඇත.

කේරල ගංජා	-	කි.ග්‍රෑ 7,142
ගංජා	-	කි.ග්‍රෑ 64
අයිස්	-	කි.ග්‍රෑ 158
අශීෂ්	-	කි.ග්‍රෑ 88
හෙරොයින්	-	කි.ග්‍රෑ 1,268

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව;

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ යාත්‍රා මගින් ශ්‍රී ලංකා මුහුදු සීමාවේදී අත්අඩංගුවට ගත් ඉන්දීය ධීවරයින් ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ඉන්දීය වෙරළාරක්ෂක බලකාය සමඟ එක්ව නැවත ඉන්දියාවට බාරදීමට කටයුතු කරන ලදී.

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී ධීවරයින් 05 දෙනෙකු සමඟ ඉන්දීය ධීවර බෝට්ටු 01ක් නැවත ඉන්දියාවට බාරදීමට කටයුතු කරන ලදී.

- 2021 වසරේදී නීතිවිරෝධී ලෙස විදේශ රටවලට මුහුදු මාර්ගයෙන් සංක්‍රමණය වීමට සූදානම් වූ පුද්ගලයින් 51 දෙනෙකු ශ්‍රීලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇත.

- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2021 දී වියළි කහ කැබලි කිලෝග්‍රෑම් 3,128 ක් අත්අඩංගුවට ගෙන ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සුරාබදු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ඒකක හා බුද්ධි ඛණ්ඩ වෙතින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය හා මත්පැන් සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම.

- අනෙකුත් ආරක්ෂක අංශයන් සමඟ වැටලීම් සිදුකරමින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතුවල නියැලීම.

- මත්ද්‍රව්‍ය හුවමාරු වන ස්ථාන හා පුද්ගලයින් ආවේක්ෂණයට ලක් කිරීම.

- මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ ආවේක්ෂණ කටයුතු සඳහා යුධ, ගුවන්, නාවික බුද්ධි අංශ සමඟ සැළසුම් සකස් කිරීම හා අත්අඩංගුවට ගැනීම් සඳහා සහාය ලබාදීම.

- යුද්ධ හමුදා සාමාජිකයින් මත්ද්‍රව්‍යය භාවිතයෙන් මුදවා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව නමින් කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කර 2021 අගෝස්තු මස 17 වන දින බෙදා හරින ලදී.

<u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව</u>

- ගුවන් මුහුදු ආවේක්ෂණ මෙහෙයුම් 67ක් හා පියාසර පැය 221 සහ මිනිත්තු 25ක් සිදු කිරීම මගින් 2021 වර්ෂය තුල ගුවන් හමුදාව විසින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට සහය වීම.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2021 වර්ෂය සඳහා අන්තරාදායක ඖෂධ භාවිතයට හුරු සේවා පුද්ගලයින් නිර්ණය කිරීම සඳහා පරීක්ෂණ 2,757 ක් සිදුකිරීම.එම පූර්ණ ක්‍රියාවලිය සඳහා වැය කරන ලද දළ මුදල රුපියල් 2,620,100.00.

- මානසික චිකිත්සකවරුන් විසින් මෙම වසර තුල ඉහත කී කරුණු සම්බන්ධව සේවා පුද්ගලයින් 1,600 ක් සහභාගි කරවා ගනිමින් දැනුවත් කිරීමේ වැඩමුලු පවත්වන ලදි.

3. මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව හා ශ්‍රීලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද පුහුණුවීම්

පුහුණු පාඨමාලා වර්ගය	**පාඨමාලා ගණන**
දේශීය පාඨමාලා	15
විදේශීය පාඨමාලා	04
එකතුව	19

<u>උ. අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව</u>

(1) සාමසාධක මෙහෙයුම් සඳහා සහභාගී වීම

2021 වසරේ දී ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් සාමසාධක රාජකාරියේ යෙදවීමේ විස්තර සංඛ්‍යාව පහත පරිදි වේ.

අනු අංකය	**මෙහෙයුම**	**රට**	**යුධ හමුදාව**		**ගුවන් හමුදාව**		**නාවික හමුදාව**	**එකතුව**
1.	UNHQ	ඇමෙරිකාව - නිව්යෝර්ක්	01	-	-	-		**01**
2.	UNIFIL	ලෙබනන්	-	125	-	-	01	**126**
3.	UNMISS	දකුණු සුඩානය	-	66	-	-	-	**66**
4.	MINUSCA	මධ්‍යම අප්‍රිකාව	-	-	03	110	-	**113**
5.	MINUSMA	මාලි	-	243	-	-	-	**243**
6.	MINUSRO	බටහිර සහරා	01	-	-	-	01	**02**
එකතුව			**02**	**434**	**03**	**110**	**02**	**652**

එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් ඒකක

අනු අංකය	මෙහෙයුම්	යුද්ධ හමුදාව	ගුවන් හමුදාව
1.	දකුණු සුඩානය (UNMISS)	01	-
2.	මධ්‍යම අප්‍රිකානු ජනරජය (MINUSCA)	-	01
3.	මාලි (MINUSMA)	01	-
4.	ලෙබනන් (UNIFIL)	01	-

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මධ්‍යම අප්‍රිකානු ජනරජය සහ දකුණු සුඩාන ජනරජය යන රටවල්හි එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් පිලිවෙලින් 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේදි ස්ථාපිත කරන ලදි. දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් 2021 අගෝස්තු මස 07 දින අවසන් කර ඇති අතර මධ්‍යම අප්‍රිකානු සාමසාධක මෙහෙයුම් තවදුරටත් ක්‍රියාත්මක වේ.

මෙම මෙහෙයුම්වල දී සිදු කරන කාර්ය භාරය වන්නේ සාමසාධක හමුදා භටයින් ප්‍රවාහනය කිරීම, ගුවන් නීරික්ෂණ කටයුතු, විමර්ශන සහ ජීවිත මුදාගැනීම්, තුවාලකරුවන් මුදවා ගැනීම හා ප්‍රවාහනය කිරීම, හා අධික්ෂණය කිරීම, සිවිල් පුද්ගලයින් ප්‍රවාහනය කිරීම, විශේෂ පුද්ගලයින් ප්‍රවාහනය කිරීම, භාණ්ඩ ප්‍රවාහනය කිරීම, හදිසි ස්ථානගත කිරීම හා ඉවත් කිරීම, ලිපි හා මුදල් රැගෙන යාම, ගුවනින් ගොඩබැස්සවීම, ගුවනින් රැගත කිරීම, ගුවන් පණිවුඩ හුවමාරුව, සටන් සෙවීම සහ මුදවා ගැනීම ආදී කටයුතුය.

සාමසාධක මෙහෙයුම් සඳහා අනුයුක්ත කර ඇති සේවා පුද්ගලයින් සංඛ්‍යාව සහ හෙලිකොප්ටර් සංඛ්‍යාව පහත පරිදි වේ.

රටේ නම	යොදවා ඇති සේවා පුද්ගලයින් සංඛ්‍යාව	යොදවා ඇති ගුවන්යානා ගණන
දකුණු සුඩානය	104	03
මධ්‍යම අප්‍රිකාව (මාණ්ඩලික නිළධාරීන් ඇතුළුව)	223	04

සමාලෝචිත කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	ලැබිය යුතු මුදල (ඇ.ඩො)	ලැබූ මුදල (ඇ.ඩො)
දකුණු සුඩානය		
පියාසර දීමනා	344,559.00	913,535.00
ප්‍රධාන උපකරණ දෛනික උපකරණ	-	358,890.23
මධ්‍යම අප්‍රිකානු ජනරජය		
පියාසර දීමනා	4,510,657.00	-
ප්‍රධාන උපකරණ දෛනික උපකරණ	710,190.90	236,730.30

සැ.යු - අවබෝධතා ගිවිසුමට අනුව මාසිකව මධ්‍යම අප්‍රිකාව සඳහා ප්‍රධාන උපකරණ සහ දෛනික උපකරණ සඳහා ඇ.ඩො 82,157.30 ක් ආදායම් වශයෙන් ලැබිය යුතු වේ. එමෙන්ම මෙම මුදල එක්සත් ජාතීන්ගේ කාර්තු තත්ව පරීක්ෂණ වලදී අනුකණ්ඩයේ ඇති භෞතික සහ මානව සම්පත් වල ප්‍රමාණය මත සහ තත්වය මත වෙනස් වන බැවින් අදායම් ලැබෙන තෙක් නිසි අගයක් මාසිකව ඉදිරිපත් කල නොහැක.

සමාලෝචිත කාල සීමාව තුලදී විදේශ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට අදාල පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පහත පරිදි වේ.

(1) 2021 වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන වියදම - ඇ.ඩො. 548,286.94
(2) 2021 වර්ෂය සඳහා මුළු අදාල පුනරාවර්තන වියදම - ඇ.ඩො 574.78

(2). ක්‍රමෝපායික වශයෙන් අවබෝධතා ගිවිසුම්වලට එළැඹීම

අනු අංකය	විස්තරය	ගිවිසුම් ගණන	අදාල රටවල්
01	01/01/2021 සිට 08/10/2021 දක්වා කාලය තුල වූ යෝජිත ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	14	ඉතාලිය,රෝමේනියාව,තායිලන්තය රුසියාව, එක්සත් රාජධානිය, ඉන්දියාව, මලයාසියාව, ඉරාකය
02	සාකච්ඡා මට්ටමේ පවතින ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	22	උස්බෙකිස්ථානය,චීනය, පාකිස්ථානය,එක්සත් රාජධානිය, ස්වීඩනය,ඉන්දියාව,මලයාසියාව, සිම්බාබ්වේ, කොරියා,ඇෆ්ගනිස්තානය,සොමාලියාව, ලෙබනනය,බංගලාදේශය
03	අදාල විදේශ රාජ්‍යයන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා යවන ලද සහ අවසන් නිගමනයකට එළඹෙන ලද ගිවිසුම් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලද ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	08	රුවන්ඩා,පාකිස්ථානය, රුසියාව, එක්සත් රාජධානිය, ඉන්දියාව
04	01/01/2021 සිට 31/12/2021 දක්වා කාලය තුළ අත්සන් කරන ලද ද්විපාර්ශ්වික, ත්‍රෛපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම් ගණන	02	චීනය , එක්සත් රාජධානිය

<u>කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සහ විශ්ව විද්‍යාල රෝහලේ අවබෝධතා ගිවිසුම්</u>

අනු අංකය	අවබෝධතා ගිවිසුම	අරමුණ	රට	අත්සන් කළ දිනය
01	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) හා කැනඩාවේ කැල්ගරි විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ (KDU) පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීම.	කැනඩාව	අවබෝධතා ගිවිසුමේ කෙටුම්පතට ලැබුණු නීතිපතිතුමාගේ නිරීක්ෂණ අනුව එය සංශෝධනය කර කැල්ගරි විශ්වවිද්‍යාලය වෙත යවන ලදී.ඉන් අනතුරුව ඔවුන් විසින් ද ගිවිසුමේ සංශෝධන කිහිපයක් යෝජනා කර එවා ඇති බැවින් , ඒ අනුසාරයෙන් ද සංශෝධන කරන ලද කෙටුම්පත නීතිපතිතුමාගේ නිෂ්කාශණයට 2022.01.18 දිනැතිව යවා ඇත.
02	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ ස්වීඩන්හි Kristianstad University අතර සහයෝගීතා ගිවිසුම	සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ශක්තිමත් භාවය හා නිපුණතාව වර්ධනය කිරීමේ අරමුණින් මෙය ආරම්භ කරන ලදී.	ස්වීඩන්	අදාළ පාර්ශවයන්ගේ නිරීක්ෂණ කැඳවා ඇත. සිහි කැඳවීම් ලිපි යැවීම සඳහා කටයුතු කරමින් පවතී

අනු අංකය	අවබෝධතා ගිවිසුම	අරමුණ	රට	අත්සන් කළ දිනය
03	BCS - තොරතුරු තාක්ෂණ වරලත් ආයතනය සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) අතර ආයතනික සාමාජිකත්ව ගිවිසුම	BCS - තොරතුරු තාක්ෂණ වරලත් ආයතනයෙහි සාමාජිකත්වය ලබාගැනීම හා එමඟින් KDUහි පරිගණක පීඨයෙහි කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය ප්‍රමිතීන් ඉහල නංවා ගැනීමට හා අදාල කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පීඨයෙහි දැක්ම වන පරිසණක හා තොරතුරු විද්‍යා අධ්‍යාපනය සඳහා ජාත්‍යන්තර පිළිගත් මධ්‍යස්ථානයක් ට පත්කර ගැනීම.	එක්සත් රාජධානිය	අංක අමප/21/1376/303/109 හා 2021.07.2 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අදාළ ගිවිසුම අත්සන් කර ඇත.
04	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) හා Transylvania විශ්වවිද්‍යාලය, රොමේනියා අතර ගිවිසුම	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ (KDU) පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීම	රොමේනියා	නීතිපති තුමාගේ නිරීක්ෂණ අනුව අදාළ ගිවිසුම සංශෝධනය කිරීම පිණිස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.
05	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සහ ආසියානු තොරතුරු තාක්ෂණ ආයතනය , තායිලන්තය අතර ගිවිසුම	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ (KDU) පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීම	තායිලන්තය	නීතිපති තුමාගේ නිරීක්ෂණ අනුව අදාළ ගිවිසුම සංශෝධනය කිරීම පිණිස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.
06	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) හා මලයාසියානු Putra University අතර ගිවිසුම	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ (KDU) පර්යේෂණ සංස්කෘතිය වැඩි දියුණු කිරීම	මලයාසියාව	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලැබී ඇත. ගිවිසුමට සම්බන්ධ නිරීක්ෂණයන් ලබා ගැනීම සඳහා ආරක්ෂක නීති උපදේශක වෙත ද ලිපියක් යොමු කර ඇත
07	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සහ ඉන්දුනීසියානු ආරක්ෂක විශ්වවිද්‍යාලය(IDU)අතර ගිවිසුම	ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර සබඳතාවය ශක්තිමත් කරමින් අධ්‍යාපනික හා උපාය මාර්ගික පර්යේෂණ, ආරක්ෂක හා සුරක්ෂිතතා අධ්‍යයනයට අදාළ ආයතනික සම්බන්ධතා සංවර්ධනය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර සහයෝගිතා රාමුවක් සැපයීමයි	ඉන්දුනීසියාව	අංක අමප 21/ 0585/303/ 053 හා 2021.03.23 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි අදාළ ගිවිසුම අත්සන් කර ඇත.

අනු අංකය	අවබෝධතා ගිවිසුම	අරමුණ	රට	අත්සන් කළ දිනය
08	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සහ කොරියානු Chungnam ජාතික විශ්වවිද්‍යාලය අතර ගිවිසුම	අධ්‍යාපනික හා විද්‍යාත්මක සහයෝගිතාවයේ සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම.	කොරියාව	නීතිපති තුමාගේ නිරීක්ෂණ අනුව අදාළ ගිවිසුම සංශෝධනය කිරීම පිණිස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.
09	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) සහ යුක්‍රේනයේ Yaroslav Mudryi ජාතික නීති විශ්වවිද්‍යාලය අතර ගිවිසුම	දෙරට අතර පවතින නීති අධ්‍යාපනය හා පර්යේෂණ ක්ෂේත්‍රයේ සබඳතා ශක්තිමත් කිරීම.	යුක්‍රේනය	නීතිපති තුමාගේ නිරීක්ෂණ අනුව අදාළ ගිවිසුම සංශෝධනය කිරීම පිණිස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇත.

(3). ජාතික ආරක්ෂක ගැටලු සම්බන්ධ විදේශ සම්බන්ධතා පැවැත්වීම

අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2021 ජුනි 22 වැනි දින මාර්ගත ක්‍රමයට 5 වැනි ඉන්දීය වෙරළ ආරක්ෂක බළකාය - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු ඉහළ පෙළේ රැස්වීම පැවැත්විය.

ආ. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ (UNODC) ගෝලීය සමුද්‍රීය අපරාධ වැඩසටහන සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් බටහිර අප්‍රිකානු රටවල් (ඝානාව සහ නයිජීරියාව) සඳහා පළමු පුහුණු මොඩියුලය මීරිස්සේදී ආරම්භ කිරීමට පහසුකම් සැලසිය.

ඇ. එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලයේ (UNODC) හි සහාය ඇතිව කලාපීය (බංගලාදේශ වෙරළ ආරක්ෂක බලකායේ 08 දෙනෙක්) සහ දේශීය නීතිය බලාත්මක කිරීමේ ආයතන සඳහා VBSS පාඨමාලාවක් පවත්වනු ලැබීය.

ඈ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ සහ බංග්ලාදේශ මුහුදේ මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුවීම පිළිබඳව සම්බන්ධීකරණ රැස්වීමක් පවත්වයි.

ඉ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නෞකා සුරක්ෂා මාලදිවයිනේ මාලේහි ‘DOSTI-XV’ අභ්‍යාසයට සහභාගී විය.

ඊ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සාමාජිකයින් සහ එක්සත් ජනපද ඉන්දු-පැසිෆික් විධානයේ (INDOPACOM) නියෝජිත පිරිසක් සමඟ ‘තෙල් සහ රසායනික කාන්දු ප්‍රතිචාරය’ පිළිබඳ සම්බන්ධීකරණ රැස්වීමක් සංවිධානය කරන ලදී.

උ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ආරක්ෂක පාලනය සඳහා වූ ආයතනය (ISG) සහ මොන්ටානා ජාතික ආරක්ෂක බලකාය (MTNG) විසින් සංවිධානය කරන ලද ඇමරිකා එක්සත් ජනපද රජයේ අනුග්‍රහය ලත් රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහනට (SSP) සහභාගී විය.

ඌ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළාරක්ෂක ගෝලීය සමුළුවේ (CGGS) 2 වන මාර්ගගත ක්‍රියාකාරී මට්ටමේ රැස්වීමට සහභාගී විය.

එ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව 17 වැනි ආසියානු වෙරළාරක්ෂක ආයතනයන්ගේ ප්‍රධානීන්ගේ (HACGAM) ඉහළ පෙළේ රැස්වීමට සහභාගී විය.

(4) විදේශ දූත මණ්ඩලවලට පත්කර ඇති ආරක්ෂක පරිවාරක නිලධාරීන් සම්බන්ධ කටයුතු

අ. පැවති තනතුරු සඳහා නැවත පත්කළ ආරක්ෂක පරිවාරක නිලධාරීන් සම්බන්ධ විස්තර.

රට	කලින් තනතුරු දැරූ නිලධාරීන්	නව පත් කිරීම්	කාල සීමාව
පකිස්ථානය	බ්‍රිගේඩියර් එස් ඒ කුලතුංග	බ්‍රිගේඩියර් එච් ඩී කේ හෙයියන්තුඩුව	වසර 02
එක්සත් ජාතීන්ගේ සංවිධානය	බ්‍රිගේඩියර් එම් ඩී යූ වී ගුණතිලක	මේජර් ජෙනරාල් ඩබ් එච් කේ එස් පීරිස්	වසර 02
ඔස්ට්‍රේලියාව	කැප්ටන් පී කේ වර්ණකුලසූරිය	කැප්ටන් එස් පී කත්‍රිආරච්චි	වසර 02
නව දිල්ලිය	කැප්ටන් එම් ටී එස් කරුණාතුංග	කැප්ටන් ආර් ජෝසප්	වසර 02
රුසියාව	ගෲප් කැප්ටන් යූ සී ජේ පියසේන	එයාර් කොමදෝරු එන් එච් ඩී එන් ඩයස්	වසර 02

ආ. 2021.01.01සිට 2021.09.30 දක්වා ආරක්ෂක පරිවාරක නිලධාරීන් සඳහා අනුමැතිය ලබා දී ඇති සංචාරයන් සම්බන්ධ විස්තර.

රට	නම	සංචාර සංඛ්‍යාව
ඇමෙරිකාව	එයාර් කොමදෝරු ආර් එස් වික්‍රමරත්න	06
රුසියාව	ගෲප් කැප්ටන් යූ සී ජේ පියසේන එයාර් කොමදෝරු එන් එච් ඩී එන් ඩයස්	02 03
නව දිල්ලිය	කැප්ටන් එම් ටී එස් කරුණාතුංග	05
පාකිස්තානය	බ්‍රිගේඩියර් එස් ඒ කුලතුංග බ්‍රිගේඩියර් එච් ඩී කේ හෙයියන්තුඩුව	01 01
ඉන්දුනීසියාව	කැප්ටන් එන් ආර් බී ජයසිංහ	01

ඌ. පර්යේෂණ හා පුහුණු කිරීම්

(1). අමාත්‍යාංශයේ ආරක්ෂක අංශය මඟින් ඉදිරිපත් කරන ලද 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාල සීමාව තුල ත්‍රිවිධ හමුදා, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයට අයත් ආයතන වල සාමාජිකයින් සහභාගි වූ පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ, අභ්‍යාස හා තරඟාවලි පිළිබඳ සංඛ්‍යාත්මක සාරාංශය පහතින් දැක්වේ;

විදේශ රාජ්‍යයන් මඟින් ප්‍රදානය කළ පුහුණු පාඨමාලා

රට	යුද්ධ	නාවික	ගුවන්	**එකතුව**
ඉන්දියාව	154	97	57	**308**
පකිස්තානය	98	05	5	**108**
බංගලාදේශය	51	01	15	**67**
නේපාලය	04	-	-	**04**
එකතුව	**307**	**103**	**77**	**487**

ජාතික ආරක්ෂක පාඨමාලා

පාඨමාලාව ලබා දෙනු ලබන රට	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	**එකතුව**
පකිස්තානය	03	01	01	**05**
ඉන්දියාව	02	-	01	**03**
බංගලාදේශය	01	01	01	**03**
පිලිපීනය	01	-	-	**01**
එක්සත් රාජධානිය	-	-	01	**01**
එකතුව	07	02	04	**13**

අණ හා මාණ්ඩලික පාඨමාලා

පාඨමාලාව ලබා දෙන රට	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	**එකතුව**
බංගලාදේශය	01	01	01	**03**
පකිස්තානය	03	01	05	**09**
නේපාලය	01	-	-	**01**
මැලේසියාව	01	-	-	**01**
ඉන්දියාව	03	02	02	**07**
සැම්බියාව	01	-	-	**01**
ඔස්ට්‍රේලියාව	01	-	-	**01**
ඇමරිකා එක්සත් ජනපදය	01	-	-	**01**
එක්සත් රාජධානිය	-	-	01	**01**
ඉන්දුනීසියාව	01	-	-	**01**
එකතුව	**13**	**04**	**09**	**26**

දිගුකාලීන විදේශ පුහුණු පාඨමාලා

පාඨමාලාව ලබා දෙන රට	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	**එකතුව**
ඇමරිකා එක්සත් ජනපදය	05	05	02	-	**12**
ඉන්දියාව	14	05	04	-	**23**
ඔස්ට්‍රේලියාව	-	-	01	-	**01**
ඉන්දුනීසියාව	02	01	01	-	**04**

එක්සත් රාජධානිය	02	01	-	-	**03**
වෙනත් රටවල්	09	04	-	**40**	**53**
එකතුව	**32**	**16**	**08**	**40**	**96**

සම්මන්ත්‍රණ හා වැඩමුළු

හමුදාවේ නම	යුධ	නාවික	ගුවන්	වෙරළාරක්ෂක	**එකතුව**
වැඩමුළු, සම්මන්ත්‍රණ, අභ්‍යාස හා තරඟාවලි	96	44	09		**154**
මාර්ගගත ක්‍රමයට පැවැති වැඩමුළු, සම්මන්ත්‍රණ	02	16	01	05	**21**
එකතුව	**63**	**41**	**09**	**05**	**118**

පුහුණු පාඨමාලා (ලැයිස්තු ගත නොවන පාඨමාලා)

පාඨමාලාව ලබා දෙන රට	පාඨමාලා වර්ගය	**යුධ**	**නාවික**	**ගුවන්**	වෙරළාරක්ෂක	වෙනත් ආයතන	**එකතුව**
ඇමරිකා එක්සත් ජනපදය	නේවාසික පාඨමාලා	16	24	32	02	-	**74**
	මාර්ගගත ක්‍රමයට පැවැති පාඨමාලා	26	19	16	01	09	**71**
එක්සත් රාජධානිය	නේවාසික පාඨමාලා	34*	12*	16*	-	01*	**63**
ස්විස්ටර්ලන්තය	නේවාසික පාඨමාලා	03	01	-	-	-	**04**
එකතුව		79	56	64	03	10	**212**

මෙම පාඨමාලා අතුරින් පාඨමාලා 45 ක් විදේශ ආයතන හා සම්පත් දායකයන්ගේ මෙහෙයවීමෙන් දේශීයව පවත්වා ඇත.

විදේශීය සංචාර

යුධ	**නාවික**	**ගුවන්**	**එකතුව**
17	125	13	**155**

(2). 2021 වසරේදී ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් පැවැත්වූ වැඩසටහන්.

ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි දිවයින පුරා ජාතික ශිෂ්‍යභට බලකායේ බලඇණි 38 ක් ස්ථාපිත කර වාර්ෂිකව ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ බාලක බාලිකා බණ්ඩ 3,589 ක් පුහුණු කළ අතර, ඒ හරහා ශිෂ්‍යභටයින් 119,225 ක් ශිෂ්‍යභට බලකායේ නිලධාරීන් නිලධාරිණීන් විසින් වාර්ෂිකව පුහුණු කරනු ලබයි.

මෙයට අමතරව ශිෂ්‍යභට බලකායට බැඳී කටයුතු කරන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභටයන්ට ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය, මාලදිවයින හා නේපාලය යන සාර්ක් රටවල පැවැත්වෙන ජනරජ දින, ජයග්‍රාහී දින, විශේෂ කඳවුරු හා විශේෂ පාගමන් සඳහා සහභාගී වීමට

අවස්ථාවක් උදාවේ. එම සංචරයන් සඳහා වන සියළු වියදම් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් දරන අතර, අනෙක් අතට එම රටවල ශිෂ්‍යභටයින්ටද හර්මන්ලෝස් හා ශිෂ්‍යභට උසස් පාඨමාලාවට සහභාගි වී ශ්‍රී ලාංකීය ශිෂ්‍යභටයන්ගේ දැනුම හා අදහස් හුවමාරු කර ගැනීමට තරුණ හුවමාරු වැඩසටහන යටතේ හැකියාව ලැබී ඇත.

පුහුණු පාඨමාලාවන්

පාඨමාලාව	කාල සීමාව		නිලධාරි	සෙසුනිල	ශිෂ්‍යභට
	සිට	දක්වා			
තරුණ නිලධාරි පාඨමාලාව 1	2021.03.01	2021.03.14	34		
නිලධාරි ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 1	2021.03.21	2021.03.27	36		
නිලධාරි බැහැරගත අභ්‍යාස පාඨමාලාව	2021.04.01	2021.04.05	36		
නිලධාරි පුහුණු ඉංග්‍රීසි පාඨමාලාව 11	2021.04.19	2021.04.25	36		
තූර්යවාදන විෂය මාලාව දැනුවත් කිරීම පළාත් මට්ටමින් සිදු කිරීම	2021.03.01	2021.04.10	185	100	683
2021 වසරට අදාල ශිෂ්‍යභට ජ්‍යොකොනොනි නිල උසස් කිරීම් සිදු කිරීම	2021.03.24 සිට ක්‍රියාත්මක වන පරිදි	2021.12.31			158
වසංගත තත්වයෙන් පීඩා විඳින ශිෂ්‍යභට පවුල් හදුනාගෙන වියලි ආහාර මළු බෙදාදීම.	2021.06.06	2021.06.22	15	26	42
පුහුණුවීම් භාර නිලධාරි / නිකාම උපදේශක පුහුණු පාඨමාලාව	2021.12.03	2021.12.09	22	105	
නිලධාරි නිළ උසස්වීම් පරීක්ෂණය	2021.12.013	2021.12.22	270		
ශිෂ්‍යභට විෂය මාලාව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය online ක්‍රමය ඔස්සේ zoom meeting හරහා සහභාගීත්වය	2021.06.06	2021.11.30	5319	642	149760

(3) ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය විසින් කරන ලද පුහුණු කිරීම්

අ. <u>දමිළ භාෂා පුහුණු පාඨමාලා-</u> ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සහ සෙසු නිලයන් හට දමිළ භාෂා පුහුණු පාඨමාලාව පැවැත්වීම තුළින් දමිළ භාෂාමය දැනුම නිපුණත්වය අපේක්ෂා කෙරේ. එමෙන්ම, දමිළ භාෂාව පමණක් භාවිතා කරන ජනතාව වාසය කරන ප්‍රදේශයන්හි එම ජනතාවගේ අදහස් හුවමාරුව, විශ්වාසය සහ අවබෝධය සඳහා භාෂාමය දැනුම වර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. මූලික දමිළ භාෂා පුහුණු පාඨමාලාව හා දමිළ උපදේශක පාඨමාලාව පවත්වන කාලසීමාව වැඩ කරන දින 100 ක් වන අතර, පාඨමාලාවට සහභාගී වන නිලධාරී/ සෙසු නිලයින් ප්‍රමාණය 80 කි.

<u>දමිළ භාෂා පුහුණු පාඨමාලා අංක - 100 (2020.08.25 - 2021.03.04)</u>

යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	පොලිස් විශේෂ කාර්ය බලකාය	එකතුව
02 x 57	02 x 20	01 x 16	00 x 08	05 x 101

දමිළ භාෂා පුහුණු පාඨමාලා අංක 100 ප්‍රතිඵල

පාඨමාලාව	ප්‍රතිඵල				
දමිළ භාෂා පුහුණු පාඨමාලාව	90 -100	75 - 89.9	55 - 79.9	40 - 54.9	0 - 39.9
	4.7%	52%	35%	7.5%	0.8%

ආ. මූලික දමිළ භාෂා පුහුණු පාඨමාලාව

ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සහ සෙසු නිලයන් හට දමිළ භාෂාව පිළිබඳව මූලික දැනුමක් ලබාදීම එම පාඨමාලාවේ අපේක්ෂිත අරමුණ වේ.

භාෂා පුහුණු පාඨමාලා අංක - 101 (2021.05.03 - 2021.11.26)

යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	පොලිස් විශේෂ කාර්ය බලකාය	එකතුව
02 x 48	01 x 18	00 x 14	01 x 04	04 x 84

දමිළ භාෂා පුහුණු පාඨමාලා අංක 101 ප්‍රතිඵල

පාඨමාලාව	ප්‍රතිඵල						
දමිළ භාෂා පුහුණු පාඨමාලාව	90 -100	80 - 89.9	70 - 79.9	60 - 69.9	50 - 59.9	40 - 49.9	0 - 39.9
	7.9%	28.4%	14.7%	10.2%	19.3%	13.6%	5.6%

ඇ. දමිළ භාෂා උපදේශක පාඨමාලාව

මූලික දමිළ භාෂා පුහුණු පාඨමාලාවන්හි විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගන්නා ලද අයවළුන් සඳහා දමිළ භාෂා උපදේශක පාඨමාලාව පවත්වන අතර, එමගින් භාෂාමය දනුම ප්‍රගුණ කිරීම, උපදේශක හැකියාව වර්ධනය කර ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ දමිළ භාෂා උපදේශකයෙකු වශයෙන් යෙදවීමට අපේක්ෂා කෙරේ.

ඈ. මූලික ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව

ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ සෙසු නිලයින් හට ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මූලික දැනුමක් ලබාදීම මගින් එතෙර පාඨමාලාවන් සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන් යටතේ විදේශීය රටවල් වල සේවය කිරීමට අවශ්‍ය භාෂාමය දැනුම ලබාදීම පාඨමාලාවේ අපේක්ෂිත අරමුණ වේ. ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව පවත්වන කාලසීමාව වැඩ කරන දින 80 ක් වන අතර, පාඨමාලාවට සහභාගී වන සෙසු නිලයින් ප්‍රමාණය 50 කි.

ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා අංක - 09 (2020.08.26 - 2021.01.19)

යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	ශ්‍රී ලංකා පොලිසිය	පොලිස් විශේෂ කාර්ය බලකාය	එකතුව
39	06	06	01	03	55

ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා අංක 09 ප්‍රතිඵල

පාඨමාලාව	ප්‍රතිඵල			
ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	80 -100	70 - 79.9	60 - 69.9	50 - 59.9
	5.4%	43.6%	38.1%	12.7%

ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා අංක - 10 (2021.02.03 - 2021.07.14)

අංක 10 ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවේ ප්‍රතිඵල

පාඨමාලාව	**ප්‍රතිඵල**				
ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	80 - 100	70 - 79.9	60 - 69.9	50 - 59.9	40 - 49.9
	16.2%	37.2%	18.6%	13.9%	13.9%

ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා අංක - 11 (2021.08.03 - 2021.12.17)

යුද්ධ හමුදාව	**නාවික හමුදාව**	**ගුවන් හමුදාව**	**ශ්‍රී ලංකා පොලිසිය**	**පොලිස් විශේෂ කාර්ය බලකාය**	**එකතුව**
22	05	06	05	02	40

ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවේ ප්‍රතිඵල

පාඨමාලාව	**ප්‍රතිඵල**				
ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව	80 - 100	70 - 79.9	60 - 69.9	50 - 59.9	40 - 49.9
	40%	40%	7.5%	5%	7.5%

ඉ. මූලික ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව

ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ට සහ සෙසු නිලයින් හට ප්‍රංශ භාෂාව පිළිබඳ මූලික දැනුමක් ලබාදීම මඟින් එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන්වල විදේශයන්හි යටතේ සේවය කිරීමට අවශ්‍ය භාෂාමය දැනුම ලබාදීම තුලින් රාජකාරී පහසු කිරීම පාඨමාලවේ අපේක්ෂිත අරමුණ වේ. මූලික ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව කාලසීමාව වැඩ කරන දින 80 ක් වන අතර, පාඨමාලාවට සහභාගි වන නිලධාරීන් හා සෙසු නිලයන් ප්‍රමාණය 50 කි.

ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලා අංක 07 (2021.01.25 – 2021.07.14)

යුද්ධ හමුදාව	**නාවික හමුදාව**	**ගුවන් හමුදාව**	**ශ්‍රී ලංකා පොලිසිය**	**පොලිස් විශේෂ කාර්ය බලකාය**	**එකතුව**
00 x 09	00 x 00	00 x 04	01 x 03	00 x 00	01 x 16

ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලා අංක 07 ප්‍රතිඵල

පාඨමාලාව	**ප්‍රතිඵල**				
ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	80 - 100	70 - 79.9	60 - 69.9	50 - 59.9	40 - 49.9
	41.1%	29.4%	5.8%	17.6%	5.8%

ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලා අංක - 08 (2021.08.03 2021.12.17)

යුද්ධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	ශ්‍රී ලංකා පොලිසිය	පොලිස් විශේෂ කාර්ය බලකාය	එකතුව
00 x 05	00 x 00	02 x 04	01 x 00	02 x 00	05 x 09

අංක 08 ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාවේ ප්‍රතිඵල

පාඨමාලාව	ප්‍රතිඵල	
ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	80 - 100	70 - 79.9
	92.8%	7.1%

(4) **ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය විසින් කරන ලද පුහුණු කිරීම්**

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ එම පාඨමාලාව අධ්‍යයන වාර 4 කින් සමන්විත වන අතර පළමුවන වාරය 2021 ජනවාරි මස 11 දින සිට 2021 අප්‍රේල් මස 09 වන දින දක්වා සති 12 ක කාලයක් තුල ත්‍රිවිධ හමුදාවන් හි විවිධ අංශ, සංග්‍රාමික සේවා ආධාර, අණ දීම, අණ දීමේ සහය සහ තීරණ ගැනීම, යුධෝපාය, ක්‍රියාන්විත හා සටන් , බුද්ධි හා මාණ්ඩලික රාජකාරි, ප්‍රධාන හා හට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි, යුද්ධ ක්‍රියාන්විත අධියර, පර්යේෂණ ක්‍රමවේදයන් සහ ශ්‍රී ලාංකික අධ්‍යයන යන විෂය පද්ධතින් හදාරන ලදි.

<u>ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ පලමු වාරයේ සිට හතරවන වාරය දක්වා අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය</u>

		පළමු අධ්‍යයන වාරය					දෙවන අධ්‍යයන වාරය				
		අති දක්ෂ >80%	ඉතා හොඳයි 70 - 80%	හොඳයි 50 - 70%	සාමාන්‍යයි 40 - 50%	සාමාන්‍ය පහල <40%	අති දක්ෂ >80%	ඉතා හොඳයි 70 - 80%	හොඳයි 50 - 70%	සාමාන්‍යයි 40 - 50%	සාමාන්‍ය පහල <40%
1	අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	8.61%	21.13%	53.81%	11.30%	5.15%	13.31%	28.43%	36.45%	15.51%	6.30%
2	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	100%					100%				

		තුන්වන අධ්‍යයන වාරය					හතරවන අධ්‍යයන වාරය				
		>80% අති උසස්	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහළ	>80% අති උසස්	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහළ
1.	අණ හා මාණ්ඩලික රාජකාරී පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	7.63%	31.54 %	57.84%	2.59%	0.38%	5.59 %	27.02 %	56.59 %	9.07%	1.73%
2.	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	100%					82.75%				

<u>මාණ්ඩලික පාඨමාලාවට ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහභාගි වීම</u>

	2020	**2021**
මාණ්ඩලික පාඨමාලාව සමත්වීම	**148**	**145**
ආරක්ෂක විද්‍යාවේදී **MSc (Defence Studies)** හිමිගැන්වීම	**127**	**120**
දේශීය සහ විදේශීය ශිෂ්‍ය සහභාගිත්වය	දේශීය **132** දේශීය **18**	**127** **18**
පුස්තකාල පහසුකම් සංවර්ධනය වීම		13,072

<u>පාඨමාලාවේ ප්‍රගතිය</u> - 2021 අධ්‍යයන වර්ෂයේ පවත්වන ලද පාඨමාලා අංක 15 හි ශිෂ්‍ය නිලධාරීන් 145 ක් වූ අතර යුද හමුදාවේ නිලධාරීන් 76 ක්ද, නාවික හමුදාවේ නිලධාරීන් 25 ක්ද, ගුවන් හමුදාවේ නිලධාරීන් 26 ක් සහ විදේශ රටවල් 10 ක් නියෝජනය කරමින් නිලධාරීන් 18 දෙනෙකු ද අයත් විය. ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ විදේශීය නිලධාරීන් පාඨමාලාව ඉතා සාර්ථකව හදාරා සමත්වීමෙන් පසු "පීඑස්සී" (psc) යන සුදුසුකම් ලබා ගැනීමට හැකිවිය. ඒ අනුව මෙම පාඨමාලාවේ සමත්වීමේ ප්‍රතිශතය 99.36% ක් වන අතර, 75.8% ක ප්‍රමාණයක් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිරිනමන MSc (Defence Studies) උපාධිය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. මෙම පාඨමාලාවේ උපාධි ප්‍රධානෝත්සවය 2021.12.11 දින ගරු ආරක්ෂක ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් නෙලුම් පොකුණ මහින්ද රාජපක්ෂ රගහලේදී පැවැත්විණි.



පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍ය නිලධාරියා ගරු ආරක්ෂක ලේකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



පාඨමාලාවේ හොඳම සේනාවිධායක සමීක්ෂණ නිබන්ධනය ඉදිරිපත් කල ශිෂ්‍ය නිලධාරියා ගරු ආරක්ෂක ලේකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.

(5). ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් කරන ලද පුහුණු කිරීම්

ත්‍රිවිධ හමුදාවට ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා විකාශනය වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය මේ වන විට උපාධි හා පශ්චාත් උපාධි යන දෙඅංශයෙන්ම උපාධි පිරිනමන පීඨ නවයකින් සමන්විත අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පරිණත වී ඇත. 2021 දී ද එහි කැපී පෙනෙන වර්ධනයන් දක්නට ඇත.

අ. නව පීඨ/ ඒකක පිහිටුවීම

- **<u>තාක්ෂණ පීඨය</u>**- 2021 පෙබරවාරි මස පැවති විශ්වවිද්‍යාලයෙහි කළමණාකරණ මණ්ඩල රැස්වීමෙහි අනුමැතිය යටතේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි තාක්ෂණ පීඨය පිහිටුවා ඇත. පුළුල් කාර්මික නිරාවරණයක් සහ විශය පිළිබඳ මනා දැනුමක් සහිත උපාධිධාරීන් බිහිකිරීම <u>පීඨයෙහි ප්‍රධාන අරමුණ වේ</u>. වර්තමානයෙහි තාක්ෂණ පීඨය දෙපාර්තමේන්තු දෙකකින් සමන්විත වන අතර ඒවා ඉංජිනේරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හා ජෛව පද්ධති තාක්ෂණ දෙපාර්තමේන්තුව වේ.

- **<u>අපරාධ යුක්ති පීඨය</u> -** අපරාධ යුක්ති පීඨය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි ලාබාලතම පීඨයන්ගෙන් එකක් වන අතර එය 2021 වර්ෂයේදී පිහිටුවන ලදී. අපරාධ යුක්තිය පිළිබඳව පුළුල් ක්ෂේත්‍රයන් යටතේ උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකාවේ රජයේ සහ පෞද්ගලික විශ්වවිද්‍යාලයන්හි පිහිටුවන ලද ප්‍රථම අපරාධ යුක්ති පීඨය මෙයයි. අපරාධවේදය පිළිබඳ දෙපාර්තමේන්තුව සහ පොලිස් විද්‍යාව පිළිබඳ දෙපරේතමේන්තුව යන දෙපාර්තමේන්තු දෙකෙන් අපරාධ යුක්ති පීඨය සමන්විත වේ.

- **<u>ආපදා කළමණාකරණය සඳහා වූ මධ්‍යස්ථානය</u> -** ආපදා කළමාණාකරණ ක්ෂේත්‍රයෙහි වෘත්තීයවේදීන් මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාවයෙන් විශ්වවිද්‍යාලය තුල ආපදා කළමණාකරන පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමෙහි අරමුනින් යුතුව පිහිටුවන ලදී.

ආ. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයෙහි වර්ධනය

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයෙහි සමස්ථ බඳවාගැනීම්හි වර්ධනයක් පෙන්නුම් කර ඇත.

අනු අංකය	කාර්යමණ්ඩල කාණ්ඩය	පත්කිරීම්		විශ්‍රාමයාම්		සේවයෙන් ඉවත් වීම්		සේවය අත්හැරයාම්		උසස්වීම්		කොන්ත්‍රාත් කාලය අවසන් වීම්	
		2020	2021	2020	2021	2020	2021	2020	2021	2020	2021	2020	2021
1	අධ්‍යයන	40	81	00	02	07	11	01	00	44	34	02	04
2	පරිපාලන	06	16	00	00	03	02	00	00	02	01	00	01
3	අධ්‍යයන සහායක	72	48	00	00	27	08	00	00	03	01	06	09
4	ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි	57	30	02	02	01	06	00	00	00	41	00	00
5	සුළු ශ්‍රේණි	08	16	09	02	01	02	00	02	20	20	00	00
එකතුව		**181**	**191**	**11**	**06**	**39**	**29**	**01**	**02**	**69**	**97**	**08**	**14**

ඇ. 2020 හා 2021 වර්ෂයන්හි සිසුන් බඳවා ගැනීම සංසන්දනය (පීඨ අනුව)

අනු අංකය	පීඨය	කැඩෙට් නිළධාරීන්		අනේවාසික සිසුන්		විදෙස් සිසුන්	
		2020	**2021**	**2020**	**2021**	**2020**	**2021**
1	ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය	20	31	29	32	-	2
2	වෛද්‍ය පීඨය	80	79	-	87	42	51
3	ඉංජිනේරු පීඨය	59	27	162	101	9	8
4	නීති පීඨය	7	1	118	122	2	2
5	කළමණාකරන, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	80	56	174	110	-	-
6	පරිගණක පීඨය	13	6	196	125	4	4
7	නිර්මිත පරිසර හා අවකාශීය විද්‍යා පීඨය	9	11	131	41	-	1
8	සම සෞඛ්‍ය විද්‍යා පීඨය	-	-	260	127	-	-
9	තාක්ෂණ පීඨය	-	-	-	81	-	-
එකතුව		**268**	**211**	**1,070**	**826**	**58**	**68**

විශ්වවිද්‍යාලය මඟින් බිහිකරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව පසුගිය වසර 5 තුල ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වර්ෂය	**2017**	**2018**	**2019**	**2020**	**2021**
කොඅවි උපාධිධාරීන්	807	944	971	1108	1173
අනුබද්ධ හමුදාමය විද්‍යා පීඨයන්හි උපාධිධාරීන්	256	271	310	271	241
එකතුව	**1,063**	**1,215**	**1,281**	**1,379**	**1,414**

ඈ . 2021 වර්ශය තුල විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් සිදු කරන ලද ප්‍රකාශන

පීඨය	**ප්‍රකාශන වර්ගය**			
	අනුක්‍රමණිකව සංග්‍රහ	**අනුක්‍රමණිකව නොවන වාර සංග්‍රහ**	**සමුළු පත්‍රිකා**	**සමුළු උපුටන**
ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය	-	-	38	5
වෛද්‍ය පීඨය	26	6	-	52
ඉංජිනේරු පීඨය	15	1	32	4
නීති පීඨය	1	1	26	-
කළමණාකරන, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	2	6	27	-
පරිගණක පීඨය	3	4	69	-
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	33	1	-	75

නිර්මිත පරිසර හා අවකාශීය විද්‍යා පීඨය	2	5	32	-
KDU-CARE	10	1	05	30
පුස්තකාලය	-	-	1	04
මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය	2	2	-	-

(6). මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනය විසින් කරන ලද පුහුණු කිරීම්

වසර පුරා පැවති COVID-19 වසංගත තත්ත්වය හමුවේ ද මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනය අපගේ ප්‍රධාන අංශ හතර (4) හරහා රජයේ නිලධාරීන් යම් තාක් දුරට පුහුණු කිරීමට සමත් වී තිබේ.

අංශය	පැවැත්වූ මාර්ග වැඩසටහන් (මාර්ගගත / භෞතික)	සහභාගිවන්නන් සංඛ්‍යාව
මූල්‍ය කළමනාකරණය, වාණිජ නිපුණතා සහ පාලන අංශය	මාර්ගගත	211
මූල්‍ය කළමනාකරණය, වාණිජ නිපුණතා සහ පාලන අංශය	භෞතික	323
මූල්‍ය කළමනාකරණය, වාණිජ නිපුණතා සහ පාලන අංශය	මාර්ගගත / භෞතික	239
තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් කළමනාකරණ අංශය	භෞතික	75
නායකත්ව හා සංවිධාන කළමනාකරණ අංශය	භෞතික	52
සන්නිවේදන හා භාෂා නිපුණතා අංශය	මාර්ගගත	10
සන්නිවේදන හා භාෂා නිපුණතා අංශය	භෞතික	144
සන්නිවේදන හා භාෂා නිපුණතා අංශය	මාර්ගගත / භෞතික	80
	Total	**1,134**

එ. ආරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය

(1). ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාල පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සහ සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීමය.

එම කටයුතු අතර සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය පිළිබඳ විධාන සැපයීම සඳහා සහය වීම, සන්නද්ධ හමුදාවල ඒකාබද්ධ සේවා නියුක්තිය සඳහා වූ න්‍යායන් වර්ධනය කිරීම, සන්නද්ධ හමුදාවල ක්‍රමෝපාය සැළසුම් සකස් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම, සන්නද්ධ හමුදා අතර බුද්ධිමය අංශයට අදාළ කර්තව්‍යයන් සම්බන්ධයෙන් වූ කාරණා සම්බන්ධීකරණය කිරීම, සන්නද්ධ හමුදාවල ඉදිරි ප්‍රතිවාදීන්ගේ ශක්‍යතාවය නිශ්චය කිරීම සඳහා වූ තක්සේරු කිරීම් භාරගැනීම, හා සන්නද්ධ හමුදා මෙහෙයුම්වල සැලසුම් සකස් කිරීමට පහසුකම් සැලසීම සහ සන්නද්ධ හමුදාවන් අතරේ ඒවා ක්‍රියාත්මක කිරීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිගේ, ප්‍රධාන වගකීම් ලෙස ඉදිරිපත් කල හැක.

<u>ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය මගින් ආරක්ෂාව ලබාදීම</u>

- 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා නෙලුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලෙහි පැවති උත්සව/ප්‍රසංග 11 ක් සඳහා ආරක්ෂාව සහ ආරක්ෂක උපකරණ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ලබා දීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා පැවති පාර්ලිමේන්තු සැසිවාරයන් 30 ක් සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.02.04 වන දින පැවැති 73 වන ජාතික නිදහස් උළෙල සඳහා හා ඒ සඳහා සහභාගිවූ අතිගරු ජනාධිපති තුමාගේ ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක බලකාය වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.03.20 දින සිට 2021.03.24 දින දක්වා වැලිකඩ,වැල්ලම්පිටිය,මුල්ලේරියාව සහ ගොතටුව යන පොලිස් වසම් ආවරණය වන පරිදි මත් ද්‍රව්‍ය හා මත්පැන් අවම කිරීමේ අරමුණින් එවැනි ස්ථාන වැටලීම් සිදුකිරීමේ මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.04.04 දිනයට යෙදී තිබූ පාස්කු දිනය වෙනුවෙන් කිතුනු දේවස්ථානයන්හි පැවැත්වෙන දේව මෙහෙයන් සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.04.07 දින කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා යොදවා සිටි බන්ධනාගාර ආරක්ෂක නිලධාරින් ඉවත් කර ඇති හෙයින් නැවත ඒ සඳහා බන්ධනාගාර ආරක්ෂක නිලධාරින් අනුයුක්ත කිරීමට ඉදිරි කටයුතු සිදු කරන ලදි.

- කොවිඩ් 19 රෝගීන් සඳහා ප්‍රතිකාර කරනු ලබන රෝහල් 27ක් සඳහා ත්‍රිවිධ හමුදා/පොලිස් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.04.27 වන දින සිට 29 වන දින දක්වා ගරු චීන ආරක්ෂක ඇමාත්‍යතුමාගේ සංචාරය සඳහා ත්‍රිවිධ හමුදාව/ පොලිසිය මගින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදී.

- 2021.07.02 දින සිට 25 වන දින දක්වා ශ්‍රී ලංකා තරග සංචාරයක නිරතවූ ඉන්දිය ක්‍රිකට් කණ්ඩායම සමග පැවැති තරගයන්හි ආරක්ෂාව සඳහා ගුවන් හමුදාව වෙතින් ගුවන් සහයක සේවා කණ්ඩායම් සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

- 2021.08.13 වන දින සිට 2021.08.23 වන දින දක්වා මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ වාර්ෂික ඇසළ මංගල්‍යයේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදා භට පිරිස් යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.09.30 දින ආසියානු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වන KENICHI YOKOYAMA මහතා නුගේගොඩ පොලිස් කොට්ඨාශයට පැමිණීම හේතුවෙන් ඒ සඳහා ත්‍රිවිධ හමුදාව වෙතින් ආරක්ෂාව ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.10.04 දින ඉන්දිය විදේශ ලේකම් තුමා තලංගම පොලිස් වසමේ ඉන්දියානු සාමසාධක හමුදා ස්මාරකය වෙත පැමිණීම වෙනුවෙන් ත්‍රිවිධ හමුදා වෙතින් සහයක සේවා කණ්ඩායම් ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.05.13 වන දින නිරිත දිග මෝසම් වර්ෂාව සක්‍රියවීමත් සමග කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල සහ වලල්ලාවිට යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්හි ඇතිවූ ගං වතුර තත්වය හේතුවෙන් ආපදාවට ලක්වූවන් හට සහන සැළසීම සඳහා නාවික හමුදාවේ යාත්‍රා සහ උපකරණ සහිතව සහන කණ්ඩායම් සුදානම් කිරීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.05.21 දින කොලඹ වරායට ආසන්නව ගිනි ගැනීමට ලක්වුනු එක්ස්ප්‍රස් පර්ල් නෞකාව හේතුවෙන් අපවිත්‍ර වූ දිවයිනේ බටහිර සහ දකුණු වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා 2021.05.27 දින සිට 2021.08.20 දින දක්වා ත්‍රිවිධ හමුදා භයිපිරිස් යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.12.14 වන දින සිට 2021.12.17 වන දින දක්වා මෙරට චීන තානාපති තුමන්ගේ උතුරු පලාත් සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා එහි ආරක්ෂක කටයුතු සිදුකිරීම සඳහා ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය යෙදවීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා මහනුර, ගම්පහ, බදුල්ල, යාපනය, මොණරාගල, අම්පාර, මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්කයන් තුල ඇතිවූ ගිණිගැනීම් තත්වයන් 23 ක් පාලනය කිරීම සඳහා යුද්ධ හමුදා සහ ගුවන් හමුදා සහය ලබාදීමට කටයුතු සම්පාදනය කරන ලදි.

➢ 2021.01.23 වන දින ඕමාන් වරායේ සිට ත්‍රිකුණාමලය වරාය දක්වා ලයිබීරියානු ධජය යටතේ යාත්‍රා කරමින් තිබූ සිමෙන්ති නෞකාවක් කුඩා රාවනා ගල්පරය අසල අනතුරට ලක්වීම හේතුවෙන් ඊට සහය දැක්වීම සඳහා නාවික හමුදාව සහ ගුවන් හමුදාව වෙතින් සහය ලබා දීමට කටයුතු සම්පාදනය කරන ලදි.

(2) හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය



හමුදා සම්බන්ධතා නිලධාරී කාර්යාලය විසින් ආරක්ෂක අමාත්‍යාතුමා හා ආරක්ෂක ලේකම්තුමා විසින් ගනු ලබන තීන්දු තීරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම, සම්බන්ධීකරණය කිරීම සහ රාජ්‍ය හා අනෙකුත් ආයතන සමගින් සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

එම කටයුතු අතර ත්‍රිවිධ හමුදාව සම්බන්ධ පරිපාලන ගැටලු නිරාකරණය කිරීම, ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආරක්ෂාව සම්බන්ධ කටයුතු කිරීම, රටෙහි ඇතිවන විවිධ තත්වයන් යටතේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරුන් සහ පොලිස්පති වෙත ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන උපදෙස් යොමු කිරීම, විදේශීය තානාපති කාර්යාලවල සේවයේ නියුතු ආරක්ෂක උපදේශකයින් හට වගකීම් පැවරීම, ශ්‍රීලංකා හමුදාවන්ගේ දියුණුව සඳහා අවැසි තොරතුරු යාවත්කාලීන කිරීමට විස්තර ලබා ගැනීමට හා අවශ්‍ය අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු සඳහා සහය ලබා ගැනීම, විවිධ අවස්ථා සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම, රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ශ්‍රමදාන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සහභාගි කරවීම, විදේශීය දූත පිරිස්/ විදේශීය හමුදා දූත පිරිස් වල සංචාර සම්බන්ධීකරණය කිරීම සහ පිළියෙල කරදීම, අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රාජ්‍ය උත්සව සඳහා අධිසභායකයින් ලබාදීම, ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන සහ ත්‍රිවිධ හමුදාව සමග සම්බන්ධතාවයෙන් ආපදා කළමණාකරණය සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම යනාදිය වේ.

2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුලදී පහත සඳහන් රාජතාන්ත්‍රික විදේශීය ප්‍රභූවරුන් ශ්‍රී ලංකා සංචාරයන් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහාය ලබාදීම





- පකිස්ථාන් අගමැති ගරු ඉම්රාන් ඛාන් මැති තුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය- 2021.02.23 - 24
- චීන රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නායක සහ ආරක්ෂක අමාත්‍ය ජෙනරාල් වේ ෆෙන්ග් මැතිතුමාගේ ශ්‍රී ලංකා නිල සංචාරය- 2021.04.27 – 29
- මාලදිවයින් ජනාධිපති ඊබ්‍රහිම් මොහොමද් සෝලි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය- 2021.07.20 – 23
- ඉන්දියානු විදේශ ලේකම් ශ්‍රී හර්ෂ වර්ධන් ශ්‍රිරින්ග්ලා මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය-
- 2021.10.02 – 05
- අති උතුම් තව්කා අහමද් නසීර් අලීම් උතුමානන්ගේ ශ්‍රී ලංකා සංචාරය- 2021.11.21 – 28
- ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු කරේන් ඇන්ඩෘස් තිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය 2021.12.18
- රුසියානු සමූහාන්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ලේකම් පැට්‍රුෂව් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය 2021.11.22 - 24

<u>විදේශීය ත්‍රිවිධ හමුදා උසස් නිලධාරීන්ගේ සංචාර</u>

- රුවන්ඩා හමුදා බ්‍රිගේඩියර් ජෙනරාල් ෆ්‍රෙඩ් මුසිරගුහාරාරා ඇතුළු දූත පිරිසගේ ශ්‍රී ලංකා සංචාරය- 2020.12.31 - 2021.01.01
- ඉන්දියානු යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් එම් එම් නරාවන මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය - 2021.10.12 – 16
- ඉන්දියානු දකුණු නාවික විධාන, අණදෙන නිලධාරී වයිස් අද්මිරාල් අනිල් කුමාර් චව්ලා මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය - 2021.10.24 - 28

(3). විදේශ අධ්‍යන චාරිකා

(අ) බංගලාදේශ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2021.01.06

(ආ) ඉන්දිය ජාතිකආරක්ෂක විද්‍යාලයේ එතෙර අධ්‍යන චාරිකාව - 2021.10.17-23

2.1.2 ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව, සුබසාධනය, ජීවනෝපාය ඉහළ නැංවීම, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහාය දැක්වීම

(1) ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය

<u>ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්</u>

අ.අ	පරමාර්ථය	සංවර්ධන වැඩසටහන	ව්‍යාපෘති හැඳින්වීම	ව්‍යාපෘතින්හි ප්‍රගතිය		
				අවසන් කර ඇත	දැනට ඉටු කරමින් පවතී	ඉටු කිරීමට නියමිතව ඇත
1	රජයේ ජාතිය ගොඩනැඟීමේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබාදීම	ජනාධිපතිතුමන්ගේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ පවරන ලද ව්‍යාපෘතීන් කඩිනමින් අවසන් කිරීම	ගම සමඟ පිළිසඳරක් ව්‍යාපෘතිය	25	16	3
2		ක්‍රීඩා පාසල්හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩා පාසල් 11 ක් සංවර්ධනය කිරීම	ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන	1	8	2
3		සෞභාග්‍යයේ දැක්ම රජයේ කි:මී 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කළුතර, මාතර, ගාල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි මාර්ග 12 ක් ප්‍රතිසංස්කරණය කිරීම.	කි:මී: 100,000 දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	2	6	4

4		"වාරි සෞභාග්‍ය" වැඩසටහන යටතේ මහවැලි "එල්" කලාපයට අයත් වැව් 10 ක් හා කුරුණෑගල ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුවට අයත් වැව් 02 ක් ප්‍රතිසංස්කරණය කිරීම	වාරි සෞභාග්‍ය (2020-2022) වාරි සංවර්ධන වැඩසටහන යටතේ වැව් 12 ප්‍රතිසංස්කරණය කිරීම	12	-	-
5		අතිගරු ජනාධිපතිතුමන්ගේ විශේෂ උපදෙස් මත	අතිගරු ජනාධිපතිතුමන්ගේ හා යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් මත සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘති	8	-	2
6		-	වෙනත් විශේෂ සංවර්ධන ව්‍යාපෘති	1	4	
7	ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහාය දැක්වීම	සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහාය වීම	ආගමික ස්ථාන සංවර්ධනය කිරීම	5	5	-

ජාතිය ගොඩනැගීමේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා රජයේ උත්සාහය සාක්ෂාත් කරනු වස් යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය නගා සිටවන ලදී. එමඟින් පහත සඳහන් ව්‍යාපෘතින් 2021 වර්ෂය තුළදී සාර්ථක කර ගන්නා ලදී.

1. <u>කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය.</u>

අ:අ	විස්තරය	ප්‍රමාණය (මෙ:ටො)
1	නිෂ්පාදන ඉලක්කය (මෙ:ටො)	25,200
2	දැනට නිෂ්පාදනය කර ඇති ප්‍රමාණය (මෙ:ටො)	4578.41
3	ලංකා පොහොර සමාගම වෙත අලෙවි කර ඇති ප්‍රමාණය (මෙ:ටො)	235.521
4	තව දුරටත් නිෂ්පාදනය කලයුතු ප්‍රමාණය (මෙ:ටො)	20421.59

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සිදුකරනු ලබන වගා ව්‍යාපෘති.

2. <u>අක්කර 200ක මිරිස් වගා ව්‍යාපෘතිය</u>.

අ:අ	විස්තරය		
1	වගාකර ඇති මිරිස් බීජ ප්‍රභේදය		ගල්කිරියාගම MICH HY 01
2	වගාකර ඇති භූමි ප්‍රමාණය (යුද්ධ හමුදා ගොවිපළ ආඩියාපුලියන්කුලම්)		අක්: 50
3	ඉදිරියේදී වගා කිරීමට නියමිත ප්‍රමාණය (යුද්ධ හමුදා ගොවිපළ මැණික්ෆාම්/කන්දකාඩු)		අක්: 150
4	ලබා ගෙන ඇති මුළු අස්වනු ප්‍රමාණය (යුද්ධ හමුදා ගොවිපළ ආඩියාපුලියන්කුලම් මඟින්)	අමු මිරිස්	කි:ග්‍රෑ 3527.75
		ඉදුණු මිරිස්	කි:ග්‍රෑ 52518
		වියලි මිරිස් (Grade 01)	කි:ග්‍රෑ 9254
		වියලි මිරිස් (Grade 02)	කි:ග්‍රෑ 590

3. <u>බීජ සඳහා කහ වගා ව්‍යාපෘතිය</u>.

අ:අ	යුද්ධ හමුදා ගොවිපළ	වගාකර ඇති භූමි ප්‍රමාණය (අක්කර)	ලබා ගන්නා ලද අස්වැන්න (කි:ග්‍රෑ)
1	කොහිලවගුරවත්ත	2	6,200
2	බලල්ල	2	අස්වනු නෙලා නොමැත
3	නිරාවිය	2	
4	ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය	2	
5	සටන් පුහුණු පාසල - අම්පාර	3.5	

4. <u>අඹ වගා ව්‍යාපෘතිය (TEJC)</u>

අ:අ	ගොවිපළ	වගාකිරීම සඳහා ලබා දී ඇති පැල ප්‍රමාණය
1	ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය)	10,000
2	රෙජිමේන්තු මධ්‍යස්ථානය ගජබා රෙජිමේන්තුව - සිංහපුර ගොවිපල	15,000
3	ඉංජිනේරු බලසේනා මූලස්ථානය බූඔය - වව්නියාව	5,000
4	ගුවන් සංක්‍රමණික පුහුණු කඳවුර - කැබිතිගොල්ලෑව	1,000
5	යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු	6,250
6	යුද්ධ හමුදා ගොවිපළ මැණික්ෆාම්	7,520
7	යුද්ධ හමුදා ගොවිපළ ආඩියාපුලියන්කුලම්	4,960
8	යුද්ධ හමුදා ගොවිපළ යාප පලටුපාන	700
	එකතුව	**50,430**

5. 2021 වර්ෂය තුළ යුද්ධ හමුදාව වෙතින් සිදුකර ඇති රුක් රෝපණ වැඩසටහන්.

අ:අ	රුක් රෝපණ වැඩසටහන	ස්ථානය	පැල ප්‍රමාණය
1	72 වන යුද්ධ හමුදා දිනය වෙනුවෙන් කුඹුක්පැල සිටුවීම	1 බලකාය/සියලුම ආරක්ෂක සේනා මූලස්ථානයන් ආවරණය වන පරිදි	10,000
2	73 වන නිදහස් සමරු උළෙලට සමඟාමීව රුක් රෝපණය කිරීම		10,705
3	තුරු මිතුරු නව රටක ව්‍යාපෘතිය යටතේ කොස් පැල රෝපණය කිරීම		1365
	එකතුව		**22,070**

6. යුද්ධ හමුදා ගොවිපල නිෂ්පාදන කටයුතු.

අ:අ	නිෂ්පාදනය	2021 වර්ෂයේ නිෂ්පාදිත ප්‍රමාණය (මෙ:ටො)
1	ඵණු නිෂ්පාදන ක්‍රියාවලිය	85,794
2	යුද්ධ හමුදා ගොවිපළ මඟින් සිදුකරනු ලබන වී වගාව	66.1
3	බිත්තර නිෂ්පාදනය	4,182,765 (බිත්තර)

7. යුද්ධ හමුදා ගොවිපල මගින් සිදුකරනු ලබන වී වගාව - 2021 වර්ෂය.

අ:අ	ස්ථානය	අක්කර ප්‍රමාණය	නිෂ්පාදිත ප්‍රමාණය (මෙ:ටො)
1	යුද්ධ හමුදා ගොවිපළ කන්දකාඩු	50	53.8
2	කෘෂිකර්ම ව්‍යාපෘතිය ශ්‍රී ජයවර්ධපුර	8.5	12.3
	එකතුව	**58.5**	**66.1**

- **ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්**

ජනපති ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ අදියර තුනකදී පහත සඳහන් ව්‍යාපෘති රාජ්‍ය මුදල් උපයෝජනයෙන් නිම කරන ලදී.

අනු අංකය	ස්ථානය	ව්‍යාපෘතිය	වෙන් කරන ලද මුදල (මිලියන)	මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශය	සටහන
01	කණුගහවැව ප්‍රාථමික විද්‍යාලය	ප්‍රධාන ශාලාව ඉදිකිරීම, ගුරු නිවාසය ඉදිකිරීම, පුස්තකාලය, පරිගණක විද්‍යාගාරය, ගුරු	9,009,384.45	පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	2021.11.05 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.

		විවේකාගාරයසහ ගබඩා කාමරය සහිත ගොඩනැගිල්ල ඉදිකිරීම, ආරක්ෂිත වැට ඉදිකිරීම			
02	හල්මිල්ලවැටිය විද්‍යාලය	නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම, පැවති පරිගණක විද්‍යාගාරය නවීකරණය කිරීම	1,134,535.27	පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	2021.11.05 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
03	කැබතිගොල්ලෑව	අභිනවාරාම විහාරස්ථානයේ සංවර්ධන කටයුතු	3,374,965.79	බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	2021.04.04 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
04	කණුගහවැව	කණුගහවැව "සේවා පියස" ඉදිකිරීම. කණුගහවැව ග්‍රාමයේ අඩු ආදායම් ලාභී ස්ථිර නිවාස නොමැති පවුල් 25ක් සඳහා නව නිවාස ඉදිකිරීම.	25,427,122.08	(ත්‍යාගශීලීන්ගේ සහ හිතවතුන්ගේ ආධාර) මුදල් උපයෝජනයෙන් නිම කරන ලදී.	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
05	කණුගහවැව	අභිනවාරාම විහාරස්ථානයේ චෛත්‍ය ඉදිකිරීම.	2,648,723.00	(ත්‍යාගශීලීන්ගේ සහ හිතවතුන්ගේ ආධාර මුදල්) උපයෝජනයෙන් නිම කරන ලදී.	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
06	කණුගහවැව	"සේවා පියස" ඉදිකිරීම	6,401,904.74	නාගරික සංවර්ධන අධිකාරිය	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
07	හල්මිල්ලවැටිය	හල්මිල්ලවැටිය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය නවීකරණය කිරීම.	1,830,071.85	නාගරික සංවර්ධන අධිකාරිය	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
08	හල්මිල්ලවැටිය	හල්මිල්ලවැටිය ග්‍රාමය සඳහා වොලිබෝල් පිටියක් ඉදිකිරීම.	1,001,277.00	නාගරික සංවර්ධන අධිකාරිය	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
09	කණුගහවැව	කණුගහවැව බස් නැවතුම ඉදිකිරීම.	527,472.00	නාගරික සංවර්ධන අධිකාරිය	2021.10.31 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
10	කණුගහවැව	කණුගහවැව කලාගම විහාරය	1,562,698.50	නාගරික සංවර්ධන	2021.10.31 වන දින ඉදිකිරීම්

		පිළිසකර කිරීම.		අධිකාරිය	අවසන් කරන ලදී.
11	කණුගහවැව	කණුගහවැව ගොව වරද්දනා වැව	ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. (30%)	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	නිලධාරියෙකු සහ සෙසු නිළයන් - 65 මේ වන විට අනුයුක්ත කොට ඇත.
12		කණුගහවැව මානා වැව			

(2) ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනයට සහ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහය වීම.

➢ **<u>සඳහිරුසෑය ව්‍යාපෘතිය</u>**

සඳහිරුසෑය ස්තූපය උසින් අඩි 282.6ක් හා විශ්කම්භය අඩි 255ක් වන අතර, ස්තූපයේ ඉදිකිරීම් 2021.11.18 දින අවසන් කර මහජනතාවගේ වන්දනාමන කටයුතු සඳහා අවස්ථාව සලසා ඇත. තවද ස්තූපය වටා ඇති අනෙකුත් ඉදිකිරීම් කටයුතු ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භට පිරිස් යොදා ගනිමින් සිදුකරනු ලබයි.





➢ **<u>ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනයට සහ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහය වීම.</u>**

අනු අංකය	ස්ථානය	ව්‍යාපෘතිය	මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශය	සටහන
01	ආනමඩුව	ආනමඩුව මධ්‍ය මහා විද්‍යාලය	ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ඉදිකිරීමේ කටයුතු අවසන් අදියරෙහි පවතී.
02	රත්මලාන	රත්මලාන හින්දු විද්‍යාලය		ඉදිකිරීමේ කටයුතු අවසන් අදියරෙහි පවතී.
03	ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය ශා. ජෝශප් විද්‍යාලය		ඉදිකිරීමේ කටයුතු අවසන් අදියරෙහි පවතී.
04	ගාල්ල	ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලය		ඉදිකිරීමේ කටයුතු අවසන් අදියරෙහි පවතී.





ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තිය පුහුණු පාසල ඒකල මගින් ගුවන් හමුදා 70වැනි සංවත්සරය නිමිත්තෙන් කොටුගොඩ රෝමානු කතෝලික පාසලේ දී ළමුන් 325දෙනෙකු සඳහා පාසල් පොත් සහ බෑග් බෙදා දෙන ලදී. ඊට අමතරව විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 25දෙනෙකුට විශේෂ තිලිණ ප්‍රධානය කෙරුනු අතර තවද, වෘත්තිය පුහුණු පාසල ඒකල මගින් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.

2021 මාර්තු 08 වන දින කෙප්පාපිලෙයි දෙමළ මිශ්‍ර පාසල සඳහා පුස්තකාලයක් ඉදි කර පොත් රාක්ක පරිත්‍යාග කිරීම.

- **ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණයට සහ සංවර්ධනයට සහය වීම.**

1. විහාරස්ථාන සංවර්ධනය කිරීම

අනු අංකය	ස්ථානය	ව්‍යාපෘතිය	වෙන් කරන ලද මුදල (මිලියන)	මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශය	සටහන
01	ඔලබොඩුව	ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රාජ මහා විහාරස්ථානය සංවර්ධනය කිරීම (ආරක්ෂිත වැට ඉදිකිරීම)	5,531,861.99	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	2021.10.20 වන දින ඉදිකිරීම් අවසන් කරන ලදී.
02	අම්පාර	දීඝවාපිය රජමහා විහාරයේ ධාතු මන්දිරය ඉදි කිරීම	5,000,000.00	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.
03	අනුරාධපුරය	අභයගිරි විහාරස්ථානයේ ධාන ශාලාව ඉදි කිරීම	ගුවන් හමුදා ශ්‍රම දායකත්වය මේ සඳහා ලබා සී ඇත.	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	ඉදිකිරීමේ කටයුතු අවසන්

2. ආගමික ස්ථාන සඳහා සලාක පරිත්‍යාග වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
3. දිළිඳු බව තුරන් කිරීමේ හා සුභසාධන වැඩසටහන්

- පෙරපාසල් ගුරුවරුන් සඳහා වැඩමුළුවක් සංවිධානය කිරීම.
- විරුසර කාඩ්පත් බෙදා දීම.
- විශ්‍රාම ගිය පුද්ගලයන් සඳහා රැකියා බැංකුවක් නඩත්තු කිරීම.
- ගුවන් හමුදා පුද්ගලයන්ට මුල්‍ය ආධාර/ ණය ලබා දීම.
- පෙර පාසල් ගුරුවරුන් සඳහා සාරි ලබා දීම.
- වෙනත් ආයතන සහ සංවිධාන සඳහා සේවා සහතික නිකුත් කිරීම.
- පුද්ගලයන්ගේ සුභසාධන වාර්තා පවත්වාගෙන යාම.
- දිවුල්වැව ග්‍රාමය සඳහා ඉදිකල නව පානීය ජල ව්‍යාපෘතිය.
- සේවා වනිතා නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ නිවාස විවෘත කිරීමේ උත්සවය.
- ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
- රටතුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) අපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.
- පාසල් හා පෙර පාසල් දූ දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම.
- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන මගින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.
- මේ යටතේ පෙරපාසල් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 562ක් ක්‍රියාත්මක කර ඇත. ඒ මඟින් දරුවන් 12,375ක් වෙත අධ්‍යාපනය හා රැකවරණය ලබා දී ඇති අතර, ඒ සඳහා ගුරුවරු ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 1156ක් අනුයුක්ත කර ඇත. 2021 වර්ෂය තුල සේරුවිල බලකායේ පෙරපාසල් 02ක් හා මහඔය බලකායේ පෙරපාසල් 01ක් අලුතින් ආරම්භ කිරීම.
- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම. මේ යටතේ පාසල් විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 186ක් අනුයුක්ත කර ඇත.
- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍රස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.
- මේ යටතේ වකුගඩු රෝගය බහුලව පැතිර යන ප්‍රදේශයන්හි පිවිතුරු පැන් පූජා ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කර ඇති ජල පෙරණ යන්ත්‍ර 63ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් 487දෙනෙකු යොදවා දිවා රාත්‍රී පිරිපහදු ජලය ලබා දීම සිදුකරනු ලබයි.
- ශ්‍රීලංකා ගුවන් හමුදාව විසින් පාසල් දෙකක් (02), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, පන්සල් දෙකක් (02), සේවා පියස ගොඩනැගිලි දෙකක්, ක්‍රීඩා පිටියක් සහ නිවාස විසිපහ (25)ක් ඇතුළුව ආදර්ශ ගම්මානයක් සංවර්ධනය කිරීම
- ගම සමග පිළිසඳර ‘‘වැඩසටහන යටතේ කැබිතිගොල්ලෑව කණුගහවැව වැව් 02ක් සංවර්ධනය කිරීම. ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රු. මිලියන 58.58 කි. (අරමුදල් සැපයූ ආයතනයන් වනුයේ, බුද්ධ ශාසන අමාත්‍යාංශය, ආගමික හා සංස්කෘතික කටයුතු ලං.රු.මි.1.58, ළමා හා කාන්තා සංවර්ධනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය ලං.රු.මි.10.14, නාගරික සංවර්ධන අධිකාරිය ලං.රු.මි.16.95 සහ පරිත්‍යාගශීලීන්ගෙන් ලං.රු.මි.29.93)
- සෞභාගයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රටේ වන ඝනත්වය වැඩි කිරීමේ තිරසාර පරිසර ප්‍රතිපත්තීන් ට අනුව ශ්‍රීලංකා ගුවන් හමුදාව විසින් අම්පාර, ලාහුගල ජාතික වනෝද්‍යානයට(අක්කර 60) ගුවනින් බීජ ඉසීමේ (බීජ බෝම්බ 70,000 පමණ) ව්‍යාපෘතියක් සිදු කරන ලදි.

➢ **<u>ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>**

අනු අංකය	විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි)	2021 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	2021 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	2021 වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන
1	ආගමික ස්ථාන	**1,202.05**	16	79	95
2	ආගමික නොවන ස්ථාන	**8,159.58**	29	35	64

<u>නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රැකිකරණ යන්ත්‍ර) විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර;</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		නාවික සමාජයීය මෙහෙවර අරමුදලේ ප්‍රතිපාදන භාවිතා කරමින් සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
13	5	34	17	5	-	53	21

රජයේ ආයතන මගින් ප්‍රතිපාදන සැපයීමෙන් අනතුරුව සඳහිරු සෑය, ගාලු මුවදොර පිටිය, 80 ක් ලැබ්, ජාතික කලා භවන යන ස්ථායන්හි උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය යටතේ සිදු කරනු ලබයි.

නාවික හමුදා කෘෂි ව්‍යාපෘති අරමුදල මගින් ප්‍රතිපාදන ලබා දීමෙන් දිසවාපි විහාරයේ නා සහ ඇහැළ පැළ සඳහා ජල බිංදු සැපයීම් පද්ධතියක් නාවික හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් ස්ථාපිත කිරීම.

➢ **<u>බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>**

අ. උතුරු පළාත් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ කඳවුර

මෙම දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් කාර්යාලයේ සංවිධානයෙන් සහ මුලිකත්වයෙන් ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සහ ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය හා එක්ව මෙම ලේ දන්දීමේ කඳවුර මුළු උතුරු පළාතම ආවරණය වන පරිදි 2021.12.17 වන දින මුලතිව්, කිලිනොච්චි, යාපනය සහ වව්නියා දිස්ත්‍රික්ක වල සාර්ථකව පවත්වන ලදි.

ආ. ශ්‍රී ලංගම හොරොව්පොතාන ඩිපෝවට අයත් අබලන් බස් රථයක් පිළිසකර කිරීම

හොරොව්පොතාන ඩිපෝවේ රැකියා ගත පුහුණුව සඳහා යොදවා තිබූ මෙම දෙපාර්තමේන්තුවේ සහයකයින් විසින් එම ඩිපෝවේ අබලන්ව තිබූ බස් රථයක් ධාවනයට සුදුසු පරිදි නවිකරණය කර ධාවනයට එක් කිරීමට සමත්විය. හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අනුයුක්තව රාජකාරී කරන මෙම සහයකයින් මහත් කැපවීමෙන් සහ උනන්දුවෙන් සිදු කරන ලද මෙම සත්ක්‍රියාව අනුරාධපුර දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ සහ ගමනාගමන මණ්ඩල නිලධාරින්ගේ මහත් පැසසුමට ලක් විය.



යුහුසුළුව සේවයේ යෙදෙන කාර්ය සහයකයින්



නවීකරණය කරන ලද බස්රථය ධාවනයට එක් කිරීම

සාර්ථකව වෘත්තීය පුහුණුව අවසන් කර ‘‘බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක’’ තනතුරට බඳවා ගනු ලබන සේවක පිරිසෙන් කොටසක් පෞද්ගලික අංශයේ ආයතන/ ව්‍යාපෘති සඳහා යෙදවීම තුළින් ආදායම් ඉපයීම සිදුකර, රාජ්‍ය ආදායමට දායකත්වය සැපයීමට සැලසුම් කර ඇත. ඊට අදාල ක්‍රමවේදය සුදානම් කිරීම සාකච්ඡා අවධියේ පවතී. දැනට China harbor පෞද්ගලික සමාගම විසින් රටතුළ ක්‍රියාත්මක කරන වරාය නගරය, Marina Square, Havelock City වැනි ප්‍රධාන ව්‍යාපෘතින් සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාවට නංවමින් පවතී.

එසේම පුහුණුව සාර්ථකව නිමකරන ලද බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින් විදේශ සේවා නියුක්තිය සඳහා යොමු කිරීමටද අපේක්ෂා කෙරේ. මේ වන විට ඊශ්‍රායලයේ සාත්තු සේවිකා සේවා සඳහා සේවා සැපයීමට ඇති හැකියාව පිලිබඳව විමසීම් ලැබී ඇත.

ඇ. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති (අවශ්‍ය පිරිවැය අනුමත වුවහොත්)

මෙම දෙපාර්තමේන්තුව යටතේ සෘජුවම ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ පහත සඳහන් කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති රජයේ උපදෙස් ප්‍රකාරව තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් මෙම ව්‍යාපෘති 2022 වසරේ ආරම්භ කිරීමට අපේක්ෂිතය.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත පිරිවැය (TEC) රු.මි.	2022 සඳහා අපේක්ෂිත පිරිවැය රු.මි.
1	නොයිඳුල් පොල්තෙල් නිෂ්පාදන ව්‍යාපෘතිය (වයඹ)	1.45	1.45
2	කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය (උතුරු මැද)	1.5	1.5
3	සමෝදානිත කෘෂිගොවිපොල 25ක් ආරම්භ කිරීම (දිස්ත්‍රික්ක 25)	50	50

නමුත් රජයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති වන මාර්ග කාපට් කිරීම, වැව් ප්‍රතිසංස්කරණය කිරීම, කාබනික පොහොර නිෂ්පාදනය ආදී කාර්යන් සහ අනෙකුත් විවිධ ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා විශාල කාර්ය සහායකයන් සංඛ්‍යාවක් යොදවා ඇත.

➢ **<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මානව සම්පත විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හී යොදවා එකී නිෂ්පාදන වෙළඳපල වෙත යොමු කිරීමෙන් උපයාගනු ලැබූ ආදායම් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත පහත පරිදි ප්‍රේෂණය කර ඇත. එමඟින් එකී නිෂ්පාදනයන්හි වෙළඳපල මිල පාලනයට මෙන්ම රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා පහත පරිදි දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත

ව්‍යාපෘති ආදායම් සාරාංශ සටහන

								රුපියල් මිලියන වලිනි.
ව්‍යාපෘති ඛාණ්ඩය	2014	2015	2016	2017	2018	2019	2020	2021
කෘෂි පශු ගඩොල්	27	295	631	541	375	382	482.5	379.2
ආරක්ෂක සේවා ආදායම්	38	25	204	312	491	606	375.7	320.49
නර්තන හා සංගීත ආදායම්	-	-	27	11	6	17	3	1.6
නඩත්තු සේවා ආදායම්	-	-	23	19	22	24	17.5	25.58
ඉදිකිරීම් සේවා ආදායම්	-	-	30	58	87	102	90.5	1.57
විවිධ ආදායම්	4	3	141	202	16	25	9	41.06
එකතුව	69	323	1,056	1,143	997	1,156	978.2	769.5

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘති
සිවිල් ආරක්ෂක විශේෂ ව්‍යාපෘති ඡායාරූප එකතුව



දීඝවාපිය දාගැබ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය



කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක්

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2021 වර්ෂය තුල සිදුකරන ලද ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

අ.අ.	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති ගණන	අක්කර ගණන
1	වී	290	2565
2	අඳ වී	2122	2121
3	අඳ බඩඉරිඟු	164	164
4	කජු	38	1703.25
5	කව්පි	52	469.5
6	බඩඉරිඟු	82	203.5
7	කුරක්කන්	85	460.5
8	උඳු	55	306.8
9	කහ	3	2
10	මුංඇට	34	508.5
11	තල	56	366.5
12	රටකජු	158	456.25
13	වෙනත් භෝග	162	271.25
14	කාබනික පොහොර	ව්‍යාපෘති 102ක් සිදුකර ඇත	
	එකතුව	**3403**	**9598.05**

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති ගණන
1	බ්ලොක් ගල්	13
2	ගඩොල්	49
3	ඉදල්	38
4	අත්කම්	11
5	මැහුම්	19
6	පේෂ කර්මාන්ත	1
7	කාබනික පොහොර	102
8	අභ්‍යාස පොත්	1
9	කරණුවැම්	5
10	සත්ව	2
11	මත්ස්‍ය	6
12	කම්මල්	3
13	වාහන අළුත්වැඩියා	4
14	වෙනත්	103
එකතුව		**357**

<u>දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු, පශු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මගින් රටේ ආහාර ඇතුළු ජාතික නිෂ්පාදනය ශක්තිමත් කිරීම.</u>

2021 යල කන්නයේ ලද කෘෂි ව්‍යාපෘති අස්වනු ප්‍රමාණයන් පහත පරිදි වේ. 2021 මහ කන්නයේ අස්වනු ඉදිරියේ දී ලැබීමට නියමිතය.

අ/අ	බලකාය	වී	උඳු	රටකජු	මුංඇට	බඩඉරිඟු		කව්පි	තල	පැනි කොමඩු	වෙනත්
						කිලෝ	කරල්				
1	වැලිඔය	178,976	-	52,943	-	-	-	250	79	-	5,221
2	මොනරාගල	-	-	-	-	-	-	16,703	-	8,622	-
3	මහනුවර	-	-	-	-	-	-	65	-	-	2,340
4	පොළොන්නරුව	71,046	-	-	-	-	-	-	-	-	4,476
5	විශ්වමඩු	80,060	-	4,973	-	-	-	317	-	1,049	50,529
6	වෙන්නවත්ත	3,015	-	-	-	-	-	-	-	-	-
7	මහඔය	23,597	-	-	-	-	-	7,012	-	-	-
8	ත්‍රිකුණාමලය	129,698	-	5,896	2,036	235	23,702	-	98	-	-
9	පුත්තලම	23,375	-	-	-	-	-	308	176	-	-
10	කතරගම	1,944	-	-	-	-	-	-	20	-	-
11	හොරොව්පොතාන	114,593	-	12,050	-	-	300	-	-	-	58,035
12	කැබිතිගොල්ලෑව	99,716	-	1,094	-	-	-	302	-	-	2,060
13	මැදිරිගිරිය	77,915	-	-	44	-	300	-	-	1,810	188,814
14	ගෝමරන්කඩවල	1,846,550	-	2,030	-	7,092	-	-	-	-	1,289
15	කිලිනොච්චිය	250,000	60	5,175	-	-	-	71	-	5,920	-
16	වව්නියාව	8,060	-	460	-	-	-	-	1,907	-	-
17	අනුරාධපුර	3,213	-	-	-	-	-	-	-	-	-
18	විල්පත්තුව	-	-	-	-	-	-	-	2,874	-	-
19	අම්පාර	342,500	-	-	-	-	-	-	-	953,785	-
20	සේරුවිල	86,900	-	-	-	-	-	-	-	-	-
21	උහන	422,870	-	-	-	-	-	-	-	60,408	-
22	මූලතිව්	16,442	290	15,690	-	585	-	800	-	10,835	14,842
එකතුව		**3,780,469**	**350**	**100,311**	**2,080**	**7,912**	**24,302**	**25,828**	**5,154**	**1,042,429**	**327,605**

<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති</u>

අනු අංකය	ඉදිකිරීම් ව්‍යාපෘතියේ නම	යොදවා ඇති භටයින් ගණන
1	පල්ලන්සේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැගිලි 04ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	55
2	රාජ්‍ය ඔසුසල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	16
3	නැගෙනහිර කොළඹ මුල්ලේරියාව රෝහලේ රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම් ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	8
4	තංගල්ල රෝහලේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා පූහුණු/නූපූහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	22
5	අපේ ගම පරිශ්‍රය පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම	7
6	රිදියගම සෆාරී උද්‍යානය ඉදිකිරීම් ව්‍යාපෘතිය	28
7	දිවයින පුරා විහාරස්ථාන ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති 831	3,307

- **සුබසාධන හා සේවාවනිතා කාර්යසාධනය**

- අසේවයේ නියුතු හා විශ්‍රාම ගොස් සිටින රණවිරුවන් සඳහා විරුසර වරප්‍රසාද කාඩ්පත් සැකසීම සඳහා නාමයෝජනා 5154ක් රණවිරු සේවා අධිකාරි වෙත යොමු කිරීම.
- සුදුසුකම්ලත් සිවිල් ආරක්ෂක නිලධාරීන් 10,300 දෙනෙකු වෙත දීර්ඝ සේවා පදක්කම් පිරිනැමීම.
- ස්ථීර නිවාස නොමැති සිවිල් ආරක්ෂක සාමාජිකයන් හට නව නිවාස 51ක් සාදා දී පදිංචි කරවීම
- අර්ධ නිවාස ව්‍යාපෘතිය යටතේ සිවිල් ආරක්ෂක භටයන්ගේ අඩක් නිම කරන ලද නිවාස 10ක වැඩ අවසන් කිරීම සඳහා අනුග්‍රාහකත්වය දක්වා ඇත.
- සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 39,947 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් බෙදා දීම. අපොස උසස් පෙළ සමත්ව විශ්වවිද්‍යාල වරම් ලැබූ දරුවන් 03 දෙනෙකු සඳහා ලැප්ටොප් පරිගණක ලබා දීම. 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී වැඩිම ලකුණු ලබා ගනිමින් ඉහළින්ම සමත් වූ දරුවන් 4 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව සහ පාසල් සපත්තු ප්‍රදානය කිරීම.

(3). ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව

- **අලි මිනිස් ගැටලු හේතුවෙන් සිදුවන හානි අවම කිරීම**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මඟින් අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා යුද්ධ හමුදා පර්යේෂණ, විශ්ලේශණ, යෝජනා හා සංවර්ධන ශාඛාව මඟින් හදුන්වාදී ඇති Elephant Repel System මඟින් අවම පිරිවැයකින් ආලෝක විමෝචක ඩයෝඩ (LED) උපයෝගී කරගනිමින් අලි ඇතුන්හට දරාගත නොහැකි අලෝක තිව්‍රතාවය යුත් ආලෝක පද්ධතියක් නිකුත් කරනු ලබයි. මෙමඟින් මිනිසාගේ සහ අලිඇතුන්ගේ පෙනීමට හානියක් නොවන ලෙස අලිඇතුන් විකර්ෂණය වීම සිදුවන බව ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදී තහවුරු වීමෙන් පසු දිවයින පුරා අවශ්‍ය ස්ථානයන්හි ස්ථාපිත කර ඇත.
2. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කණුගහවැව ආදර්ශ ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ ඉදි කරන ලද අලි වැට විවෘත කිරීමේ උත්සවය.





3 සිවිල් ආරක්ෂක හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අලි - මිනිස් ගැටුම් අවම කර ජීවිත හා දේපළ සුරැකීම සඳහා ගත් ක්‍රියාමාර්ග ලෙස අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිස් හා අලි ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කලමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක භටයන් 4521ක් යොදවා දිග 4645Km ක් වන විදුලි වැටවල් 316ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.

4. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

- **රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණය කාර්යන්වල සහාය වීම.**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් කොළඹ වරායේ වයඹ දෙසින් නැංගුරම්ලා තිබියදී ගිනිගැනීමට ලක්ව මුහුදුබත් වූ "MV X-PRESS PEARL" බහාලුම් නෞකාව තුළ තිබූ තෙල්/රසායනික ද්‍රව්‍ය මුහුදු ජලය සමග එක්වීම වැලැක්වීම සඳහා රසායනික නාෂ්ඨීක ජීව විද්‍යාත්මක සහ විකිරණශීලි කණ්ඩායම් සහාය ලබාදීම.
2. රටේ විවිධ ප්‍රදේශයන්හි සිදුවන ආපදා වලදී සහය දැක්වීම සඳහා පුහුණුවලත් නිලධාරීයෙක් සහ සෙසුනිලයින් 34 කින් යුතු ආපදා සහන ඛණ්ඩයක් බඩු භාණ්ඩාදිය සමඟින් දිවයිනම ආවරණය වන පරිදි සියලුම ඉංජිනේරු ඒකකයන්හි ස්ථානගතකර ඇත.
3. රට තුළ හදිසි ගංවතුර තත්වයක් ඇති වුවහොත් බෝට්ටු අවශ්‍ය ස්ථානයන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා බෝට්ටු ට්‍රෙලර් රථ 05 ක් නවතමයෙන් ලබාගෙන යුහ කඳවුර - මත්තේගොඩ හි ස්ථාන ගතකර ඇත.
4. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින්සොරවූ අලුත්වැඩියා, පාලම් පිරිසිදු කිරීම්, මෘත දේහ සෙවීම් සඳහා හා විශේෂ කිමිදුම් රාජකාරි ගණනින් අවස්ථාවන් 169ක් සඳහා දායකත්වය ලබා දී ඇත.
5. 2021 වසර තුළ දී කඩොලාන පැළ 110580ක් සිටුවන ලදි.
6. 2021 වසර තුළ දී තහනම් දැල්, ක්‍රම හා කොන්දේසි උල්ලංඝණය කිරීම් හේතුවෙන් අත්අඩංගුවට ගත් යාත්‍රා සංඛ්‍යාව - 558.
7. 2021 වසරේදී නීති විරෝධීව ආනයනය කරන ලද එනසාල් කිග්‍රෑ 2327, කහ කිග්‍රෑ 105247, බීඩි කොළ කිග්‍රෑ 12677, වල්නාශක කිග්‍රෑ 646ක් සහ දුම්වැටි ගණනින් 16220ක් අත්අඩංගුවට ගෙන ඇත.
8. කොළඹ වරායට වයඹ දෙසින් නාවික තැපුම් 9.5 ක් දූ මුහුදේ නැංගුරම්ලා තිබූ MV Xpress Pearl නැමති බහලුම් ප්‍රවාහන නෞකාවේ 2021 මැයි 20 වන දින දිවා කාලයේ ගින්නක් ඇතිවී ඇති බවට ලද තොරතුරකට වහාම ප්‍රතිචාර දැක්වූ නාවික හමුදාව එම මුහුදු ප්‍රදේශය වෙත ශ්‍රීලංකා නාවික හමුදාවට අයත් නෞකා දෙකක් හා යුධ ප්‍රහාරක යාත්‍රාවක් පිටත් කර යැවීමට කටයුතු කෙරෙණි.
9. කාළගුණික තත්ත්වය වෙනස්වීම නිසා නෞකාවේ ගින්න නෞකාවේ පාලක මැදිරියේ සිට පිටුපස දෙසට ව්‍යාප්ත වෙමින් තිබූ අතර, ඇතිවී තිබෙන මෙම තත්ත්වය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්දීය රජයෙන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාගර පරිසර හානි වැළැක්වීමේ හා ගිනි නිවීමේ හැකියාවෙන් සමන්විත නෞකා ඉල්ලා සිටින ලදි.
10. තවද නෞකාවෙන් මුහුදට වැටෙන සුන්බුන් කොටස් වෙරළට පැමිණීමේ ප්‍රවණතාවය වැඩිවීම නිසා එහි අඩංගු රසායනික සංයෝග ස්පර්ශ වීමෙන් මහජනතාවට සිදුවිය හැකි අනතුරු වැලැක්වීම සඳහා නාවික හමුදාව විශේෂ වැඩපිළිවලක් ක්‍රියාවට නන්වන ලදි.

11. දික්ඔවිට සිට හලාවත දක්වා වෙරළ තීරයට ගොඩගසා ඇති සුන්බුන් හා වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කල අතර, එම සුන්බුන් හා විවිධ ද්‍රව්‍ය ජනතාව විසින් එක්රැස් කිරීම වැළැක්වීම සඳහා වූ විශේෂ ආරක්ෂක වැඩපිළිවෙල තවදුරටත් ක්‍රියාත්මක කල අතර, මෙම වැඩසටහනට සමගාමීව කොල්ලුපිටියේ සිට පානදුර දක්වා වූ වෙරළ කලාපයද පිරිසිදු කිරීමේ කටයුතු 2021 මැයි මස 27 වන දින සිට 2021 අගෝස්තු මස 20 වන දින දක්වා නිලධාරින් 756 ගේ සහ නාවිකයින් 12858 ක ශ්‍රමදායකත්වයෙන් සිදුකර මෙම නෞකාවෙන් පිටවූ පරිසරයට අහිතකර ද්‍රව්‍ය ටොන් 2400ක පමණ ප්‍රමාණයක් ඉවත් කරන ලදි.

12. මීට අමතරව සමුද්‍රීය සේවීම හා මුදවා ගැනීම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මගින් සියළුම පාර්ශව කරුවන් හා සම්බන්ධීකරන කටයුතු සිදුකරන ලද අතර, කලාපයේ ගමන් ගන්නා නෞකාවන් හට දැනුවත් කිරීමද සිදුකරන ලදි.






13. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සමාලෝචිත කාල සීමාව තුළ ආපදා තත්වයන් කළමනාකරණය සඳහා සිදු කරන ලද ගුවන් මෙහෙයුම් (ගිනි නිවීම් බම්බු) ඇතුලත් ඡායාරූප පහත පරිදි වේ.

2021 ජුනි මස X press pearl නැවේ ගිනි නිවීමේ මෙහෙයුම.



(4). ආරක්ෂක හමුදාවල ශක්තීන් ජාතික සංවර්ධනයට දායක කර ගැනීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ජාතික තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සැළසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ විසඳුම් මධ්‍යස්ථානය නඟාසිටුවීම.

- **කෝවිඩ් 19 තත්වය සඳහා දක්වන ලද දායකත්වය**
  COVID-19 ට එරෙහි ශ්‍රී ලංකාවේ සටනේදී රටේ ත්‍රිවිධ හමුදාව විසින් ලබා දී ඇති දැවැන්ත දායකත්වය පිළිබඳව විශේෂ සටහනක් තැබිය යුතු වේ. 2020 මාර්තු මාසයේ සිට, COVID-19 වසංගතය ලෝකයේ අනෙකුත් සියලුම රටවල් සේම ශ්‍රී ලංකාවේ න්‍යාය පත්‍රයේ ද ඉහළම අවධානය යොමු වූ කරුණකි. මෙම මහජන සෞඛ්‍ය අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේදී සෞඛ්‍ය වෘත්තිකයන් සමඟ හවුල් වෙමින්, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව COVID රෝගී සම්බන්ධතා සොයාගැනීමේ (Contact tracing) සිට පොදු ස්ථානවල සනීපාරක්ෂාව, නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, ජනතාවට එන්නත් කිරීම, සංචරණ සීමා පැනවීම බලාත්මක කිරීම, සහන බෙදා හැරීම දක්වා බොහෝ කාර්යභාරයන් ඉටු කරන ලදී.

ත්‍රිවිධ හමුදාව විසින් මේ දක්වා ලබා දී ඇති එන්නත් සංඛ්‍යාව

	Army	**Navy**	**Air Force**
ක්‍රියාත්මක වන නිරෝධායන මධ්‍යස්ථාන සංඛ්‍යාව	166	14	04
නිරෝධායනය වූ පුද්ගලයින් සංඛ්‍යාව	226,708	6,621	
එන්නත් කළ පුද්ගලයින් සංඛ්‍යාව	3,242,839	139,483	45,633
අතරමැදි සත්කාර මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කරන ලද COVID රෝගීන් සංඛ්‍යාව	78,135	756	6,204
No. of Repatriates Quarantined upon their Arrival	209,637	1,704	6,204

2.2

ඉදිරි දැක්ම

2.2 ඉදිරි දැක්ම

2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 හා 2021 ජූලි 29 දිනැති අංක 2238/19 දරන අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ආරක්ෂක අමාත්‍යාංශයට කාර්යයන් හා කර්තව්‍යයන් පවරා ඇති අතර එකී කාර්යයන් හා කර්තව්‍යයන් අතර ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම, අන්තර්ජාතික ආරක්ෂක සහයෝගිතාව ඇති කිරීම, මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම යනාදී සුවිශේෂී ප්‍රමුඛතා යටතේ අමාත්‍යාංශයේ විෂය පථය පෙළ ගස්වා ඇති අතර ඒ යටතේ අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන මඟින් 'රට හඳන සෞභාග්‍යයේ දැක්ම' රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දස වැදෑරුම් ප්‍රමුඛතා යටතේ ඉදිරි කටයුතු පහත දක්වා ඇති ආකාරයට පෙළ ගස්වා ඇත.

ජාතික ආරක්ෂාවට මුල් තැන - ආරක්ෂක අංශ ශක්තිමත් කිරීම

ප්‍රචණ්ඩත්වය හෝ සම්ප්‍රදායික නොවන තර්ජන හේතුවෙන් රටේ සාමකාමී පරිසරයට තර්ජනයක් එල්ල වුවහොත් එය සාමාන්‍ය ජන ජීවිතයට අහිතකර ලෙස බලපානු ඇත. ජාතියේ ආරක්ෂාව ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ එහි සන්නද්ධ හමුදාවන් කෙරෙහි දක්වන අවධාරණය සහ ඕනෑම සතුරු හෝ පිළිගත නොහැකි තත්ත්වයකට ඔවුන්ගේ සූදානම සහ අනුගත වීමේ හැකියාව මතය. මෙය ජනතාවගේ ආරක්ෂාව හෝ අත්‍යවශ්‍ය සේවා හෝ ජාතික වත්කම් ආරක්ෂා කිරීම විය හැකිය.

මෙම කරුණු සැලකිල්ලට ගෙන ජාතික ආරක්ෂාව අරභයා වන බහුවිධ මානයන් සැලකිල්ලට ගෙන රජය විසින් මාධ්‍ය කාලීන රාමුව තුළ ක්‍රියාත්මක කරන ප්‍රධාන ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් ක්‍රමෝපායයන් පහත දැක්වේ;

- **ශක්තිමත් ප්‍රතිපත්තිමය රාමුවක් හා නෛතික විධි විධාන** - ආරක්ෂක පරිසරයේ ඇති අභියෝග, තර්ජන සහ අවදානම් පිළිබඳ ජාතික මට්ටමේ අවබෝධයක් ඇති කරන සහ විමසා බලන ආකාරයේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක (ආරක්ෂාව සැපයීමේ දී රජයට මඟ පෙන්වන හර සහ මූලධර්ම නැවත විමසා බලන ආකාරයේ) අවශ්‍යතාව පැන නැඟීඇත. ඒ අනුව දැනට පවතින ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. සංශෝධිත ජාතික ආරක්ෂක ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය ශ්‍රී ලංකාවට බලපාන පුළුල් ආරක්ෂක ගැටලු ආමන්ත්‍රණය කරමින් අදාළ සියලු පාර්ශවවල සහභාගීත්වය සහිතව, අනාගතවාදී සහ විස්තීරණ ආකාරයෙන් ජාතික ආරක්ෂක යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට නව ජවයක් ලබාදෙන ආකාරයෙන් සකස් කෙරෙනු ඇත. එමෙන්ම ජාතික බුද්ධි පනතක් හඳුන්වා දීමට රජය ක්‍රියා කරන අතර එහි අරමුණ වන්නේ බුද්ධි ආයතනවල ක්‍රියාකාරකම් නියාමනය කිරීමට සහ ඒවායේ මෙහෙයුම් වලට සහාය වීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් සිදුවිය හැකි අඩුපාඩු වැළැක්වීමයි. අදාළ පනත් කෙටුම්පත නීති විශාරදයින්ගේ කමිටුවක් මඟින් අධ්‍යයනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

- **යුද්ධ හමුදා ඉදිරි ක්‍රමෝපාය (The Way Forward Strategy)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉදිරි ක්‍රමෝපාය අනුව 2020-2025 කාලය තුළ ප්‍රධාන ප්‍රවේශ හතක් හරහා සිය සේවාව අනුවර්තනය කිරීමට අවශ්‍ය කටයුතු සලස්වනු ඇත. මෙහෙයුම් පරිසරයේ මතුවෙමින් පවතින නවතම සංකීර්ණතාවලට මුහුණ දෙමින් ශ්‍රී ලංකා යුද හමුදාව නවීකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන ධාරිතාව සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග මෙම ක්‍රමෝපාය හරහා ක්‍රියාත්මක කරනු ලබයි. ආරම්භ කරන ලද ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් මඟින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව බලවත් ගොඩබිම් බලකායක්

ලෙස තව දුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. COVID වසංගත මර්ධනය වැනි මෙහෙයුම්වල දී සිය ක්‍රියාන්විත හැකියාව ජාතික ආපදා තත්වයක දී ප්‍රජා ආරක්ෂාව සඳහා සාධනීය ලෙස යොදා ගැනීමට ඇති විභවතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉතා හොඳින් පෙන්නුම් කරන ලදී.

- **පරිවර්තනයේ අංගයක් ලෙස නවීන තාක්ෂණය හඳුන්වා දීම** - මෙහෙයුම් පරිසරයේ මතුවෙමින් පවතින සංකීර්ණතාවලට අනුග්‍රහය දක්වමින් ශ්‍රී ලංකා යුද හමුදාව සංවිධාන ව්‍යුහයේ වෙනස්කම් ඇතුළුව නවීකරණය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන ධාරිතාව සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයක් අනුගමනය කරයි.

  - 2 වන සන්නාහ බලකාය සහ සයිබර් විධානය ඉහළ නැංවීම මෙන්ම කාලතුවක්කු සහ සංඥා වැනි විවිධ සටන් සහ සටන් ආධාරක ආයුධ සඳහා ආරම්භ කරන ලද ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් ශ්‍රී ලංකා හමුදාව බලවත් ගොඩබිම් බලකායක් ලෙස ශක්තිමත් කරනු ඇත.

  - වසංගත මර්ධන මෙහෙයුම්වල දී ශ්‍රී ලංකා යුධ හමුදාවට මෑතක දී හඳුන්වා දුන් ඩ්‍රෝන් රෙජිමේන්තුව විවිධ පැතිරීම් මුලාශ්‍ර සොයා ගැනීම සඳහා ඉතා ඵලදායී විය.

  - යුධ හමුදාවේ මානව ශක්තීන්හි හිඩැස පිරවීම සඳහා සොල්දාදුවන් 35,000 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති අතර උපකරණ පද්ධතීන් වැඩිදියුණු කිරීම සඳහා ද වැඩි අවධානයක් යොමු කර ඇත.

  - යුද්ධ හමුදාව සයිබර් වසම තුළ ඵලදායී වීමේ ජීව ගුණය මනාව වටහාගෙන ඇති අතර, ශ්‍රී ලංකා සංඥා බලකායට නව සයිබර් ඒකකයක් නංවාලීමත් සමඟ සයිබර් යුද්ධයක දී සිය හැකියාව සහ ධාරිතාව නවීකරණය කිරීමට පියවර ගෙන ඇත.

  - බෝම්බ නිෂ්ක්‍රීය කිරීමේ ඒකක සඳහා බෝම්බ නිෂ්ක්‍රීය කිරීමේ ඇඳුම් කට්ටල, රේඛීය නොවන හන්දි අනාවරක, කේබල් අනාවරක, අතේ ගෙන යා හැකි ජෑමර්, රොබෝ පද්ධති සහ කැමරා සහිත බෝම්බ ඇඳුම් කට්ටල ආදිය ලබා දී ඇත.

  - යුද්ධ හමුදාවේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු නව තලයකට වැඩි දියුණු කර ඇති අතර, යුද්ධ හමුදාව විසින් සැපයුම් සහ සටන් මෙහෙයුම් සඳහා අවශ්‍ය සන්නද්ධ සහ උපයෝගිතා වාහන යන දෙකම සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.

- **සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම**- ශ්‍රී ලංකාව කේන්ද්‍රගතව පිහිටා ඇත්තේ ඉන්දියානු සාගරයේ සන්නිවේදන මාර්ගවල වන අතර එහි බොරතෙල් ඇතුළු ඉන්ධන ප්‍රවාහනයෙන් 66% ක් ද, ලෝක තොග ප්‍රවාහන භාණ්ඩවලින් 40% ක් ද, ලෝකයේ බහාලුම් නැව් මාරු කිරීම් වලින් 60% ක් ද සිදු වේ. තවද, රටේ භූ-මූලෝපායික ස්ථානගත වීම හේතුවෙන් ඉන්දු-පැසිෆික් සාගර මූලාරම්භය (Indo-Pacific Initiative) මෙන්ම චීනයේ තීර හා මාර්ග (Belt & Road) සංකල්පය පිළිබඳව සැලකිලිමත් විය හැකි ආරක්ෂිත නාවික බල ප්‍රදේශයක් සහතික කිරීමේ අවශ්‍යතාවයක් පවතී. සාම්ප්‍රදායික නොවන ස්වභාවයේ ආරක්ෂක අභියෝග කිහිපයක් මතුවීමත් සමඟම, නාවික ආරක්ෂාව තර කිරීම තුළින් ඒවා විසඳීම ශ්‍රී ලංකා නාවික හමුදාවට අත්‍යවශ්‍ය වී ඇත. එම නිසා, මධ්‍ය කාලීනව කලාපය තුළ ශ්‍රී ලංකාවේ නාවික බලය පවත්වා ගැනීම, භාණ්ඩ ජාවාරම පාලනය කිරීම සහ රට ජාත්‍යන්තර නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමෙහි කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම වැළැක්වීම සඳහා අවශ්‍ය සමුද්‍රීය ආරක්ෂක උපාය මාර්ගයක් අනුගමනය කිරීමට ඉහළම ප්‍රමුඛතාව ලබා දී ඇත. ඉන්දියානු සාගරයේ සිදු කෙරෙන

ආර්ථිකමය /වාණිජමය කාර්යයන් ඉටු කිරීම සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම තුළින් එම කටයුතුවලට අවශ්‍ය ආරක්ෂාව සහතික කෙරෙනු ඇත. මේ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම රජයේ ප්‍රධානතම උපාය මාර්ගයක් වී ඇත;

- අක්වෙරළ මුර යාත්‍රා (OPV) සහ අනෙකුත් මුර යාත්‍රා ශ්‍රී ලංකාවේ සමුද්‍ර දේශසීමා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය බැවින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එම කාර්යයට උචිත විශාල වේදිකා අත්පත් කර ගැනීම සඳහා වන පුළුල් ප්‍රාග්ධන නැව් අත්පත් කර ගැනීමේ සැලැස්මක් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරයි. ඒ අනුව ඉදිරි වසර 03 තුළ දී මීටර් 110ක් දිග අක් වෙරළ මුර යාත්‍රාවක් (OPV) හා මීටර් 45ක් දිග වේග මුර යාත්‍රා 02ක් කොළඹ නැව් තටාකාංගනය මඟින් ඉදි කර ගැනීමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කමින් සිටී.

- කලාපීය වශයෙන් වැදගත් වන කොළඹ සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් (Maritime Rescue Coordination Centre) ඉන්දීය රජය වෙතින් පිරිනැමෙන ඇ.එ.ජ. ඩො. මිලි. 6 ක ප්‍රදානයක් සහිතව පිහිටුවීමට කටයුත් සිදු කෙරේ. විපතට පත් යාත්‍රා පිරික්සුම් හා ගලවා ගැනීමේ සේවා සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට සහ ඒවායේ ආරක්ෂාව සහතික කිරීමට සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පිහිටුවීම අත්‍යවශ්‍ය කරුණක් වේ. ශ්‍රී ලංකා නාවික හමුදාව දිවයිනට අයත් මුහුදු කලාපය තුල වෙළඳ නෞකා සඳහා පිරික්සුම් හා ගලවා ගැනීමේ මෙහෙයුම් සිදුකිරීමේ වගකීම දරණ අධිකාරිය ද වේ

- මූලික වශයෙන් සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු, පිරික්සුම් හා ගලවා ගැනීමේ මෙහෙයුම් සහ විවිධ අවස්ථාවල දී අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා අවශ්‍ය ඩෝනියර් නිරීක්ෂණ යානා පහසුකම් හා තාක්ෂනය ශ්‍රී ලංකාව සතුව නොමැති හෙයින්, පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා රජය සහ ඉන්දීය රජය අතර සිදුවූ ද්විපාර්ශ්වික සාකච්ඡාවලින් පසුව, එක් ඩෝනියර් නිරීක්ෂණ යානයක් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට කටයුතු කර ඇති අතර එමඟින් සමුද්‍ර ආවේක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

- බඳේ ගැඹුර 8-10 m සහිත ජැටිවල ඌණතාවය හේතුවෙන්, මුහුදු දෙසින් විශාල නෞකා හා ගොඩබිම දෙසින් කුඩා නෞකා නැංගුරම්ලෑමට පහසුකම් සැපයීම පිණිස ත්‍රිකුණාමලයේ නාවික තයාකාංගනයේ මීටර් 262 දිගින් හා මීටර් 20 ක් පළලින් යුත් ජැටියක් ඉදිකිරීමට කටයුතු කෙරේ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉදිරි සංවර්ධන සැලැස්මට අනුව නිරීක්ෂණ නෞකා, සබ්මැරීන් නිරීක්ෂණ සඳහා යොදන සීඝ්‍ර වේග කුඩා යුධ නෞකා හා ආරක්ෂක නෞකා අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන බැවින්, එම නෞකා නැංගුරම්ලෑමට මෙහි පහසුකම් සැපයීමට බලාපෙරොත්තු වේ.

- **ආරක්ෂක සන්නිවේදන ජාලයක් ගොඩනැගීම** - ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ඵලදායී ලෙස ක්‍රියා කිරීම සඳහා, හමුදා අණ සහ පාලනය රදා පවතින්නේ හමුදා විධාන අතර තොරතුරු හුවමාරු කිරීම සඳහා වන උපකරණ, පිරිස් සහ සන්නිවේදන ප්‍රොටෝකෝල ඇතුළත් සංකීර්ණ සන්නිවේදන ජාලයක් මත ය. එබැවින් ඒකාබද්ධ, නම්‍යශීලී සහ ආරක්ෂිත සන්නිවේදන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා රජය අවශ්‍ය පියවර ගනිමින් සිටී;

  - නාවික බළඇණි ඒකක අතර මෙන්ම නාවික බලඇණි ඒකක හා ගොඩබිම් ආයතන අතර ආරක්ෂිත සන්නිවේදන පහසුකම් සැලසීමේ දී දැනට වසර 20කට අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා නාවික හමුදාව භාවිතා කරන වත්මන් ගුවන් විදුලි සංඛ්‍යාත / සන්නිවේදන ජාල අධි සංඛ්‍යාත ඒකකවල

යල්පැන ගිය තත්ත්වය හේතු කොටගෙන මෙම පද්ධති/උපකරණ තවදුරටත් නඩත්තු කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාවට අපහසු වී ඇත. වර්තමානයට ගැලපෙන පරිදි එම නාවික ගුවන්විදුලි උපකරණ වෙනුවට දිවයින පුරා ආරක්ෂිත රේඩියෝ උපකරණ ජාලයක් ප්‍රතිස්ථාපනය කිරීමට හා ආරක්ෂිත සන්නිවේදන ජාල රේඩියෝ උපකරණ වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලබයි.

- ස්වයං ආධාරක සන්නිවේදන කුළුණු 11ක් ශ්‍රී ලංකාව පුරා විවිධ ස්ථානවල ඉදි කර දිවයින පුරා පිහිටි ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ කලින් තෝරාගත් ස්ථාන හා සම්බන්ධ විය හැකි ක්ෂුද්‍ර තරංග සබඳතා 37ක් හා ජාල කළමනාකරණ පද්ධතියකින් සමන්විත සුරක්ෂිත පොදු සන්නිවේදන මූලාධාරකයක් සැපයීම මඟින් උපායමාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලයක් ශ්‍රී ලංකාවේ උපායමාර්ගික වශයෙන් වැදගත් වන සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි ස්ථාපනය කෙරෙනු ඇත.

- **ගුවන් නිරීක්ෂණ වැඩි කිරීම;** වර්තමාන ශක්තීන් ආරක්ෂා කර ගනිමින් හා තවදුරටත් වැඩිදියුණු කරමින් සිය මෙහෙයුම් සූදානම උපරිම කිරීම සඳහා අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කරමින් ජාතික ආරක්ෂක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව ගුවන් වත්කම් භාවිතා කරනු ලබයි.ඒ අනුව,
    - දීර්ඝ කාලයක් තිස්සේ පිරිවැඩියා කිරීමට නියමිතව තිබූ AN-32 ගුවන් යානාවන්හි පිරිවැඩියා කටයුතු නිම කිරීමට හැකිවීම,
    - අධික ප්‍රහාරක හැකියාවෙන් යුතු කෆීර් යානා සහ එම්අයි -17 හෙලිකොප්ටර් ඇතුළු ගුවන් යානා ගණනාවක් විදේශයන්හි අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පැවතීම
    - මූලික ගුවන් මෙහෙයුම් ශක්තීන් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් අත්කර ගත් සුවිශේෂී ජයග්‍රහණයන් ය.

තවද, ගෝලීය අභියෝගතා ජයගැනීම උදෙසා සයිබර් තාක්ෂණය භාවිතා කිරීම, මිනිසුන් රහිත ගුවන් යානා (UAV) තත්ත්වයෙන් උසස් කිරීම සහ වැඩි වශයෙන් යොදා ගැනීම මෙන්ම ශ්‍රී ලංකාව තුළ නිපදවීම සඳහා නව තාක්ෂණය ලබා ගැනීමට පියවර ගෙන ඇති අතර 2021-2024 කාලය තුළ Y-12IV සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා දෙකක් සහ පුහුණු හෙලිකොප්ටර් යානා 2ක් අත්පත් කර ගැනීමට සහ නිරීක්ෂණ හා සටන් ගුවන් යානා කිහිපයක් නවීකරණය කිරීම සඳහා ගුවන් හමුදාව පහසුකම් සලසා ඇත.



ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ආරක්ෂක ලේකම්

පරිච්ඡේදය

3

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 ආරක්ෂක අමාත්‍යාංශය

3.1.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එල්

අයවැය 2021		සටහන	තක්‍ය		
			2021 (රු.)	2020 (රු.)	
	ආදායම් ලැබීම්		**6,333,769,327**	**1,970,873,801**	
-	ආදායම් බදු	**1**	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	24,085,657	21,023,630	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	6,309,683,670	1,949,850,171	
	මුළු ආදායම් ලැබීම් (අ)		**6,333,769,327**	**1,970,873,801**	
-	**ආදායම් නොවන ලැබීම්**		**11,911,589,167**	**21,529,885,503**	
-	භාණ්ඩාගාර අග්‍රිම		11,533,738,000	19,328,987,513	**ඒසීඒ-3**
-	තැන්පතු		298,623,644	183,570,089	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		79,227,522	157,945,043	**ඒසීඒ-5**
-	වෙනත් ලැබීම්		-	1,859,382,858	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**11,911,589,167**	**21,529,885,503**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**18,245,358,494**	**23,500,759,304**	
	අඩුකළා : වියදම්				
1,948,850,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,931,248,282	1,729,365,643	
1,058,890,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	829,691,658	860,881,551	**ඒසීඒ-2(ii)**
10,445,236,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	9,436,949,784	9,519,561,305	
-	පොළී ගෙවීම්	**8**	-	-	
969,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	968,932	10,000	
13,453,945,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**12,198,858,655**	**12,109,818,498**	
	මූලධන වියදම්				
64,075,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා	**10**	46,614,175	51,758,320	

	වැඩිදියුණු කිරීම්				
10,833,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	8,288,156,006	4,405,767,203	
150,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	96,184,000	123,340,266	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
13,535,500	හැකියා වර්ධනය	**14**	5,663,679	1,625,652	
355,000,000	වෙනත් මූලධන වියදම්	**15**	57,331,857	221,172,326	
11,416,410,500	**මුළු මූලධන වියදම් (ඉ)**		**8,493,949,717**	**4,803,663,767**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		395,532,961	284,558,641	
	කැන්පතු ගෙවීම්		336,352,029	187,589,962	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		59,180,932	96,968,679	**ඒසිඒ-5**
24,870,355,500	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		**21,088,341,333**	**17,198,040,907**	
	2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**(2,842,982,839)**	**6,302,718,397**	

3.1.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

ඒසිඒ-8

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	36,714,333,377	27,508,087,238
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	213,513,974	233,560,565
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**36,927,847,351**	**27,741,647,803**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(301,863,073)	(319,544,867)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		36,714,333,377	27,508,087,238
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	515,377,047	553,105,432
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**36,927,847,351**	**27,741,647,803**

පිටු අංක 07 සිට 70 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 71 සිට 131 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපනය ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :2022.02.	දිනය :2022.02.	දිනය :2022.02.

ඩබ්ලිව්.එච්.ජී.කේ.පී. බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී II
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මුලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

3.1.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය - ආරක්ෂක අමාත්‍යාංශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	10,942,692	9,115,480
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,180,569,596	1,849,692,755
අග්‍රිම ලැබීම්	12,037,199,495	19,329,378,033
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**13,596,162,511**	**21,648,606,979**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,584,016,693	2,221,038,663
සහනාධාර සහ මාරුකිරීම්	358,276,542	2,380,947,847
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,683,415,508	11,058,450,777
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	503,461,495	1,046,027,684
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**5,523,756,530**	**17,119,786,394**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,072,405,981**	**4,528,820,585**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන		

අත්කර ගැනීම්	8,072,405,981	4,528,820,585
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**8,072,405,981**	**4,528,820,585**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(8,072,405,981)**	**(4,528,820,585)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ) + (ඊ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.1.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - ආරක්ෂක අමාත්‍යාංශය

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය
   2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම
   මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

   මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම
   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම
   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය
   මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ
   2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.1.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ආදායම් සංකේතය	විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	අවසන් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003.07.05	ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු	20,060	20,040	24,085	120.18%
2003.06.00	එ.ජා.සා.මෙහෙයුම් තුළින් ලද ආදායම	1,908,140	4,300,000	6,309,683	146.74%

3.1.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම(රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු)	අවසාන ප්‍රතිපාදනය (රු)		
පුනරාවර්තන	13,448,350	13,453,945	12,198,858	90.67%
ප්‍රාග්ධන	11,115,450	11,416,410	8,493,950	74.40%

3.1.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - ආරක්ෂක අමාත්‍යාංශය

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු)	අවසාන ප්‍රතිපාදන (රු)		
01	ජාතික අයවැය දෙපාර්තමේන්තුව	සුහුරුපාය ගොඩනැඟිල්ලෙහි ණය වාරික හා පොළි ගෙවීමට	954,460	954,460	941,469	98.64%
02	පොලිස් දෙපාර්තමේන්තුව	ඉන්ධන සහ වාහන කුළී ගෙවීමට	4,637	4,637	3,991	86.07%

3.1.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - ආරක්ෂක අමාත්‍යාංශය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	18,105,884.23	18,105,884.23		100%
9152	යන්ත්‍රෝපකරණ	1,541,334,922.62	1,541,334,922.62		100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරිගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	35,900,000.00	35,900,000.00		100%

සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශයේ වසරේ සමස්ථ මූල්‍ය කාර්යය සාධනය

2021.01.01 සිට 2021.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	විස්තරය	2021.01.01.සිට 2021.12.31 දක්වා මුළු ආදායම රු.	
		මුදලින්	වෙක්පත්/මු.ඇ.
01	ගිනි අවි	4,179,120.00	715,300.00
02	පතරොම්	60,250.00	0.00
03	අන්තරායකර බහාලුම් සහිත නැව් මෙහෙයුම්	1,948,500.00	0.00
04	සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු	1,365,000.00	0.00
	එකතුව	**7,552,870.00**	**715,300.00**
	දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදල් ලැබීම්		
05	ගිනි අවි බලපත්‍ර ගාස්තු	1,581,724.00	0.00
06	පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර ගාස්තු	3,905,000.00	0.00
	මුළු එකතුව	**13,039,594.00**	**715,300.00**

රාජ්‍ය බුද්ධි අංශයේ 2021.01.01 සිට 2021.12.31 දක්වා ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

ප්‍රතිපාදන වර්ගය	වෙන් වූ ප්‍රතිපාදනය	වියදම් වූ ප්‍රමාණය
පුනරාවර්තන	**1,967,250,000.00**	**1,904,693,300.00**
ප්‍රාග්ධන	**528,600,000.00**	**80,701,795.01**

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ප්‍රගති සමාලෝචනය.

විස්තරය	2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රුපියල් මිලියන)	2021.12.31 දිනට වියදම (රුපියල් මිලියන)
පුනරාවර්තන	167	156.31
ප්‍රාග්ධන	50	31.31
එකතුව	217	187.62

සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශයේ වසරේ සමස්ථ මූල්‍ය කාර්යය සාධනය

2021.01.01 සිට 2021.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	විස්තරය	2021.01.01.සිට 2021.12.31 දක්වා මුළු ආදායම රු.	
		මුදලින්	චෙක්පත්/මු.ඇ.
01	ගිනි අවි	4,179,120.00	715,300.00
02	පතරොම්	60,250.00	0.00
03	අන්තරායකර බහාලූම් සහිත නැව් මෙහෙයුම්	1,948,500.00	0.00
04	සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු	1,365,000.00	0.00
	එකතුව	**7,552,870.00**	**715,300.00**
	දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදල් ලැබීම්		
05	ගිනි අවි බලපත්‍ර ගාස්තු	1,581,724.00	0.00
06	පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර/බලපත්‍ර ගාස්තු	3,905,000.00	0.00
	මුළු එකතුව	**13,039,594.00**	**715,300.00**

3.1.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව - ආරක්ෂක අමාත්‍යාංශය



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඊඑස්/සි/එමඕඩි/02/21/එස්ඒ/69 මබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූනි 23 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය

ආරක්ෂක අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව හා සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන (සිංහල,දෙමළ,ඉංග්‍රීසි පිටපත්) මේ සමඟ එවා ඇත.

පී.එල්.කේ.පෙරේරා
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

අංක 306/72, පොළduwa පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, 'විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවේන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේදයට යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.1.3 (අ)	අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128(2)(ඇ) හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි	චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.

ආර්ථික තත්වයේ වෙනස්කම් සැළකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වුවත් 1966 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය තුළදීද සිදු කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් ආදායම් සංකේතාංක 2003.06.00 - එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් ආදායමට අදාලව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ 2021 වර්ෂයේ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.4,280,140,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයෙහි **ACA – 1(ii)** ආකෘතියෙහි එම වටිනාකම රු.4,300,000,000 ලෙස දක්වා තිබුණි. මේ නිසා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ මූල්‍ය ප්‍රකාශනයෙහි **ACA – 1(ii)** ආකෘතියෙහි දැක්වෙන වටිනාකම අතර රු.91,860,000 ක වෙනසක් නිරූපනය විය.

(ආ) මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරණ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන හිඟහිටි බලපත්‍ර ගාස්තු ආදායම සහ මූල්‍ය ප්‍රකාශනයෙහි **ACA - 1(i)** ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර රු.512,200 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම **ACA – 1(i)** ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතුවී තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 103-01-01-2103 වැය විෂය යටතේ අමාත්‍ය කාර්යාලය - යන්ත්‍ර හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් සලසා තිබූ රු.25,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.24,340,905 ක්

ජනාධිපති ආරක්ෂක අංශය සඳහා ගිනිඅවි මිලදී ගැනීම වෙනුවෙන් වැයකර තිබුණි. මෙම මිලදී ගැනීම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලසුමට හෝ වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුලත්ව නොතිබුණු අතර මිලදී ගැනීමෙන් අනතුරුව මෙම ගිනි අවි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරා දී තිබුණු නිමුත් එම උපකරණ අමාත්‍යාංශ වත්කම් අත්පත්කර ගැනීම් යටතේ දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේපල පිරියත හා උපකරණ රු.24,340,905 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ACA 6 ආකෘතිය- මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශයට අනුව 2020 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් ශේෂය රු. 27,508,087,238 ක් වූ අතර 2021 මූල්‍ය ප්‍රකාශන අනුව 2021 ජනවාරි 01 දිනට පැවති ආරම්භක ශේෂය රු. 27,642,454,195 ලෙස දක්වා තිබුණි. ඒ අනුව ශේෂය ඉදිරියට ගෙන ඒමේදී රු. 134,366,957ක වැඩිවීමක් නිරීක්ෂණය විය. 2020 වර්ෂයට අදාල ගැලපුම් 2021 වර්ෂය තුල සිදුකිරීම මෙම වැඩිවීමට හේතුවී ඇති බව දක්වා ඇතත් ආරම්භක ශේෂයට සිදුකළ ගැලපීම් පිළිබඳව ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) තවද භාණ්ඩාගාර SA 82 චකුවට අනුව 2021 ජනවාරි 01 දිනට දැක්වෙන ස්ථාවර වත්කම් වල ආරම්භක ශේෂයට රු. 20,324,727 ක වත්කම් ගැලපුම් කර තිබුණද මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ආරම්භක ශේෂයට රු.134,366,957 ක වත්කම් එකතු කර තිබුණි. ඒ අනුව රු. 114,042,230 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) ACA-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් අගය රු. 8,031,748,960 ක් ලෙස දක්වා තිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් අගය රු.8,288,156,006 දක්වා තිබුණි. මේ අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-6) වත්කම් අත්පත් කර ගැනීම් රු. 256,407,046 කින් අඩුවෙන් වාර්තාගතව තිබුණි.

(ඉ) භාණ්ඩාගාර SA 82 චකුවට අනුව මූල්‍ය නොවන වත්කම් අවසාන ශේෂය රු. 37,724,115,329 ක් වූ අතර ACA 6 ආකෘතියට (මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය) අනුව ශේෂය රු 36,714,333,377 විය. ඒ අනුව රු. 1,009,781,952 ක් වෙනසක් නිරීක්ෂණය විය. මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීමේදී දෙවරක් සටහන් වීමෙන් මෙම වෙනස ඇතිවී තිබුණි.

1.6.2.2 මූල්‍ය චත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුම්දෙකක් වෙත සෘජු තැන්පතු ලෙස ලැබී තිබුණු රු.3,037,257ක් හදුනානොගත් තැන්පතු ලෙස දක්වා තිබුණු අතර එම තැන්පතු නිශ්චිතව හදුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ජාතික ශිෂ්‍යබට බලකායේ බැංකු ගිණුමට අදාල සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට උපලබධි නොවූ තැන්පතු යටතේ රු.2,961,138 ක ශේෂයක් දක්වා එය මුදල් පොතේ දෝෂයක් ලෙස සඳහන් කර බැංකු සැසඳුම පිලියෙල කර තිබුණි. එම දෝෂය හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ අනුව මුදල් පොතේ දැක්වෙන ශේෂය බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය සමඟ නිවැරදිව ගැලපී නොතිබුණි.

1.7. විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශයේ විවිධ අංශ විසින් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය /ගබඩා භාණ්ඩ අයදුම් කරමින් ගබඩාව වෙත ඉදිරිපත් කර තිබුණු 2021ඔක්තෝබර් මාසයට අදාල ද්‍රව්‍ය අධියාචනා පත්‍රිකා ගොණුව විගණන පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොවුණු එබැවින් එම කාලය තුළ නිකුත්කළ තොග පිළිබදව පරීක්ෂාකළ නොහැකි විය. තවද සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුල තොග පොත් වල ඇතුලත්ව තිබුණු නිකුත් කිරීම් ඒ ඒ මාසය තුල සිදුකල සියළුම නිකුත් කිරීම් වල එකතුවක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් නිකුත් කිරීම් වල නිවැරදිභාවය තහවුරු කරගත නොහැකිවිය.

1.8 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛණ පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛණ වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
තොග ලේඛණය	මුදල් රෙගුලාසි 715 හා 751	අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබුණු පිරිවැය රු.6,489,796 ක්වූ පාරිභෝජ්‍ය භාණ්ඩ වර්ග 6කට අදාල තොග ලැබීම් හා නිකුත්කිරීම් පිලිබදව කිසිදු තොග ලේඛනයක් පවත්වා නොතිබුණි.

-එම- -එම- ටෝනර් වර්ග 143 ක් හා ලිපි ද්‍රව්‍ය අයිතම 12 ක අදාලව තොග පොත් (පොදු 198) පවත්වා නොතිබීම හෝ තොග පොත් යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් භෞතික තොග ශේෂය, තොග පොත් අනුව දැක්වෙන ශේෂය සමඟ අර්ථාන්විත සැසඳීමක් කල නොහැකිවිය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.1.1 ආදායම් සංකේතාංක 20.03.06.00 -එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් තුලින් ලද ආදායම

(අ) මු.රෙ. 85(1), මු.රෙ. 85(1)(ඇ) සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 මඟින් දක්වා ඇති නියමයන්ට පටහැනිව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2021 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ආදායම් ඇස්තමේන්තුව නියමිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණු අතර චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තුව නිවැරදි බවට සහතික කර නොතිබුණි.

(ආ) මු.රෙ. 85(1)(ඇ) සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු පිළියෙලකිරීමේදී හැකිතාක් තාත්වික හා නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට හා නිවැරදිව ආදායම් ප්‍රක්ෂේපනය හා පුරෝකථනය සිදු කළ යුතු බව අවධාරණය කර ඇතත් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කර තිබුණු රු.මිලියන 1,656 ක (එ.ජ.ඩොලර් මිලියන 9) සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සාම සාධක මෙහෙයුම් කටයුතු වලින් 2021 දෙසැම්බර් 31 දිනට එ.ජ. ඩොලර් 9,954,775 ක් හිඟ හිටිව පැවති අතර එයින් එ.ජ. ඩොලර් 2,092,466 ක් වසරකට වැඩි කාලයක සිට හිඟහිට පැවතුණි. මෙම හිඟ ආදායම් කාලීනව අයකර ගෙන නොතිබුණි.

2.1.2 ආදායම් සංකේතාංක 10.03.07.05 පුපුරණ ද්‍රව්‍ය හා අනෙකුත් ගාස්තු ආදායම

(අ) පුපුරණ ද්‍රව්‍ය හා අනෙකුත් ගාස්තු ආදායමෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.1,920,650 ක් හිඟ හිටිව පැවති අතර එයින් රු.864,800 ක් වසර දෙකකට වැඩි කාලයක සිට හිඟහිට පැවති අතර හිඟ ආදායම් අය කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128(2)(ඒ) හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි ආර්ථික තත්වයේ වෙනස්කම් සැළකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වුවත් 1966 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන තුවක්කු බලපත්‍ර ගාස්තු කාලීනව සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය තුළදීද සිදු කර නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

2.2.1 වියදම් වැඩසටහන්ගත කිරීමේදී, අනුමත කරනු ලබන අරමුදල් මුදල් වර්ෂය තුල සාක්ෂාත් කරගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික වීම් ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම් වුවත් වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලසාගෙන තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය නොකළ අවස්ථා මෙන්ම ඌණ ලෙස උපයෝජනය කළ අවස්ථාද පැවති බව නිරීක්ෂණ විය. එය මුදල් රෙගුලාසි අංක 04 හි සඳහන් නියමයන් පටහැනි බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) මූලධන වැය විෂයයන් 19ක් සඳහා සලසා තිබුණු එකතුව රු 652,684,900 ක ප්‍රතිපාදනද, පුනරාවර්තන වැය විෂයයන් 20 ක් සඳහා සලසා තිබුණු එකතුව රු 217,599,602ක ප්‍රතිපාදනද ඉතිරිවී පැවතිණි. තවද මු. රෙ. 66 යටතේ රු.113,987,000 ක වෙනත් වැය විෂයන්ට මාරු කිරීමෙන්ද අනතුරුවද මෙම පුනරාවර්තන වැය විෂයයන්ගේ ඉතිරිවීම් පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. මෙම ඉතිරිවීම් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 25 ත් සියයට 99 ක් අතර පරාසයක පැවතිනි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සලසාගෙන තිබූ රු. 157,500,000 ක පරිපූරක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. එසේම තවත් එක් ප්‍රාග්ධන වැය විෂයක් සඳහා සලසා ගෙන තිබූ රු. 131,000,000 ක පරිපූරක ප්‍රතිපාදනයෙන් 86% ක් හෙවත් රු. 112,208,353 ක් ඉතිරිවී තිබුණි.

(ඇ) වැය විෂයන් 22 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 17,450,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

2.2.2 මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු අතර, එම ඇස්තමේන්තු පදනම්කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්කට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතුවේ. පහත නිරීක්ෂණ හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(අ) එකතුව රු 4,600,000 වූ පුනරාවර්තන වැය විෂයයන් 02 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයන්ට මාරු කර තිබීම.

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වැය විෂයයන් තුනකට සලසා තිබුණු රු.18,000,000 ප්‍රතිපාදනය මෙන් දෙගුණයකට අධික ප්‍රතිපාදන හෙවත් රු. 42,078,000 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයන්ගෙන් මාරු කර ගෙන තිබීම.

(ඇ) මූලික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා නොමැති වැය විෂයකට රු. 969,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කර ගෙන තිබීම.

2.3 අනාන්වික සීමා පැනවීම

2.3.1 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2021 අයවැය ඇස්තමේන්තු මඟින් පනවා තිබූ සීමාවන් හා සමාලෝචිත වර්ෂයට අදාල තථ්‍ය අගයන් සැසඳීමේදී අවම ලැබීම් සීමාවට ලහාවී නොතිබුණු අතර අවම ලැබීම් සීමාව රු. 223,000,000 ක් වුවද තථ්‍ය ආදායම රු. 79,227,522 ක් වූයෙන් අවම ලැබීම් සීමාව තථ්‍ය ආදායම සමඟ සැසඳීමේදී අනාත්විික බව නිරීක්ෂණය විය.

මෙම ඇස්තමේන්තු සංශෝධනය කරන ලෙස අමාත්‍යාංශය විසින් ඉල්ලීමක්කර ඇතත් 2022 ජුනි 15දින විටත් මෙම සීමා සංශෝධනය කල බවට වාර්තා නොවුණි.

2.3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වන සීමාවන් සංශෝධනය කරන ලෙසට අමාත්‍යාංශය විසින් 2021 පෙබරවාරි 01 දින ඉල්ලීමක් කර තිබුණද 2022 මැයි 15 දින වන විටත් මෙම සීමා සංශෝධනය කර නොතිබුණි. එහෙත් A.C.A- 5 ආකෘතියේ වාර්ෂික ඇස්තමේන්තුවල දැක්වෙන සීමාවන් වෙනුවට සංශෝධන අයදුම්කල සීමාවන් දක්වා තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් සුදුසු හෙලිදරව් කිරීමක් ගිණුම්වල සිදුකර නොතිබුණි.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2.4.1 මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සටහන් අංක (iii) හා (iv) අනුව 2021 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම් වල එකතු වටිනාකම රු.2,287,685,069 ක් ලෙස දක්වා තිබුණු අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැරකම් ප්‍රමාණය රු. 1,218,883,761 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය වන බැඳීම් හා බැරකම් ප්‍රමාණය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැඳීම් හා බැරකම් ප්‍රමාණය අතර රු. 1,068,801,308ක වෙනසක් නිරීක්ෂණය විය.

2.4.2 මුදල් රෙගුලාසි 94 අනුව වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදන සලසා ඇත්නම් විනා වැඩක්, සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව දක්වා ඇති අතර 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුලදී මුදල් ගෙවා නිදහස් කල යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ මුදල් වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතුව ඉදිරියට ගෙන නොයා යුතු බවත් සඳහන් වේ. එසේ වුවත් අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 4කට අදාළව රු. 4,216,773 ක බැරකම් වලට බැඳී තිබෙන බව නිරීක්ෂණය විය.

2.4.3 2022 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂණයේදී 2021 වර්ෂයට අදාළ එකතුව රු.8,590,715 ක් වූ වියදම් 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.8,590,715 ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය-4.2.3 වගන්තිය.	ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සපයා ස්ථාපනයකිරීම පිලිබඳ ප්‍රසම්පාදනයට අදාලව කෙටුම්පත් ලංසු ලේඛණ පරීක්ෂාවේ සිට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්නය කිරීමේ අධියර දක්වා අනුමත කාලය දින **147** ක් වුවත් ඒ සඳහා දින **306** ක් ලබා ගැනීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් අතිරේක දින **159** ක කාලයක් වැයකර තිබුණි.
(ආ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක **PED/RED**/2015/8/පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01.	ස්ථාන මාරුවී ගොස් ඇති, මියගිය සහ විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති, සේවය හැර ගිය සහ වෙනත් නිලධාරීන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 3,786,841 ක් වූ අතර එම ණය ශේෂය තුල ඇතුළත් වසර 5කට වැඩි ණය ශේෂය රු.1,445,483 ක් විය. මෙම කල්ගතවූ ණයශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	

i. මුදල් රෙගුලාසි 104(3)	පාඩුවක් හෝ අලාභහානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ඇරඹිය යුතු අතර පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 7කට වැඩි ප්‍රමාදයක් සිදුවේනම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම ලබා ගතයුතු වුවත් රථවාහන අනතුරු සම්බන්ධ ප්‍රාරම්භක වාර්තා ලබාගැනීම මාස 3 සිට මාස 15 දක්වා කාල පමාවකින් පසුව සිදුනළ අවස්ථා පැවතුණි.
ii. මුදල් රෙගුලාසි 384 හා 390	මුදල් රෙගුලාසි මගින් දැක්වෙන පාලන පිලිවෙත් කෙරේ අවධානය යොමු කරමින් චෙක්පත් භාවිතා කලයුතු වුවත් ජාතික ශිෂ්‍යාබට බලකාය විසින් අපරික්ෂාකාරී ලෙස චෙක්පත් භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. චෙක්පත් 300 ක් නියැදියක් පරීක්ෂාවේදී චෙක්පත් 89 ක් හෙවත් සියයට 30 අපරික්ෂාකාරී භාවිතාව හේතුවෙන් භාවිතයට ගත නොහැකි වී තිබුණි.
iii. මුදල් රෙගුලාසි 715(2)	අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසිවලට පටහැනිව නිසි අනුමැතිය රහිතව භාණ්ඩ නිකුත්කර තිබුණු අවස්ථා 67 ක් ද නිකුත් කරනු ලබන භාණ්ඩ ප්‍රමාණය නිශ්චිතව දක්වමින් ගබඩා බාරකරු අත්සන් නො කළ අවස්ථා 86 ක්ද, භාණ්ඩ ලබා ගන්නා පුද්ගලයා භාණ්ඩ භාරගත් බවට නඟවුරු කරගෙන නොතිබූ අවස්ථා 58 ක් නියදි පරීක්ෂාවෙදි නිරීක්ෂණය විය.
iv. මුදල් රෙගුලාසි 715(2) (ආ)	භාණ්ඩ විධිමත්ව භාරයේ තබා ගැනීම, ඒවා මනා තත්වයෙන් පවත්වා ගැනීම සහ ඕනෑම අවස්ථාවකදී ඒවා තිබෙන තැන් පහසුවෙන් සොයා ගෙන හරිවැරදි බැලිය හැකිවන පරිද්දෙන් ක්‍රමානුකූලව පෙල ගැස්වීම ආදිය යුතු වුවත් අමාත්‍යාංශයේ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාව ඉතා අවධිමත් තත්වයක පැවතුණි.
v. මුදල් රෙගුලාසි 715 (3)	ගබඩා නිලධාරීන් විසින් ගබඩා භාරකරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම, ගබඩා භාරකරුවන්ගේ වාර්තාවල, රෙජිස්ටර්වල සහ ගිණුම් වල හරිවැරදි බැලීම හෝ ඔවුන් වෙත ඇති තොගවල හරිවැරදි බැලීම සිදු කලයුතු වුවත් අමාත්‍යාංශයේ පාරිභෝජ්‍ය

	ද්‍රව්‍ය ගබඩාව හා ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථාන ගබඩාව සම්බන්ධයෙන් එවැනි අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.
vi. මුදල් රෙගුලාසි 754	සෑම මුදල් වර්ෂයක් අවසානයේ දීම තොග පොත් තුලනය කලයුතු වුවත් අමාත්‍යාංශයේ හා ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ තොග පොත් තුලනය කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.
vii. මුදල් රෙගුලාසි 755 (1)	ගබඩාකරුවකු මාරුවන අවස්ථාවකදි ඔහු විසින් ඔහුගේ අනුප්‍රාප්තිකයාට තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපල භාර කර ඒවා භාරදෙන ලද නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගතයුතු වුවද අමාත්‍යාංශයේ ගබඩාව සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණු අතර ගබඩා භාරකරු වෙත නිසි උපදෙස් ලබාදීම හෝ නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.
viii. මුදල් රෙගුලාසි 1646	සෑම මසක් අවසන්වීමෙන් පසු ඊලඟ මාසයේ 15 දිනට පෙර දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සටහන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කල යුතු වුවද අමාත්‍යාංශයේ සහ ජාතික ශිෂ්‍යභට බලකායේ වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් හා සාරාංශ සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ වැඩපිලිවෙලක් ක්‍රියාත්මකර නොතිබුණි.
ix. මුදල් රෙගුලාසි 1647(ඉ)	වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන සම්බන්ධ තොරතුරු ඇතුළත් වාහන ලේඛණයක් නඩත්තු කළයුතු වුවත් එවැනි ලේඛණයක් පවත්වාගෙන නොතිබුණු අතර වාහන පැවරීම් පිලිබඳ නිශ්චිත තොරතුරු වාර්තාගතව නොතිබුණි.
x. මුදල් රෙගුලාසි 1653	මෙම රෙගුලාසියේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා වාහනයේ මයිලෝ මීටරය ක්‍රියාත්මකව පැවතිය යුතු වුවත් අමාත්‍යාංශයේ වාහන 06 ක් ද, ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ වාහන 13 ක් ද මයිලෝ මීටර ක්‍රියා විරහිතව පැවතුණි.

(ඇ)	අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචිය අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරා දීමට හෝ එහි දැක්වෙන අනෙකුත් උපදෙස් මත කටයුතු කළ යුතු වුවද, අමාත්‍යාංශය හා ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් භාවිතා කරනු ලබන වාහන 36 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.
(ඉ)	අංක 02/2020 හා 2020.08.28 දිනති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	තම ආයතනයට පැවැරී ඇති කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ පිටපතක් විගණකාධිපති වෙත යොමුකල යුතු වුවද ජාතික ශිෂ්‍යභට බලකාය ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඊ)	අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	නිශ්චිත කාලසීමාවක් හෝ ධාවන කිලෝමීටර් සංඛ්‍යාව හෝ අඑත්වැඩියාවන් පදනම්කර ගනිමින් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකල යුතු අතර ඉන් අනතුරුව ඒ ඒ වාහනයේ ඉන්ධන භාවිතය පිලිබඳ තොරතුරු ඇතුළත් ආකෘතියක් මත සටහන් පවත්වා ගත යුතු වුවත්, ජාතික ශිෂ්‍යභට බලකායේ වාහන සම්බන්ධයෙන් එවැනි ඉන්ධන පරීක්ෂාවක් හෝ ලේඛණ පවත්වාගැනීමක් සිදුකර නොතිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) මුදල් රෙගුලාසි 395 (ඇ) පරිදි බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගනුදෙනු නත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවත් ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත පරිදි පිළියෙල කර හෝ සහතික කර හෝ නොතිබුණි.

(ආ) ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය විසින් නිකුත් කල නමුත් මාස 6 කට වැඩි කාලයක් තුල ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.7,098,659 ක් වටිනා චෙක්පත් 53 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් ලියන ලද නමුත් නිකුත් කර නොතිබුණු රු.260,636 ක් වටිනා චෙක්පත් 15 ක් පැවති අතර මූල්‍ය ප්‍රකාශන වල සටහන viii ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31

දිනට නිකුත් කල නමුත් බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් වල වටිනාකම රු. 260,636 කින් සහ මාස 6 ඉක්මවූ චෙක්පත් වල වටිනාකම රු48,947 කින් වැඩියෙන් දක්වා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මත සලසා ඇති ප්‍රතිපාදනය රු. මිලියන 10,000 ක් වුවත් අමාත්‍යාංශය විසින් පිළියෙලකර තිබුණු 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රමුඛතා අදියර 08 ක් යටතේ පිරිවැය රු. මිලියන 17,848 ක්වූ ප්‍රසම්පාදන කාර්යන් 404 ක් සැලැසුම්කර තිබුණි. කෙසේ වෙතත් මෙම සැලැසුම් වාර්ෂික අයවැය ප්‍රතිපාදනය පදනම්කර ගනිමින් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය

---

i. ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ප්‍රමුඛතා අධියර 02 සිට 07 දක්වාවූ අදියරයන් මඟින් කොන්ත්‍රාත් කාර්යන් 275 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගැනීමට සැලැසුම්කර තිබුණු නමුත් 2021දෙසැම්බර් 31 දිනට එම කොන්ත්‍රාත් කාර්යන්ගෙන් කාර්යයන් 85 ක් කිසිදු භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොමැති බවත් කාර්යන් 58 ක ප්‍රගතිය සියයට 1 ක් 30 ක් අතර පහල අගයක පවතින බවත් නිරීක්ෂණය විය.

ii. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, නිලධාරී සහ සෙසු නිලයන් සඳහා නවාතැන් පහසුකම් සැපයීමේ නිවාස සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතියේ අධියර 01 සඳහා රු.මිලියන 247.83 ක් උපයෝජනය කිරීමට සැලසුම්කර ඇතත් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 70.97 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම කාර්යන්හි මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් හා භෞතික ප්‍රගතිය සියයට 14 ක් වශයෙන් පැවතුණි.

(ආ) උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

---

i. මූලික සැලසුම් අනුව 2016 වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට යෝජිතව පැවතියද පාරිසරික අනුමැතියන්ගේ ප්‍රමාදයන්, ඉදිකිරීම් ප්‍රමාදයන් හා ප්‍රසම්පාදන ප්‍රමාදයන් ආදිය හේතුවෙන් සැලසුම්ගත කාලසීමාවන් තුළ අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබුණි. ව්‍යාපෘති කාලසීමාව වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත

වර්ෂය අවසන් වනවිට පැවති සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 73 ක සහ සියයට 53 ක පැවති අතර ව්‍යාපෘතිය සැලසුම්ගත කාලපරාසයන් තුළ අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත සන්නද්ධ සේවා අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ මූලික අරමුණ කාලීනව ඉටුකර ගැනීමට තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි.

ii. මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර අවස්ථා කිපයකදී කැඳවන ලද ලංසු අවලංගු කර තිබුණි. 2021 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කාර්යයන් නැවත අරඹා ඇතත් 2021 දෙසැම්බර් 31 වනවිටත් එම කාර්යන්ද ප්‍රසම්පාදන අභියාචනා කමිටු අදියරේ පැවැතිණි. මේ අනුව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වර්ෂ 05 ආසන්න කාලයක් ගතවී තිබුණු අතර එය ව්‍යාපෘති ප්‍රමාදය කෙරෙහි සෘජුවම බලපා තිබුණි.

iii. ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 38.54 ක් වැයකර මිලදීගෙන ස්ථාපනය කර තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් සමගාමී ක්‍රියාවන්ගේ ප්‍රමාදය හේතුවෙන් අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකිව වර්ෂ දෙකකට ආසන්න කාලයක් තුළ නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 562.16 ක් වැයකර 2020 වර්ෂයේදී නිමකර තිබුණු සන්නිවේදන කුළුණු 11 සහ එයට සම්බන්ධිත උපාංග මැදිරි තවදුරටත් අදාල ව්‍යාපෘති අරමුණු සඳහා උපයෝගී කර ගැනීම ප්‍රමාද වෙමින් පැවැති අතර කුලුණුවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 05 ක වියදමක් දැරීමට අපේක්ෂිත විය.

(ඇ) ජාතික ශිෂ්‍යබට බලකායේ රන්වැඹේ පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගැනීමට අදාල ප්‍රතිපාදනය වූ රු. 5,997,121 සමාලෝචිත වර්ෂය තුළදී යුද්ධහමුදා වැය ශීර්ෂයට මාරුකර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දිනට රු. 2,448,916 ක් පමණක් වැයකර තිබුණි. 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිකිරීම් 2021 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් මේ සඳහා 2022 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින්ද ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු සිදුකිරීම අවිනිශ්චිතව පැවති අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මූලික අදියරේ පවතුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) පරිදි වටිනාකම රු.500,000 ඉක්මවන භාණ්ඩ සැපයුම් කොන්ත්‍රාත් සඳහා ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් එම සීමාව ඉක්ම වූ ආයතන 04 සමඟ ගිවිසුම්වලට එළඹීමකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 අ ඡේදය අනුව සියළු ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබා තිබිය යුතු වුවත් ලැප්ටොප් පරිගණක 13ක් මිලදිගැනීමේ දී එවැනි කමිටුවක නිර්දේශ ලබාගැනීමකින් තොරව මිලදීගැනීම් සිදුකර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.7 ඡේදයට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සලකා බැලීමකින් තොරව පරිගණක 19 ක් මිලට ගෙන තිබුණි.

(ඇ) අංක 01/2016 හා 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය වක්‍රලේඛයෙහි 2.3 ඡේදය අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තරහකාරී මිල ගණන් කැඳවිය යුතු වුවද 2018 මාර්තු 16 දින මෝටර් රථ 08 ක් සහ ඩබල් කැබරථ 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගැනීම සඳහා ලැබී තිබුණු එකම ලංසුව මත පදනම්ව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂ පහක් වෙනුවෙන් සිදුකල රු. 98,300,940 ක්වූ මෙම ගණුදෙනුව සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අපේක්ෂිත තරහකාරී මිලගණන් ලබා ගැනීමකින් සිදුකර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 හි සඳහන් පරිදි, ලබාගන්නා ලංසු සුරක්ෂණයක් අවලංගු කළ නොහැකි සහ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කරනු ලබන ප්‍රථම ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් ඛවට පරිවර්ථනය කළ හැකි විය යුතු වුවද ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානයේ මුද්‍රණ යන්ත්‍ර 20 ක් හා පරිගණක යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා වන ලංසු සුරක්ෂණය වශයෙන් රු. 46,000 ක චෙක්පතක් ලබාගෙන තිබුණි. ලංසු සුරක්ෂණයක් ඉදිරිපත්කිරීම අවශ්‍ය බවට ලංසු ලේඛණවල දක්වා ඇති විටක එය ඉදිරිපත් නොකිරීම ප්‍රධාන බැහැරවීමක් ලෙස සලකා ලංසුව ප්‍රතික්ෂේප කල යුතු වුවද ලංසුව සමඟ ඉදිරිපත්කර තිබුණු රු. 46,000 ක චෙක්පත ලංසු සුරක්ෂණයක් ලෙස සලකා එම ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනට අනුකූලව සහ ලංසු වලංගු කාල සීමාව තුලදී කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකල යුතු අතර එසේ නොවන අවස්ථාවක ලංසුවේ වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කරගැනීම කල යුතු වුවත් ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධති සපයා ස්ථාපනයකිරීම පිලිබඳ ප්‍රසම්පාදනයේ දී ලංසු වලංගු කාලය සහ ලංසු සුරක්ෂණයේ වලංගු කාලය අවලංගුවී තිබුණද කාල දීර්ඝකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) අමාත්‍යාංශය විසින් මිලදීගනු ලබන ටෝනර් හා ලිපිදව්‍ය ඇතුළු පරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතමයන්හි තොග ලැබීම්, තොග නිකුත් කිරීම් හා තොග ශේෂය දැක්වෙන පරිදි තොග පොත් විධිමත්ව පවත්වා නොතිබීම හා මහා අධීක්ෂණයක් පවත්වා නොතිබීම හේතුවෙන්

කිසියම් දිනකට පවත්නා පොත් ශේෂය හා තත්‍ය ශේෂය අර්ථාන්විත සැසඳීමකට ලක්කළ නොහැකි විය. එසේම

පරිභෝජ්‍ය ද්‍රව්‍ය නිකුත් කිරීමට අදාල පාලන පිළිවෙත් අනුගමණය නොකිරීම හෝ නොසලකා හැරීම හේතුවෙන් සමාලෝචිත කාලය තුල සිදුකල තොග නිකුත් කිරීම් සනාථ කරගත නොහැකි විය. විගණන නියැදි තොග ශේෂ ආගණනයකදී 2021 ජනවාරි 01 දිනට පැවති තොග ශේෂය, 2021 නොවැම්බර් 30 දක්වා කාලය තුල සිදුකල මිලදී ගැනීම් ද එම කාලය තුළ සිදුකළ නිකුත් කිරීම් පිලිබඳව ඉදිරිපත්කළ දත්ත මත පදනම්ව සිදුකළ විගණන නියැදි තොග ශේෂ ආගණනයකදී ටෝනර් වර්ග හතරකට අදාල ඒකක 122 ක් හා ලිපිද්‍රව්‍ය අයිතම දෙකකට අදාල ඒකක 2092 ක් නිකුත්කළ බවට සනාථවන ලේඛණ හෝ භෞතික තොග ශේෂඉදිරිපත් නොවුණි. සමාලෝචිත කාල පරිඡේදය තුල එම අයිතම මිලදී ගැනීමේදී ගෙවා තිබුණු මිලගණන් වල කළ බරතැබූ සාමාන්‍ය මිල අනුව ඉදිරිපත් නොකළ තොගයේ පිරිවැය රු.12,173,527 ක් විය.

(ආ) 2021 වර්ෂය තුලදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.9,798,905 ක් වූ ටෝනර් 516 ක් සහ , පිරිවැය රු.43,500 ක් වූ අනුපිටපත් කඩදාසි (Duplication paper –A4) පැකට් 100 ක් ද ගබඩාවට ලැබුණු බවට තොග ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. තවද මෙම ටෝනර් තොගයෙන් ටෝනර් 372 ක් සඳහා තොග ලේඛණයක් පවත්වාගෙන ඇතත් , පිරිවැය රු. 2,117,265 ක්වූ ටෝනර් 144 ක් වෙනුවෙන් තොග ලේඛණයක්ද පවත්වාගෙන නොතිබුණි. ඒ අනුව මෙම තොග සත්‍ය වශයෙන් ගබඩාවට ලැබුනේද යන්න අනාවරණය කරගත නොහැකි විය.

(ඇ) අළුත්වැඩියා කටයුතු සඳහා විවිධ ආයතන වෙත යොමුකර තිබුණු වාහන 7 ක් සාධාරණ කාලසීමාවක් තුළ අළුත්වැඩියාවන් නිමකර නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මාස 3සිට මාස 10 ත් අතර කාලයක් නිෂ්ක්‍රීයව රඳවා තැබීම හේතුවෙන් වත්කම් ඌන උපයෝජනය වන බව නිරීක්ෂණය විය.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 පරිදි ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වන අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇති අලාභ හානි පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේදී සිදුව තිබුණු ගිනි ගැනීමන් හේතුවෙන් ත්‍රිවිධ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියට අයත් රු. 12,312,766 ක් වටිනා වත්කම් අලාභහානියට පත්ව තිබුණු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීම හෝ පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවෙමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ත්‍රිවිධ හමුදා මූලස්ථානය ව්‍යාපෘතියට අයත් රු.1,959,660 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් ගිනි ගැනීම පිළිබඳව පරීක්ෂණ මණ්ඩලයක් පත් කර මාස 6 කට අධික කාලයක් ගතවී ඇතත් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම අලාභය සිදුවී මාස 3ක් ඇතුලත පිළියෙල කල යුතු මු.රෙ.104(4) වාර්තාව ඉදිරිපත් කිරීමටද කටයුතු කර නොතිබුණු හෙයින් අලාභය සම්බන්ධව වගකිවයුතු පාර්ශව හඳුනාගැනීම ප්‍රමාද වෙමින් පැවතුණි.

3.6 අනාර්ථික ගනුදෙනු

ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වැලි කියුබ 1530 ක් මිලදීගැනීම සඳහා රු. 1,057,700 ක් ත්‍රිකුණාමලය දිසා වන කාර්යාලය වෙත ගෙවීම් කර වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී ඇතත් වැලි තොගය ලබාගැනීමට හෝ අදාල මුදල අයකරගැනීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම, ණයවර ලිපි සඳහා භාණ්ඩාගාර අනුමැතිය ප්‍රමාදවීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා කැබිනට් අනුමැතිය ප්‍රමාදවීම හා මිල ගණන් නැවත කැඳවීමට තීරණය වීම ආදී කරුණු හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝකිරීමට සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු විසින් රු.1,126,141,457 ක් හා එක්සත් ජනපද ඩොලර් 1,606,201 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 24 ක් ඉල්ලුම් කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශය විසින් ඉදිරිපත්කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා එදිනට පැවති පුරප්පාඩු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
		ආරක්ෂක අමාත්‍යාංශය		
ජ්‍යෙෂ්ඨ මට්ටම	75	59	16	1
තෘතියික මට්ටම	08	06	2	-
ද්විතියික මට්ටම	230	239	35	44
ප්‍රාථමික මට්ටම	140	114	26	-
එකතුව	453	418	79	45
		රාජ්‍ය බුද්ධි සේවය		
ජ්‍යෙෂ්ඨ මට්ටම	35	40		05
තෘතියික මට්ටම	69	113	-	44
ද්විතියික මට්ටම	1091	2042	-	951
ප්‍රාථමික මට්ටම	44	42	2	-
අනියම්	25	-	25	-
කොන්ත්‍රාත්	-	9	-	9
එකතුව	1264	2246	27	1009
		ජාතික ශිෂ්‍යභට බලකාය		
ජ්‍යෙෂ්ඨ මට්ටම	02	-	02	
තෘතියික මට්ටම	04	-	04	
ද්විතියික මට්ටම	21	03	18	
ප්‍රාථමික මට්ටම	136	93	43	
අනියම්	50	49	01	
එකතුව	213	145	68	

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශයේ තනතුරු 79 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් තනතුරු 16 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් තනතුරක හා සංවර්ධන නිලධාරී තනතුරු 44 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) ජාතික ශිෂ්‍යභට බලකායේ නනතුරු 68 ක් පුරප්පාඩුව පැවති අතර ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තූනතුරු පුරප්පාඩු හේතුවෙන් මූල්‍ය පාලන හා ආයතනික පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීම කෙරේ අහිතකරව බලපා තිබුණි.

පී.එල්.කේ. පෙරේරා
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
පරිපාලන අංශය			
අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දුන් දේශීය පුහුණු වැඩසටහන් ගණන	-	-	50%
රණවිරුවන් සඳහා බෙදා හරින ලද ඉඩම් ගණන	90%	-	-
මූල්‍ය අංශය			
මුදල් අවශ්‍යතාවය පුරෝකථනය හා ඉල්ලුම් කිරීම	100%		
බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීම	100%		
වවුචර් සහතික කිරීම සහ ගෙවීම	100%		
වැය ලෙජර හා මුදල් පොත් නඩත්තු කිරීම හා තුලනය කිරීම	100%		
මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා භාරදීම	100%		
භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳීම	100%		
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	100%		
සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය			
ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම		85%	
පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර / බලපත්‍ර නිකුත් කිරීම හා අනුමැතිය ලබාදීම	100%		
අන්තරායකාරී බහාලුම් සහිත නැව් සඳහා අවසරපත්‍ර ලබාදීම	100%		
සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු සඳහා අවසරපත්‍ර ලබාදීම	100%		
තාක්ෂණ අංශය			
ආරක්ෂක මූලස්ථාන ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය		78.59%	
උපාය මාර්ගික සන්නිවේදන ජාල ව්‍යාපෘතිය			73%
පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති අංශය			
ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ කාර්යභාරයන් පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම	100%		
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ආරක්ෂක විෂය පථයට අදාල නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම	100%		
ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතනවලට අවශ්‍ය ඉඩම් අත්කර/ පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම		80%	
අමාත්‍යාංශ විෂය පථයට අදාලව ප්‍රතිපත්ති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු හා දක්ත සැපයීම හා යාවත්කාලීන කිරීම	90%		
හමුදා සම්බන්ධීකරණ අංශය			
ආරක්ෂක අමාත්‍යාංශයෙහි ආරක්ෂාව සම්බන්ධ කටයුතු කිරීම.	100%	-	-
රටෙහි ඇතිවන විවිධ තත්වයන් යටතේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති වෙත ආරක්ෂක ලේකම්තුමා විසින් ලබාදෙන උපදෙස් ලබාදීම.	100%	-	-

විදේශීය තානාපති කාර්යාලවල සේවයේ නියුතු ආරක්ෂක උපදේශකයින් සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම සහ අවශ්‍ය අනෙකුත් සම්බන්ධීකරණ.	100%	-	-
ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන ත්‍රිවිධ හමුදා අයවලුන්ගේ ආරක්ෂක නිශ්කාශන ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා උත්සව/පෙලපාලි සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා තූර්යවාදන කණ්ඩායම් ලබාදීම	95%	-	-
ත්‍රිවිධ හමුදාවන් විසින් අරමුදල් වලින් කරන ව්‍යාපෘති	100%	-	-
වැදගත්කමින් යුතු ස්ථාන වල රූගත කිරීම්/ ඡායාරූප ගතකිරීම් සඳහා අවසර ලබා දීම.	95%	-	-
ටෙලිනාට්‍ය, වෙළඳ දැන්වීම්, චිත්‍රපට සඳහා ත්‍රිවිධ හමුදා නිලඇදුම්/ උපකරණ යොදාගැනීම සඳහා අවසර ලබා දීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා සෙසු නිලයින් සඳහා ත්‍රිවිධ හමුදා නිල ඇදුමින් යුතුව සිවිල් උත්සව සඳහා සහභාගි වීමට අවසර ලබා දීම.	100%	-	-
රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ශ්‍රමදාන වැඩසටහන් සඳහා ත්‍රිවිධ හමුදා පුද්ගලයින් සහභාගි කරවීම.	100%	-	-
විදේශීය දූත පිරිස්/ විදේශීය හමුදා දූත පිරිස් වල සංචාර සම්බන්ධීකරණය කිරීම සහ පිළියෙල කර දීම.	100%	-	-
අතිගරු ජනාධිපතිතුමා සහභාගිවන රාජ්‍ය උත්සව සඳහා අධිසභායකයින් ලබාදීම.	100%	-	-
ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන සහ ත්‍රිවිධ හමුදාව සමග සම්බන්ධතාවයෙන් ආපදා කළමණාකරණය සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම.	100%	-	-
විදේශීය දූත මෙහෙවරෙහි යෙදෙන විදේශීය නිලධාරීන් සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම.	100%	-	-
විදේශීය යුධ ගුවන් යානා සහ නාවික යාත්‍රා සඳහා ආරක්ෂණ නිශ්කාශන ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදාව වෙතින් ලබාගන්නා සේවාවන් සඳහා විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙතින් කෙරෙන ඉල්ලීම් වලට පිළිතුරු ලබා දීම.	100%	-	-
විවිධ භාණ්ඩ, ගුවන් යානා, නාවික කොටස් සඳහා රේගු නිශ්කාශන ලබාදීම සඳහා ආරක්ෂක නිශ්කාශන ලබා දීම.	100%	-	-
ජල ස්කූටර්, ජෙට් ස්කී ආනයනය හා අපනයනය කිරීම සඳහා ආරක්ෂක නිශ්කාශන ලබාදීම.	100%	-	-
යුද්ධ ගුදම් නැවිගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම.	100%	-	-
ගුවන් තොටුපල/ වරාය/ ත්‍රිවිධ හමුදා සංකීර්ණ/ අධි ආරක්ෂිත කලාප සඳහා සංචාරය කිරීම සඳහා අවසර ලබාදීම.	100%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන්/ රාජ්‍ය නිලධාරීන් සමග පවත්වන රාජතාන්ත්‍රික හමුවීම් සම්බන්ධීකරණය කරදීම.	100%	-	-
ආගමික ස්ථාන හා රාජ්‍ය ආයතන සඳහා ත්‍රිවිධ හමුදා භටපිරිස් ලබා දීම සම්බන්ධීකරණය කර දීම.	100%	-	-
ධීවරයන්, නිතීවිරෝධී සංක්‍රමණිකයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නැවත ඔවුන්ගේ රටවල් වලට භාරදීම ආදී කටයුතු සම්බන්ධීකරණය කිරීම.	100%	-	-
නියමුවන් රහිත ගුවන් යානා ගුවන්ගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම.	95%	-	-
ත්‍රිවිධ හමුදා නිලධාරීන් මාධ්‍ය ඉදිරියේ පෙනී සිටීමට හෝ මාධ්‍ය වෙත ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබාදීම.	100%	-	-
මාළු ඇල්ලීම, සමීක්ෂණ, පිහිණුම් සහ නාවික කටයුතු සඳහා විශේෂිත වූ වෙරළ තීරවල එම කටයුතු සඳහා අනුමැතිය ලබාදීම.	95%	-	-
සඳහිරු සෑය ස්තූපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම.	100%	-	-
ආරක්ෂක ලේකම්තුමා විසින් පවරනු ලබන අමතර රාජකාරීන් ඉටුකිරීම.	100%	-	-

මිලෝදා ආයතනය			
භෞතික ප්‍රගතිය (පුහුණු කරන ලද රජයේ නිලධාරීන් ගණන)	-	-	14%
මූල්‍ය ප්‍රගතිය (වැඩසටහන් ආදායම)	-	-	24%
ජාතික ශිෂ්‍ය භට බලකාය			
ශිෂ්‍යභට කඳවුරු ගතවීම්	-	-	25%
අභ්‍යන්තර විගණන අංශය			
ආරක්ෂක අමාත්‍යාංශය			50%
යුධ හමුදාව			50%
නාවික හමුදාව	100%		
ගුවන් හමුදාව			50%
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	100%		
වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව	100%		
ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය			50%
ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය			50%

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

අ/අ S/No	කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator)	කාර්ය සාධක මිනුම් (Measurement)	ලඟාවූ ඉලක්කයන් (Target/Milestone reached)
1.	**<u>අධ්‍යාපනික දර්ශකයන්</u>** අ. දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන් සහභාගිවන ප්‍රමාණය. ආ. psc සහ (MSc Def & SS) ලබා ගන්නා නිලධාරීන් ප්‍රමාණය. ඇ. පුළුල් පරාසයක් සඳහා වන දැනුම ලබා ගැනීම. **<u>යටිතල පහසුකම් වර්ධනය කිරීම</u>** ඈ. පුහුණු උපකරණ සහ පුහුණු අවස්ථා වැඩි කිරීම.	අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය වර්ධනය. ආ මාණ්ඩලික පාඨමාලාව සමත්වීමේ ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. ඇ. ආරක්ෂක විද්‍යාවේදී (MSc Def & SS) හිමිගැන්වීම ප්‍රතිශතය ක්‍රමිකව වර්ධනය කිරීම. ඈ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධනය කිරීම. ඉ. ජාත්‍යාන්තර සහභාගිත්වය වර්ධනය කිරීම. ඊ. තොරතුරු තාක්ෂණ පහසුකම් සංවර්ධනය කිරීම. උ. පුස්ථකාලයේ කියවීමේ පහසුකම් හා ගුණාත්මක භාවය වර්ධනය කිරීම.	අ. 2021 වර්ෂයේ දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව 145 ක් විය. ආ. උපරිම ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වයක් පවත්වා ගැනිම. ඇ. විදේශීය ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය 18 ක් විය. ඈ. විදේශීය සංචාරය (DDICV) හා බංගලාදේශ අණ හා මාණ්ඩලික විද්‍යාලිය නියෝජිත සංචාරය පැවැත්වීම. ඉ. මාර්ගගත දේශණ හා විභාග පැවැත්වීමට අවශ්‍යය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනිම. ඊ. ශිෂ්‍ය නිලධාරීන් සඳහා පුහුණු පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.මි 7.94 ක වටිනාකමකින් යුත් පුහුණු ආධාරක සහ අනෙකුත් ප්‍රාග්ධන උපකරණ මිලදි ගැනීම සිදුකරන ලදි. උ පුස්ථකාල පහසුකම් වර්ධනය කිරීම.
2.			

පරිච්ඡේදය

5

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු -2021 ආරක්ෂක අමාත්‍යාංශය

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2021 භෞතික ප්‍රගතිය *	2021 වර්ෂයේ ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය **			වගකීම
				0% - 50 %-		75 %-	
1	2	3	4	5			6
තිරසර සංවර්ධන අරමුණු 01 - සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.							
1.1 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයන්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම	1. අඩු ආදායම්ලාභී පවුල් 100,000ක වයස අවු.18- 45 අතර අවම අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණ තරුණියන් හඳුනාගෙන ඔවුන්ට විධිමත් වෘත්තීය පුහුණුවක් ලබාදී ජාතික ආර්ථිකයේ සක්‍රීය හවුල්කරුවන් බවට පත්කිරීම	i. i. සුදුසුකම්ලාභීන් 4,500ක් බඳවා ගැනීම (2021 වර්ෂයේ)	බඳවා ගත් පුද්ගලයින් සංඛ්‍යාව 3,818			90%	බහුකාර්ය සංවර්ධන බලකා දෙපාර්තමේන්තුව
		ii. අදාළ පවුල්වල මාසික ආදායම 20 % කින් වැඩිවීම	මාසික ආදායමේ වැඩිවීම/අර්ධ වාර්ෂික		50%		
	2. තෝරාගත් පවුල්වල අවම අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණ තරුණියන් ජාතික වෘත්තීය සුදුසුකම 3වන මට්ටමින් (NVQ3) සන්නද්ධ කර රැකියාගත කිරීම.	iii. තෝරාගත් තරුණ තරුණියන් 35,000කට වෘත්තීය පුහුණුව ලබාදීම (පළමු අදියර හා දෙවන අදියර ඇතුළත්ව)	පුහුණුව ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව (වාර්ෂික) 29,830			80%	ආරක්ෂක අමාත්‍යාංශයේ පරිපාලන අංශය
	3.දුප්පත්කම තුරන් කිරීම	රණවිරුවන් සඳහා ඉඩම් සැපයීම	බෙදාහරින ලද ඉඩම් කැබලි ගණනට			90%	
	1.විවිධ මහා	i.වාර්ෂිකව වී,	a.වගාකළ අක්කර			76 %	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

2.c සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම.	එලවලු,බඩඉරිගු, කජු, දේශීය අඹ විවිධ ධාන්‍ය, කුළු බඩු,වගා කිරීම. වාර්ෂිකවකිරි,බිත්තර,මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කිරීම.	ගණන/බෝග වශයෙන් අක්කර 2277.5				ශ්‍රී ලංකා යුද්ධ හමුදාව බහුකාර්ය බලකාය
			b.එලදාව කිලෝ ගණන/බෝග වශයෙන්		70 %		
			c.භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කර වටිනාකම රු. 893,069.72		74 %		
	2.අපනයන ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය	ii.වාර්ෂිකව බෝග වගා කිරීම.	a.වගා කරන ලද අක්කර ගණන				සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
			b.නිෂ්පාදිත ප්‍රමාණය බෝග වශයෙන්				ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
			c.අපනයන ආදායම රු.				
	3.දියර කිරි ජීවානුහරණයකිරීම හා දියර කිරි යොදාගනිමින් අගය එකතුකල නිෂ්පාදන හඳුන්වා දීම	iii. දියර කිරි යොදගනිමින් අගය එකතුකල නිෂ්පාදන සංඛ්‍යාවක් හඳුන්වා දුන් දීම	a.ජීවානුහරණය කරන ලද දියර කිරි ලීටර් ගණන - 47909.28			80%	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
			b.අගය එකතුකල කිරි නිෂ්පාදන වටිනාකම රු. 3,832,743.00			80%	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
	4.බිත්තර අවශ්‍යතාවය ලබාදීම	iv. වාර්ෂිකව අවශ්‍යතාවය සපුරාලීම සඳහා යුද්ධ හමුදා ගොවිපලවල ලේයර් සතුන් 25,000 ක් යෙදවීම.	a.නිෂ්පාදනය කරන ලද බිත්තර ගණන - 4176551			80%	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
			b.ලේයර් සතුන් සංඛ්‍යාව - 25,000			100 %	
	5. ශ්‍රී ලංකා ලුණු සංස්ථාව සමග එක්ව නිෂ්පාදනය ආරම්භ කිරීම	v. වාර්ෂිකව ශ්‍රී ලංකා ලුණු සංස්ථාව සමග එක්ව ලුණු නිෂ්පාදනය කිරීම සහ සහනදායී මිලට ලබා දීම.	a.නිෂ්පාදනය කරන ලද ලුණු ප්‍රමාණය - ක්‍රි: ගෑ 67601 b. වාර්ෂිකව විකුණුම් ආදායම රු : 3,298,188.60			75%	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
2.4. 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට	1. අවශ්‍ය කැලෑ සළාක මළු ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නතරකර කැලෑ සළාක මළු නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම	i. වාර්ෂිකව යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩු වෙතින් කැලෑ සළාක මළු නිෂ්පාදනය කිරීම	a.නිෂ්පාදනය කරන ලද කැලෑ සළාක මළු සංඛ්‍යාව - 78975			80%	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
	2.වස විසෙන් තොර ආහාර නිෂ්පාදනයට	ii.වාර්ෂිකව කාබනික පොහොර නිෂ්පාදනය	d.නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර			80%	

හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	දායක වීම		ප්‍රමාණය - මෙට්‍රික්ටොන් 11133.09				
		iii.වාර්ෂිකව කාබනික පොහොර යොදා බෝග වගා කිරීම	c.කාබනික පොහොර යෙදූ වගා භූමි ප්‍රමාණය - 1138.52			100%	
	3. රසායනික පොහොර භාවිතය සීමා කිරීම හේතුවෙන් සියළු යුද හමුදා ගොවිපල කේන්ද්‍ර කර ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය	iv වාර්ෂිකව කොම්පෝස්ට් නිෂ්පාදන කර ශ්‍රී ලංකා පොහොර සංස්ථාව වෙත ලබා දීම	d.නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය - මෙට්‍රික්ටොන් 185.521			90%	
කිරසර සංවර්ධන අරමුණු 03-නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම							
3.4 2023 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකනින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ සහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	1. සාමාන්‍ය ඇඳන් 810කින් හා දැඩිසත්කාර ඇඳන් 70කින් යුත් සර් ජෝන් කොතලාවල (KDU) රෝහල මඟින් ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්ට පමණක් නොව සාමාන්‍ය ජනතාවටද වෛද්‍ය පහසුකම් සැපයීම.	i.බාහිර රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම. ii.නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම iii.දැඩිසත්කාර ඒකක සේවාවන් සැපයීම iv.නේවාසික කොවිඩ් රෝගී ප්‍රතිකාර	a.සාමාන්‍ය දෛනික බාහිර රෝගීන් සංඛ්‍යාව 322 ඇඳන් 188 හා හදිසි ප්‍රතිකාර ඒකකය නිමකර ඇති අතර, දැඩි සත්කාර ඒකකයේ වායු සමීකරණ පහසුකම් ලබාදීමේ කටයුතු සිදුවෙමින් පවතී. b.සාමාන්‍ය දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව 54			75%	සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ශ්‍රී ලංකා නාවික හමුදාව
	2. ඇඳන් 861,දැඩි සත්කාර ඇඳන් 6 කින් හා හදිසි ප්‍රතිකාර ඒකකයේ ඇඳන් 67කින් යුත් නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල මඟින් වෛද්‍ය පහසුකම් සැපයීම (15 මහලකින් යුත් වාට්ටු සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු		c.සාමාන්‍ය දෛනික දැඩිසත්කාර රෝගීන් සංඛ්‍යාව 1 d.මිසකට සැත්කම් සංඛ්‍යාව 14 e.සාමාන්‍ය දෛනික කොවිඩ් රෝගීන් සංඛ්‍යාව 10 15 මහලකින් යුත් වාට්ටු සංකීර්ණයෙහි ඉදිකිරීම්			100 %	

	මූලික මට්ටමේ පවතියි)		කටයුතු මූලික මට්ටමේ පවතියි)				
	3. ඇඳන් 188,දැඩි සත්කාර ඇඳන් 9 කින් හා හදිසි ප්‍රතිකාර ඒකකයේ ඇඳන් 4 කින් යුත් නාවික හමුදා රෝහල මඟින් වෛද්‍ය පහසුකම් සැපයීම				50%		
	4.නාවික මහ රෝහල (කොළඹ)හි නව කිමිදුම් ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම.	iv.කිමිදුම් ප්‍රතිකාර සඳහා හයිපබරික් ඔක්සිජන් ප්‍රතිකාරය ලබා දීම	d.මසකට සිදුකරන ප්‍රතිකාර සංඛ්‍යාව I. කිමිදුම් ප්‍රථිකාර ඒකකයක් (Diving Treatment chamber) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී. ii. ගොඩනැගිල්ල ඉදිරිකිරීම සඳහා සැලසුම් නිර්මාණය කරමින් පවතී	10%	50%		ශ්‍රී ලංකා නාවික හමුදාව
	5. කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථාන පැවැත්වීම	v.අධි සත්කාර ඒකක පහසුකම් ලබාදීම	e.අතරමැදි මධ්‍යස්ථාන වල කොවිඩ් 19 මාසික නේවාසික රෝගීන් සංඛ්‍යාව -6500 f.ඉදිකිරීම් ප්‍රතිශතය % බිම් මට්ටමේ වැඩ කටයුතු නිම වී ඇත	20%		80%	ශ්‍රීලංකා නාවික හමුදාව ශ්‍රී ලංකා නාවික හමුදාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව
	6.නව හමුදා රෝහල ඉදිකිරීම	vi.පල්ලේකැලේ ඉදිකරනු ලබන යුහ රෝහල ඉදිකිරීම vii.නව ගුවන් හමුදා රෝහල්	g.ප්‍රතිලාබ ලබන අයවළුන් ගණන (ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේ පවතියි) යුද්ධ හමුදා සාමාජිකයින් 32,000 පමණ පවුල් වල සාමාජිකයින් - 100,000 පමණ	40% 40%			ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව
3.5 හානිකර	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම	i. මත්ද්‍රව්‍ය	a.වාර්ෂිකව මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව			90%	ශ්‍රී ලංකා නාවික හමුදාව

ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	වැළැක්වීම	වැටලීම් සිදු කිරීම.	ගුවන් හමුදාව - 1731 යුධ හමුදාව විසින් - 759 නාවික හෙරොයින් - 74 කේරළ ගංජා - 151 දේශීය ගංජා - 16 හශිෂ් - 08 අබිං - 01 අයිස් - 73 මත් පෙති - 08 ගෝඩා - 08 කසිප්පු - 07 මෝදක - 04 කුෂ් - 01				ශ්‍රී ලංකා යුධ හමුදාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව
			b.වාර්ෂිකව වටළන ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණය නාවික හෙරොයින් - කි:ග්‍රෑම් 1268.849 කේරළ ගංජා - කි:ග්‍රෑම් 7095.047 දේශිය ගංජා - කි:ග්‍රෑම් 69.025 හශිෂ් - කි:ග්‍රෑම් 88.455 අබිං - කි:ග්‍රෑම් 0.306 අයිස් - කි:ග්‍රෑම් 158.968 මත් පෙති - ගණනින් 2086 ගෝඩා - ලීටර් 2640 කසිප්පු - ලීටර් 72 මෝදක - ගණනින් 1958 කුෂ් - කි:ග්‍රෑම් 0.027 <u>යුධ හමුදාව විසින්</u> හෙරොයින් - කි:ග්‍රෑ: 3.681 අයිස් - කි:ග්‍රෑ: 3.205 කේරල ගංජා - කි:ග්‍රෑ: 1835.909 අබිං - කි:ග්‍රෑ: 0.5 හෑෂ් - ග්‍රෑ: 10 මත්පෙති ගණන - 23544 යි මත්ගුලි ගණන - 200 යි දුම්වැටි ගණන - 11610 යි දේශීය/විදේශිය මත්පැන් - ලී: 858.700 යි කසිප්පු - ලී: 7489.860 යි			90%	

			ගෝඩා - ලී: 29087.750 යි <u>ගුවන් හමුදාව විසින්</u> අයිස්-ග්‍රෑ.992.15 හෙරොයින් - ග්‍රෑ.2,542.19 කේරල ගංජා-කි.ග්‍රෑ.35.531 ගංජා පැල -62,824 නීති විරෝධී මත්පැන්-ලී.29,356.51 විදේශ මත්පැන් -ලී.1,105.75 නීති විරෝධී දුම්වැටි-276,730 මත්ගුලි-1,608 මාවා-ග්‍රෑ.1,130 මත්පෙති-647				
			c.වාර්ෂිකව අත්අඩංගුවට පත් සංඛ්‍යාව පුද්ගලයින් නාවික හමුදාව විසින් - 493 යුද හමුදාව විසින්-983 ගුවන් හමුදාව විසින් - 470			100 %	
			d.වාර්ෂිකව පුනුරුත්තාපනය කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව-නැත	0%			
		ii. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වවීම.	e.වාර්ෂික දැනුවත් කිරීමේ වැඩසටහන්- සියළුම ආසේමු, රෙම, පුහුණු පාසල් ආවරණය වන පරිදි යුද්ධ සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කර බෙදාහරින ලදී.	30%			සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා නාවික හමුදාව
		iii. රට තුළට මත්ද්‍රව්‍ය ගෙන එන මාර්ග හඳුනා ගැනීම හා බෙදාහැරීමේ ජාල අඩපන කිරීම	f.වාර්ෂිකව හඳුනාගන්නා ලද මත්ද්‍රව්‍ය විදේශීය සම්බන්ධතා සංඛ්‍යාව 03			90%	ශ්‍රී ලංකා නාවික හමුදාව
	8.අන්තරායකර ඖෂධ පාලක		a.බලඇණි මට්ටමින් හා			80%	ජාතික ශිෂ්‍යභට බලකාය

	මණ්ඩලය හා එක්ව පාසල් මට්ටමින් අන්තරාකාරී ඖෂධ හා මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ශිෂ්‍යභට බාලක/බාලිකාවියන්ගේ ප්‍රධානත්වයෙන් කටයුතු කිරීම හා ඒ සඳහා නායකත්වය ගැනීම පුරුදු පුහුණු කිරීම	iii.	ශිෂ්‍යභට බාලක/බාලිකාවියන්ගේ ප්‍රධානත්වයෙන් කටයුතු කිරීම හා ඒ සඳහා නායකත්වය ගැනීම	පළාත් මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 38ක් පවත්න ලදී.				
	9. මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා ඇති අන්තර්ජාතික සබඳතා බිඳ හෙලීම	iv.	වෙරළ නිරීක්ෂණ මධ්‍යස්ථාන මගින් ලංකාව වටා මුහුදු නීරය ආරක්ෂා කිරීම	b.වෙරළ නිරීක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව ධීවර නිරීක්ෂණ මධ්‍යස්ථාන - 24			80%	ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා නාවික හමුදාව
		v.	ගැඹුරු මුහුදේ සිදුවන නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කරන්නන් අත්අඩංගුවට ගැනීම	c.අත්අඩංගුවට පත් පුද්ගලයින්සංඛ්‍යාව- 04			80%	ශ්‍රී ලංකා නාවික හමුදාව
				d.අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව - 06			80%	
		vi.	වෙරළාශ්‍රිතව හා ගැඹුරු මුහුදේ ආවේක්ෂණ කටයුතු තර කිරීම	e.ආවේක්ෂණ කටයුතු සඳහා උපයෝගී කරගත් රේඩාර් සහ යාත්‍රා වේදිකා (vessel platforms) සංඛ්‍යාව				
		vii.	අධි ආරක්ෂිත බන්ධනාගාර ස්ථාපනය කිරීම	f.අධි ආරක්ෂිත බන්ධනාගාර සංඛ්‍යාව				ලේකම්, සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණගරුක හා නීතිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය
		viii.	නව තාක්ෂණික උපකරණ භාවිතා කරමින් මෙහෙයවන මත්ද්‍රව්‍ය ජාවාරම හා සබැඳි කටයුතු වැළැක්වීම	g.සවි කරන ලද දුරකථන ජෑමර් (Jammer) සංඛ්‍යාව				

තිරසර සංවර්ධන අරමුණු 04-පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.								
4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයද ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම	1. වාසික හා වාසික නොවන යන දෙආකාරයෙන්ම විෂය ධාරා ගණනාවකින් උසස් තත්වයේ පර්යේෂණ සමගින් උපාධි අපේක්ෂක, උපාධි හා වෘත්තීය වැඩසටහන් හරහා උසස් තත්වයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලබාදීම	i.	වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාවේ වැඩිවීම	a.වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව • කැඩෙට් නිලධාරීන් සංඛ්‍යාව 211 • දෛනික සිසුන් සංඛ්‍යාව 1644			80%	ඝර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය
		ii.	නව / තාක්ෂණික විෂය ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලා හඳුන්වා දීම	b.අලුතින් හඳුන්වා දී ඇති පාඨමාලා 05				
		iii.	මාර්ගගත ඉගැන්වීමේ පහසුකම් වැඩි දියුණු කිරීම	c.වාර්ෂිකව මාර්ගගත පාඨමාලා මඟින් ආවරණය වන ශිෂ්‍ය ප්‍රතිශතය		-		
4.1 2030 වන විට ඵලදායී ඉගනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැනු හා පිරිමි ළමයින් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික, හා ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම	1. ජාතික පාසල් මධ්‍ය මහා විද්‍යාල සහ මහා විද්‍යාලයන්හි නව ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ ශිෂ්‍යාහට බඳවා ගැනීම.	i.	වාර්ෂිකව පුහුණු කරනු ලබන ශිෂ්‍යාහට සංඛ්‍යාව	a.වැඩි වූ ශිෂ්‍යාහට සංඛ්‍යාව ශිෂ්‍යාහට බඳවා නැවත ලියාපදිංචි කරමින් පවතින අතර 2021වසර වන විට කණිෂ්ඨ ශිෂ්‍යාහට බඳවා 1040 ක් ලියාපදිංචි වී ඇත.පුහුණුව ලබන ශිෂ්‍යාහට බාලක/බාලිකා සංඛ්‍යාව 26,000කි. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහට බඳවා 2531ක් ලියාපදිංචි වී ඇති අතර 2021 වසර වන විට පුහුණුව ලබන ශිෂ්‍යාහට බාලක/බාලිකා සංඛ්‍යාව 63,274කි. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහට බඳවා ලියාපදිංචිය සිදුවෙමින් පවතින අතර නව බඳවා වල ශිෂ්‍යාහටයින් වැඩි සංඛ්‍යාවක් පුහුණුව ලබමින් පවති. පෙරදිග හා අපරදිග තූර්ය වාදන බඳවා සංඛ්‍යාව 250ක් වන අතර ශිෂ්‍යාහට බාලක බාලිකාවන් 6250ක්			100 %	ජාතික ශිෂ්‍ය හට බලකාය
	2. දැනට සිටින කනිෂ්ඨ ශිෂ්‍යාහටයින් සංඛ්‍යාව 35,000 ක් වන අතර එය 50% දක්වා වර්ධනය කිරීම.						100 %	
	3. දැනට සිටින ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාහටයින් සංඛ්‍යාව						100 %	

		65,000 ක් වන අතර එය 50% දක්වා වර්ධනය කිරීම.			2021 වසර වන විට පුහුණුව ලබමින් පවතී. ශිෂ්‍යභට තූර්ය වාදන බෑන්ඩ ලියාපදිංචි වෙමින් පවතී.				
	4.	සෑම පළාතකම පුහුණු පාසලක් ස්ථාපනය කිරීම හා ශිෂ්‍යභට පුහුණුව පවත්වාගෙන යෑම.	ii.	සෑම පළාතකම පුහුණු පාසලක් ස්ථාපනය කිරීම	b.අදාළ පරිසාධන මට්ටම් ප්‍රතිශතය සෑම පළාතකටම පුහුණු පාසලක් සථාපනය කිරීම අත්‍යාවශ්‍ය වන භෞතික හා මූල්‍යමය පහසුකම් නොමැති වීම නිසා ගැටළුවක් පවතී. වයඹ පළාත් පුහුණු පාසල කුරුණෑගල මාස්පොතදී ආරම්භ කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී. මූලික ඉඩම් පවරා ගැනීම්කටයුතු අවසන් වෙමින් ඇති අතර භූමි සංවර්දන කටයුතු සිදු කරමින් පවතී.පෙර නිම් ගොඩනැගිලි දෙකක් ඉදි කිරීමට ආරකෂක අමාත්‍යාංශ අනුමැතිය ලැබී ඇත.	10 %			
					c. පුහුණු පාසල් සංඛ්‍යාව 01(ජාශිබ එකම පුහුණු පාසල රංටැඹේ ස්ථාන ගතව ඇත එම පුහුණු පාසල ශිෂ්‍යභට පුහුණුව සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කරමින් පවතී.)			100 %	
	5.	ශිෂ්‍යභටයින්ට ජාත්‍යන්තර අත්දැකීම් හා දැනුම හුවමාරු සඳහා අවස්ථාව උදා කරදීම.	iii.	වාර්ෂිකව ශිෂ්‍යභටයින් සඳහා වූ විදේශ සංචාර සංඛ්‍යාව	d.වාර්ෂික විදේශ සංචාර සංඛ්‍යාව කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් විදේශ සංචාර අවලංගු වී ඇත.	0%			
	6.	රණවිරු දරුවන් සඳහා	iv.	වාර්ෂිකව ශිෂ්‍යත්ව ලබා	e.වාර්ෂිකව ශිෂ්‍යත්ව ලබා දුන් රණවිරු දරුවන්		50 %		ආරක්ෂක අමාත්‍යාංශය පරිපාලන අංශය

	අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය	දීම	සංඛ්‍යාව				
	7. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් 139 ක ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම	v. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියලුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පුහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම	f.අනුයුක්ත සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව/ වාර්ෂික			99%	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
			g. ආවරණය කළ ශිෂ්‍ය සංඛ්‍යාව/වාර්ෂික			99%	
			h. ආවරණය කළ පාසල් සංඛ්‍යාව/වාර්ෂික			99%	
	8. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුල පෙර පාසල් දරුවන් සඳහා දිවාසුරැකුම් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම.	vi. වර්ෂ 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000 කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබාදීම	i. පෙර පාසල් සංඛ්‍යාව			75%	
			j. පෙර පාසල් දරුවන් සංඛ්‍යාව			75%	
		vii. යෙදවීමට අපේක්ෂිත නිලධාරිණියන් හට විධිමත් පුහුණුවක් ලබා දීම.	k. ඒ සඳහා පුහුණු කරන ලද සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව			75%	
	9. සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන් ගේ පාසල් යන වයසේ සැම දරුවකුටම	viii.වර්ෂ 2025 වන විට සිවිල් ආරක්ෂක බළකා නිළධාරීන්ගේ සහ ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල් වල සියලුම දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම	l. ආවරණය කරන ලද දරුවන් සංඛ්‍යාව			75%	

	අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටලයක් බැඟින් වාර්ෂිකව ලබා දීම						
	10. ළමා ආරක්ෂණය සඳහා සහය දැක්වීම සඳහා, ළමා ප්‍රඥප්තිය ප්‍රවලිත කිරීම සඳහා මාර්ගස්ථ පුහුණු වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.	ix.විෂය නිර්දේශයට සමගාමීව රටේ බලපවත්නා නීති පද්ධතිය පිළිබඳව හා ළමා ආරක්ෂණය සම්බන්ධයෙන්, ළමා ප්‍රඥප්තිය ප්‍රවලිත කිරීම සඳහා ශිෂ්‍යාහට බාලක/බාලිකාවන් දැනුවත් කිරීම.	m. ආවරණය කරන ලද ශිෂ්‍යාහට බාලක/බාලිකාවන් සංඛ්‍යාව කොවිඩ් වසංගත තත්ත්වය නිසා පුහුණු විෂය නිර්දේශය මගපෙන්වීම අනුව පවත්වන ලද මාර්ගස්ථ පුහුණු වැඩසටහන් සඳහා ශිෂ්‍යාහට බාලක/බාලිකාවන් 9500ක පිරිසක් සහභාගිවී ඇත.			100 %	ජාතික ශිෂ්‍යාහට බලකාය
	11. පාසල් බාහිර ක්‍රියාකාරකම් සඳහා ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා අනුගත කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	x. ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සඳහා අනුගත කිරීමට දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් හා මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීම.	n. වාර්ෂිකව කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන සහ නිලධාරීන් ගණන 2021 වසරේ දී ආපදා කළමනාකරණ විෂය පාදක කරගෙන ශිෂයහට බාලක, බාලිකාවන් සඳහා වැඩසටහන් 38ක් බලඇණි මට්ටමින් ක්‍රියාත්මක කර ඇත. මාණ්ඩලික නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආපදා කළමනාකරන මධ්‍යස්ථානය කේන්ද්‍ර			100 %	ජාතික ශිෂ්‍යාහට බලකාය

			කරගනිමින් 2022 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.				
	12. KDU උපාධි පාඨමාලා, Masters, PhDවැඩසටහන්, PGසහතික,PG ඩිප්ලෝමා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	xi.දේශීය උසස් පෙළ හෝ විදේශීය සුදුසුකම් ඇති සහ රටෙහි විවිධ ප්‍රදේශවලින් සිසුන් බඳවා ගැනීම.	o. වාර්ෂිකව ඇතුළත් කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව -2107			100 %	සර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය
	13. KDU උපාධි හදාරන ශිෂ්‍යයන් සඳහා බැංකු මඟින් ශිෂ්‍ය ණය ලබා දීම, නොමිලේ ලැප්ටොප් /WiFi ලබා දීම	xii. KDU ශිෂ්‍ය ප්‍රජාව වෙත සාධාරණ අධ්‍යාපනයක් ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.	p. වාර්ෂිකව ණය ලබා දුන් ශිෂ්‍ය සංඛ්‍යාව -0 q. වාර්ෂිකව ශිෂ්‍යයන් වෙනුවෙන් ලබා දුන් ලැප්ටොප් ගණන-907			75%	
4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	මානව සම්පත් දැනුම සහ කුසලතා පෝෂණය කිරීම	i. වෘත්තීමය වශයෙන් සේවක පුහුණුව ලබා දීම • අමාත්‍යාංශයේ සේවක පුහුණුව • ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවක පුහුණුව • ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවක පුහුණුව • ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවක පුහුණුව • වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු සේවක පුහුණුව ii. රාජ්‍ය සේවක පුහුණු වැඩසටහන්	a.අමාත්‍යාංශයේ පුහුණුව ලත් සේවක සංඛ්‍යාව **<u>විදේශීය පුහුණු</u>** පුහුණුව ලත් නිලධාරීන්-349 පුහුණුව ලත් නාවිකයින්-119 **<u>දේශීය පුහුණු (අභ්‍යන්තර)</u>** පුහුණුව ලත් නිලධාරීන්-469 පුහුණුව ලත් නාවිකයින්-4820 **<u>දේශීය පුහුණු (බාහිර)</u>** පුහුණුව ලත් නිලධාරීන්-566 පුහුණුව ලත් නාවිකයින්-540		50.64%	75% 83.3 %	ශ්‍රී ලංකා නාවික හමුදාව

			ක්‍රියාත්මක කිරීම.	ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් 629 ක් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 204 ක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා - ගජබා රෙජිමේන්තුවට අයත් සෙසුනිලයින් 19 දෙනෙකුට කෙටි කාලීන පුහුණුව ලබාදී ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාව පුහුණුව ලත් නිලධාරීන් - 139 පුහුණුව ලත් ගුවන් හට-204 b.පුහුණු වැඩසටහන් සංඛ්‍යා-75 ගුවන් හමුදා පාඨමාලා c.ආවරණය කරන ලද රාජ්‍ය සේවක සංඛ්‍යාව				ශ්‍රී ලංකා යුධ හමුදාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව
	මානව සම්පත් තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම.	iii.	හඳුන්වාදුන් තොරතුරු පද්ධති නඩත්තු කිරීම.	c.පද්ධති නඩත්තු කිරීමේ ප්‍රගතියේ ප්‍රතිශතය		70 %		ආරක්ෂක අමාත්‍යාංශයේ පරිපාලන අංශය
	3. ශිෂ්‍ය/ස්ථිර නිලධාරීන්ගේ විෂය දැනුම සංවර්ධනය	iv.	ශිෂ්‍ය නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.	d.පුහුණු කරන ලද ශිෂ්‍ය නිලධාරීන් සංඛ්‍යාව තෙදින වැඩමුළුව සඳහා නිලධාරි - 33 සිව්දින වැඩමුළුව සඳහා නිලධාරි -47			75%	ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
				e.මනෝවිද්‍යාත්මක මෙහෙයුම් දියත් කිරීම පිළිබඳ තෙදින වැඩමුළු - 01 සිවිල් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් දියත් කිරීම		70 %		ඒකාබද්ධ සේවා භාෂා පුහුණු මධ්‍යස්ථානය

			පිළිබඳ සිව්දින වැඩමුළු - 01				
	ත්‍රිවිධ හමුදා, පොලිසිය හා පොලිස් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් සඳහා භාෂා පුහුණුව	v. දමිළ භාෂා වැඩසටහන් පැවැත්වීම vi. ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පැවැත්වීම	f.පුහුණු කරන ලද ශිෂ්‍ය නිලධාරීන් සංඛ්‍යාව(ප්‍රතිලාභී ආයතන අනුව)		50 %		ඒකාබද්ධ සේවා භාෂා පුහුණු මධ්‍යස්ථානය
තිරසර සංවර්ධන අරමුණු 06-සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසාර කළමනාකරණය සහතික කිරීම							
6 b. ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගිත්වය , දිරිගැන්වීම සහ සහාය ලබා දීම	1.දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාල ආයතන සමඟ කටයුතු කිරීම	i. ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.	a. පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව -01		63 %		සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය
	2.ජල පෙරන යන්ත්‍ර නිෂ්පාදනය කිරීම	ii.මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා වෛද්‍ය ප්‍රති ආශ්‍රැනිකරණ, කිවුල් ජල ප්‍රති ආශ්‍රැනිකරණ, මුහුදු ජල ප්‍රති ආශ්‍රැනිකරණ ජල පෙරණ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම.	b.නිෂ්පාදනය කරන ලද ජල ප්‍රති ආශ්‍රැනිකරණ ජල පෙරණ යන්ත්‍ර සංඛ්‍යාව වෛද්‍ය ප්‍රති ආශ්‍රැනි ජල පෙරණ පද්ධති - 07 කිවුල් ජල ප්‍රති ආශ්‍රැනිකරණ පද්ධති -82 මුහුදු ජල ප්‍රති ආශ්‍රැනිකරණ ජල පෙරණ පද්ධති - 02			100 %	ශ්‍රී ලංකා නාවික හමුදාව
	3.අපජල පවිත්‍රාගාර ස්ථාපනය කිරීම	iii.පාරිසරික බලපෑම අවම කරමින් ජලය පිරිපහදු කිරීම සහ නැවත භාවිතය සඳහා අපජල පවිත්‍රාගාර ස්ථාපනය කිරීම.	c.ස්ථාපිත ජල පවිත්‍රාගාර - 01			100 %	සර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය
තිරසර සංවර්ධන අරමුණු 09 -සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම							
9.1 ආර්ථික	1.ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතන	i.විවිධ ස්ථානවල පැවති ආරක්ෂක ආයතන එක්	a.ඉදිකිරීමේ ප්‍රගතිය			80%	ආරක්ෂක අමාත්‍යාංශය

සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී කිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	කළමනාකරණ/ පරිපාලන ව්‍යුහය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම.	කේන්ද්‍රයක ස්ථානගත කිරීම(අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානය ස්ථාපනය කිරීම)					
		ii.ත්‍රිවිධ හමුදා මධ්‍යම පතොරම් ගබඩාව හා වානිජමය පුපුරණ ද්‍රව්‍ය ගබඩාව ඉදිකිරීම	b.ඉදිකරන ලද පතොරම් ගබඩා සංඛ්‍යාව / ප්‍රතිශතය (i) පුනානි ගබඩා සංකීර්ණය - 15 (ii) අගුණුවැල්පැලැස්ස ගබඩා සංකීර්ණය - 07 (iii) ගජසිංහපුර ගබඩා සංකීර්ණය - 05 භූගත ගබඩා සංකීර්ණ - 01			90%	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
		iii.උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාලය	c.ව්‍යාපෘතියේ ප්‍රගතිය		50 %		ආරක්ෂක අමාත්‍යාංශය
		iv.යුද්ධ හමුදා රෝහල ඉදිකිරීම	d.ඉදිකිරීම් ප්‍රගතිය	40 %			ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
		v.ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම	e.ව්‍යාපෘතියේ ප්‍රගතිය		50 %		
		vi.තෙමහල් මධ්‍යම අවි ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම	f.ඉදිකිරීම් ප්‍රගතිය	40 %			
		vii.ත්‍රිකුණාමලයෙහි නෞකා තටාකාංගණ ජැටිය ඉදි කිරීම (ෆෙන්ඩර් සහ බොලාර්ඩ් සහිත ජැටිය ඉදිකිරීම)	g.නැව් සඳහා නැංගුරම් පහසුකම් සංඛ්‍යාව	13 %			ශ්‍රී ලංකා නාවික හමුදාව
		viii.ශ්‍රී ලංකා නාවික හමුදාවේ යූඑව්එෆ් වීඑව්එෆ් සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම	h.ව්‍යාපෘතියේ ප්‍රගතිය	25 %			
		ix.මීටර් 110ක් දිගැනි ගැඹුරු මුහුදු නිරීක්ෂන නෞකාවක් මිලදී ගැනීම	i.නාවික හමුදාව සතු ප්‍රදාන නෞකා සංඛ්‍යාව	5%			
		x.මීටර් 45ක් දිගැනි වේග මුර සංචාරක යාත්‍රා 2ක් මිලදී ගැනීම	j.වේග මුර සංචාරක යාත්‍රා සංඛ්‍යාව	5%			
		xi.විද්‍යුත් දෘෂ්‍ය උපකරණ මිලදී ගැනීම	k.ව්‍යාපෘතියේ ප්‍රගතිය	20 %			
		xiiශ්‍රීලංකා නාවික හමුදාව වෙත අත්පත් කර ගැනීමට	l.ව්‍යාපෘතියේ ප්‍රගතිය			65%	ශ්‍රී ලංකා නාවික හමුදාව

		නියමිත දිය මත පාවෙන තටාකංගණයට සමගාමීව ත්‍රිකුණාමලයේ පිහිටි නාවික තටාකංගනයෙහි තාක්ෂණික වැඩපලවල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම					
		xiii.අධිපීඩන ඔක්සිජන් ප්‍රතිකාර (HBOT) කිරීමේ කුටිය(Recompression Chamber)x02 ක් මිලදී ගැනීම.	m.ව්‍යාපෘතියේ ප්‍රගතිය	20 %			
		xiv.අක්වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රාවක්(OPV) සඳහා ප්‍රධාන ආයුධ මිලදි ගැනීම.	n.ව්‍යාපෘතියේ ප්‍රගතිය	5%			
		xv.ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යන්ත්‍රෝපකරණ පරීක්ෂණ සහ අත්හදා බැලීම් ඒකකය Machinery Testing and Trials Unit -MTTU) වැඩි දියුණු කිරීම.	o.ව්‍යාපෘතියේ ප්‍රගතිය		55 %		
		xvi.ස්ථාවර මධ්‍යම පරාසයේ ආයුධ පද්ධති(Stabilized medium range weapon system) ස්ථාපනය කිරීම.(23 MM)	p.ව්‍යාපෘතියේ ප්‍රගතිය	5%			
		xvii.ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා, යාත්‍රා සහ ආයතන වල භාවිතා වන යල්පැනගිය විදුලි සහ විද්‍යුත් පද්ධති, උපකරණ සහ යන්ත්‍රෝපකරන වැඩි දියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම (EOSS 09)	q.ව්‍යාපෘතියේ ප්‍රගතිය			75%	
		xviii. නෞකා සමූහයේ ප්‍රධාන නැව් සඳහා බ්‍රෝඩබෑන්ඩ් සන්නිවේදන පද්ධති (Fleet Broadband Communication system) හඳුන්වාදීම.	r.ව්‍යාපෘතියේ ප්‍රගතිය	25 %			
		xixශ්‍රී ලංකා නාවික පුද්ගලික ස්වයං ශාඛා භූවමාරු	s.ව්‍යාපෘතියේ ප්‍රගතිය	25 %			

		මධ්‍යස්ථානය (PABX) සහ ජාලය වැඩිදියුණු කිරීම.					
		xx.ශ්‍රී ලංකා නාවික හමුදාවේ ක්ෂුද්‍ර තරංග (Microwave Network) සන්නිවේදන ජාලය යාවත්කාලීන කිරීම.	t.ව්‍යාපෘතියේ ප්‍රගතිය	40 %			
		xii.භාවිතා කරන ලද පුහුණු හෙලියානා 04ක් මිලදී ගැනීම	u..මිලදී ගන්නා ලද හෙලියානා සංඛ්‍යාව		50 %		ශ්‍රී ලංකා ගුවන් හමුදාව
	1.ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතන කළමනාකරණ/ පරිපාලන ව්‍යුහය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම.	xiii.100km ක් පියාසර කල හැකි UAV නිරීක්ෂණ යානා ගුවන් හමුදාව නිෂ්පාදනය කිරීම	v.නිෂ්පාදනය කරන ලද ගුවන් යානා ගණන -03			75%	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
	02.ආරක්ෂාව හා ත්‍රස්තවාදයට එරෙහි උපකරණ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය	xiv.වාහන,පුපුරන ද්‍රව්‍ය,සන්නිවේදන උපකරණ හා ඝටන් උපකරණ මිලදී ගැනීම	w.මිලදී ගන්නා ලද උපකරණ සංඛ්‍යාව	40 %			ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
තිරසර සංවර්ධන අරමුණු 11 - නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම							
11.4 ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	1.දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම	i. දිවියින පුරා විහාරස්ථාන සහ පුරාවිද්‍යා ස්ථාන අලුත්වැඩියා, නඩත්තු සහ ආරක්ෂක රාජකාරි සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් යොදවා ගැනීම.	a.නඩත්තු සහ ආරක්ෂක රාජකාරි සඳහා යොදවා තිබූ සාමාජික සංඛ්‍යාව			75%	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
	2.පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම	ii.2030 වර්ෂය වන විට දිවයිනේ සියලුම පුරාවිද්‍යා ස්ථාන වල අලුත්වැඩියා නිම කර ආරක්ෂා කිරීම සඳහා අදාල ආයතන වෙත ශ්‍රමය මූලික සහාය සේවා ලබා දීමට කටයුතු කිරීම.	b.ශ්‍රම බලකායේ සේවය ලබා දුන් විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ගණන			75%	
	3. 2025 වර්ෂය වන විට රජයේ මහා පරිමාණ ඉදිකිරීම් සහ ආගමික	iii. වාර්ෂිකව ඉදිකිරීම් සඳහා අවශ්‍ය ගඩොල් සහන මිලට නිෂ්පාදනය කිරීම.	a.නිෂ්පාදනය කරන ලද ඉංජිනේරු ගඩොල් ප්‍රමාණය		50 %		

	සිද්ධස්ථාන සඳහාත් ඉදිකිරීම් කර්මාන්තයටත් අවශ්‍ය ඉංජිනේරු ගඩොල් මහා පරිමාණයෙන් නිෂ්පාදනය සහ සහන මිලට වෙළඳපලට නිකුත් කිරීම		b.වෙළඳපලට නිකුත් කල ගඩොල් ප්‍රමාණය		50 %		
	4.නැහෙනහිර පළාතේ තර්ජනයට ලක් වූ පූජා භූමි ආරක්ෂා කිරීම.	vi.නැහෙනහිර පළාතේ තර්ජනයට ලක් වූ ප්‍රමුඛ පූජාස්ථාන පිළිසකර කිරීම හා රැක ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම.	**a.**හඳුනාගත් ප්‍රමුඛස්ථාන සංඛ්‍යාව		50 %		නැහෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය
			b. ආරක්ෂා කල / ප්‍රතිස්ංස්කරණය කළ පූජා භූමි සංඛ්‍යාව		50 %		
කිරසර සංවර්ධන අරමුණු 13 - දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාක්මක වීම.							
13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත්	1. රට තුළ ඇතිවන විවිධ ආපදා (ගං වතුර, නායයෑම්, සුනාමි වැනි) අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම ක්ෂණික ප්‍රතිචාර මුදවා ගැනීමේ සහ සහන සැලසිමේ ඒකකයක් ස්ථාපිත කිරීම. ත්‍රිවිධ හමුදාව හා සිවිල් පුද්ගලයින් පුහුණු කිරීම සඳහා ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බළසෙණ	i. ව්‍යසන අවස්ථාවලදි විපතට පත් ජනතාව බේරා ගැනීම්, ආරක්ෂිත ස්ථානයක් කරා රැගෙන යාම,කෑම පාර්සල් බෙදා දීම්,ලිං පිරිසිදු කිරීම් වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීම්	a.පුහුණු කරන ලද ත්‍රිවිධ හමුදා හා සිවිල් පුද්ගලයින් සංඛ්‍යාව නාවික හමුදාව විසින් 233 යි යුද හමුදා වෙතින් අපදා කළමණාකරන පාඨමාලා 05 ක් පවත්වා ඇත. පුද්ගලයින් සංඛ්‍යාව - 11X1497			80%	ශ්‍රී ලංකා නාවික හමුදාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
			b.බේරා ගත් පුද්ගල සංඛ්‍යාව - නාවික හමුදාව විසින් -2814 යුද්ධ හමුදාව විසින් -2116			75%	
			c.පිරිසිදු කරන ලද ලිං සංඛ්‍යාව - නාවික හමුදාව විසින් -380		65 %		

කිරීම	මූලස්ථානයෙහි පුහුණු පාසලක් ස්ථාපිත කිරීම		යුද්ධ හමුදාව විසින් - 29				
			d.ආහාර ද්‍රව්‍ය බෙදා දුන් පවුල් සංඛ්‍යාව නාවික හමුදාව විසින්- 8687 යුද්ධ හමුදාව විසින්-6478			80 %	
		ii. ඒ සඳහා 2030 වර්ෂය වන විට 2500 ක සිවිල් ආරක්ෂක හට පිරිසකට විධිමත් පුහුණු ලබා දීම සහ ඊට අදාල උපකරණ යනාදියෙන් සන්නද්ධ කිරීම.	e.පුහුණු කරන සිවිල් ආරක්ෂක හට හා සිවිල් පුද්ගලයින් සංඛ්‍යාව		60 %		සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
තිරසර සංවර්ධන අරමුණු 14- සාගර, මුහුදු හා සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය උදෙසා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතා කිරීම.							
14.1 2025 වන විට සියලු වර්ගවල සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීමද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම පදනම් ක්‍රියාකාරකම් මඟින් සිදුවන සියලු ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම	1. ඵලදායී හා කාර්යක්ෂම ප්‍රතිචාරයක් සහ සමුද්‍ර දූෂණය පාලනය කිරීම සඳහා පාලන යාත්‍රා දෙකක් ලබා ගැනීම ඇතුළු හැකියාවන් සහ ධාරිතාව වැඩි දියුණු කිරීම.	i. දිරාපත් නොවන සන අපද්‍රව්‍ය මුහුදේ දී භාවිතයෙන් පසු නැවත වෙරළට පැමිණීම අවම කිරීම.	a.මෙම කටයුත්ත සඳහා නිරත වන හටයින් සංඛ්‍යාව (12923). වෙරළ පිරිසිදු කිරීම් සඳහා සහභාගීවූ හට පිරිස (13603)			90%	
			b.මෙම කාර්යය සඳහා යොදාගන්නා යාත්‍රා සංඛ්‍යාව			50 %	
			C. සිදුකළ ස්ථානීය පරීක්ෂා සංඛ්‍යාව 36 සිදුකළ ස්ථානීය වෙරළ පිරිසිදු කිරීම් සංඛ්‍යාව 907			90%	ශ්‍රී ලංකා නාවික හමුදාව
	2. දේශීය ධීවර යාත්‍රා විසින් දිරාපත් නොවන සණ අපද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම සඳහා අධීක්ෂණය නියාමන යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.		d. එසේ එකතු කරන ලද සන අපද්‍රව්‍ය ප්‍රමාණය (වාර්ෂිකව) 553500 KG වෙරළ පිරිසිදු කිරීමේදී එකතු කල සණ අපද්‍රව්‍ය ප්‍රමාණය 1889.6KG ප්ලාස්ටික් බෝතල් 5912			90%	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව
			e.මෙම කාර්යය සඳහා යොදාගන්නා යාත්‍රා සංඛ්‍යාව සහ අලුතින් යෙදවූ යාත්‍රා			70 %	

	3. වෙළඳ නැව් මඟින් සිදුකර සිදුකරන මහා පරිමාණ තෙල් කාන්දුවීම් වලින් හානිය අවම කිරීම.		f. එවැනි මහා පරිමාණ කාන්දුවීම් වාර්තා වූ අවස්ථා ගණන 01		70 %		
14.4 2022 වන විට මසුන්ගේ ජීව විද්‍යාත්මක ගති ලක්ෂණ අනුව තීරණය වී ඇති ආකාරයට තිරසාර වශයෙන් උපරිම අස්වැන්නක් ලබා දිය හැකි ආකාරයට මත්ස්‍ය සම්පත් හැකි කෙටිම කාලයකදී නැවත යථා තත්වයට පත් කිරීම සඳහා කාර්යක්ෂම ලෙස මසුන් ඇල්ලීම පාලනය කිරීම සහ අසීමිතව , නීති විරෝධී, වාර්තා නොකළ සහ පාලනය නොකළ හා හානිකර මසුන් මැරීමේ ක්‍රම	1. පවතින නැව් යාත්‍රා ඵලදායී ලෙස යෙදවීම සහ නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම අධීක්ෂණය කිරීම සඳහා EEZ ක්‍රියාත්මක විය හැකි නව අක්වෙරළ මුර සංචාර යාත්‍රා දෙකක් ලබා ගැනීම	i. වසරකට නීතිවිරෝධී වාර්තා නොකල මසුන් ඇල්ලීම සිදුවීම් අවම කිරීම.	a. අත් අඩංගුවට පත් සංඛ්‍යාව. 1534		70 %		ශ්‍රී ලංකා නාවික හමුදාව
		ii. වසරකට වාර්තා කරන විනාශකාරී ක්‍රම යොදා මසුන් ඇල්ලීම අවම කිරීම.	b.විමර්ෂණය කරන ලද බහුදින යාත්‍රා සංඛ්‍යාව 270		70 %		
		iii. ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන පවත්වා ගැනීම.	c.ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව 24		60 %		
		iv. ගැඹුරු මුහුදු ආවේක්ෂණය කිරීම.	d.ආවේක්ෂණ යාත්‍රා සංඛ්‍යාව- 07			75%	
	නීතිවිරෝධී වාර්තා නොකල මසුන් ඇල්ලීමට අදාළව පනවා ඇති නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල වීම සඳහා දේශීය ධීවර යාත්‍රාවලට වරායන් ඇතුළු වීම සහ පිටවීම පිළිබඳ නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම.	v.වසරකට වාර්තා කරන විනාශකාරී ක්‍රම යොදා මසුන් ඇල්ලීම අවම කිරීම.	e.අත් අඩංගුවට පත් යාත්‍රා/ පුද්ගලයින් සංඛ්‍යාව යාත්‍රා: ඩිංගි - 426 ට්‍රෝලර්,වල්ලම්, ඩව් - 40 තෙප්පම් - 03 ධීවරයින් -1534			80%	ශ්‍රී ලංකා නාවික හමුදාව වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව
	ශ්‍රී ලංකාවේ මුහුදු තීරයේ දේශීය හා විදේශීය නැව් හෝ යාත්‍රා මඟින් නීතිය උල්ලංඝනය කිරීම	vi.නාවික හමුදාවේ සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාවට අයත් සාගර	f. යොදවා ඇති නාවික හමුදා යාත්‍රා සංඛ්‍යාව. ගැඹුරු මුහුදු නිරීක්ෂණ යාත්‍රා - 07 වේග මිසයිල ප්‍රහාරක යාත්‍රා -			80%	ශ්‍රී ලංකා නාවික හමුදාව

භාවිතය අවසන් කිරීම සහ විද්‍යාත්මක පදනමකින් යුක්ත කළමනාකරණ සැළසුම් ක්‍රියාත්මක කිරීම	අධීක්ෂණය කිරීම සඳහා පවතින සම්පත් ප්‍රශස්ත හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් නිරීක්ෂණ හැකියාවන් වර්ධනය කිරීම.	කලාපයේ සමුද්‍රීය බලය තහවුරු කිරීම.	02 වේග ප්‍රහාරක මුර යාත්‍රා - 09 වෙරළ ආරක්ෂක මුර යාත්‍රා - 02 වේග ප්‍රහාරක යාත්‍රා - 47 වෙරළ ආරක්ෂක යාත්‍රා - 107				
			g. අත් අඩංගුවට පත් යාත්‍රා/පුද්ගලයින් සංඛ්‍යාව යාත්‍රා - 19 ධීවරයින් - 157			80%	
			h. ගැඹුරු මුහුදු ආවේක්ෂණයෙහි යොදන යාත්‍රා ගණන 07			80%	
14.7 2030 වන විට කිරසර ලෙස ධීවර සම්පත්, ජලය ආශ්‍රිත සංස්කෘතිය සහ සංචාරක කර්මාන්තය කළමනාකරණය හා කිරසර අන්දමින් සමුද්‍රීය සම්පත් භාවිතා කරමින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට	1.සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම, කෘතීම කොරල්පර නිර්මාණය කිරීම සහ ගාල්ලේ සාගර ජීවීන් වැඩි කිරීම සඳහා දියයට කෞතුකාගාරයක් ඉදිකිරීම	i.දිය යට කෞතුකාගාර ස්ථාපිත කිරීම.	a. දිය යට ස්ථාපනය කරන ලද කෞතුකාගාර 1. නිල්වැල්ල-රු. 2,080,300.00 2. ගාල්ල-රු 234,320.00 3.ත්‍රිකුණාමලය- රු. 600,000.00			80%	ශ්‍රී ලංකා නාවික හමුදාව
			b.නැරඹූ සංචාරකයන් සංඛ්‍යාව 235			80%	
